

වාර්ෂික වාර්තාව

2015

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපැල්

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002

පටුන

1		හැඳින්වීම	1
	1.1	ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව	1
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා	2
2		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්	3
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	3
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	3
	2.3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය	4
	2.4	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම	4
	2.4.1	කාර්යය මණ්ඩලය බඳවා ගැනීම	4
	2.4.2	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	6
	2.5	අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශය	7
	2.5.1	ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2015	7
	i	සමස්ත බලපෑම - 2015	7
	ii	බලපෑම කාලික වශයෙන් පැතිරීම - 2015	8
	iii	බලපෑම් අවකාශමය ලෙස බෙදීයාම - 2015	9
	iv	මරණ සහ අතුරුදහන් වූ පුද්ගලයන් - 2015	10
	v	පීඩාවට පත්වූ ජන සංඛ්‍යාව - 2015	10
	vi	විනාශ වූ / හානියට පත්වූ නිවාස - 2015	11
	vii	ආපදාවල බලපෑමේ සාරාංශය - 2015	11
3		ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්	11
	3.1	ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම	11
	3.2	ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම	12
	3.3	ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම (IDMP)	12
	3.4	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව	12
	3.5	විගණන සහ කළමනාකරණ කමිටුව	12
	3.6	ජාතික සුරක්ෂිත දිනය - 2015	13
	3.7	ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව	13
	3.8	හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව	14
	3.9	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය (www.dmc.gov.lk)	14
	3.10	ඩෙස්ඉන්වෙන්ටර් දත්ත පදනම (www.desinventor.lk)	14
4		ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය	15
	4.1	හැඳින්වීම	15
	4.2	දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම	15

4.3		පානදුර ගංවතුර පාලනය	19
4.4		දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීම	19
4.5		යාපනය ගංවතුර ආපදා අවම කිරීම	20
4.6		ආපදා අවදානම අවම කිරීමේ සංවර්ධනයන් ප්‍රධාන ප්‍රවාහය තුළට අනුගත කිරීම	20
5		පෙර සූදානම් හා සැලසුම් අංශය	21
5.1		හැඳින්වීම	21
5.2		දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලැසුම් නිර්මාණය කිරීම	23
5.3		ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම	25
5.4		ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ පෙරහුරු වැඩසටහන්	25
5.5		විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යවස සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු	27
5.6		රටතුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම	27
5.7		මෝසම් පෙර සූදානම් සැලසුම්	28
5.8		රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	28
5.9		පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්	28
5.10		2015 වර්ෂයේදී සිදුකරන ලද අනෙකුත් පෙර සූදානම් ක්‍රියාකාරකම්	29
	5.10.1	බදුල්ල දිස්ත්‍රික් ආපදා අවදානම් සිතියම් හා පස් අවුරුදු උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම	29
	5.10.2	ප්‍රජාමූල ආපදා අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය සකස් කිරීම	29
	5.10.3	පෙරහුරු වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම **(Simulation Guideline)**	29
6		පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	30
6.1		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්	30
6.2		ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්	31
	6.2.1	ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	32
	6.2.2	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම	32
	6.2.3	පාසල් ගුරුවරුන් හා සිසුන් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන්	32
	6.2.4	සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු වැඩසටහන්	33
	6.2.5	ත්‍රිවිද හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්	33
	6.2.6	පාසල් තරුණ ස්වේච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීමේ වැඩසටහන්	33
	6.2.7	ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණය සඳහා වූ පුහුණු වැඩසටහන්	34
	6.2.8	ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්	34
	6.2.9	ග්‍රාමීය ආපදා කළමනාකරණ කමිටු යාවත්කාලීන කිරීමේ වැඩසටහන්	35
	6.2.10	ජංගම ප්‍රදර්ශන රථය යොදාගෙන සිදුකරනු ලබන වැඩසටහන්	35
7		හදිසි මෙහෙයුම් අංශය	35
7.1		ගංවතුර ආපදාවලදී ගත් ක්‍රියාමාර්ග	36

7.2	දැඩි සුළං ආපදාවලදී ගත් ක්‍රියාමාර්ග	36
7.3	ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය හදිසි අවස්ථා උපකරණ මිලට ගැනීම	36
7.4	ගිනි උවදුරු ආපදාවලදී ගත් ක්‍රියාමාර්ග	37
7.5	නියඟයෙන් පීඩාවට පත්වූ ජනතාව වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග	37
7.6	පූර්ව දැනුම්දීම්	38
7.7	අන්තර් රාජ්‍ය ජාලය **(Inter Government Network)**	38
7.8	සුනාමි අවස්ථාවලදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ වූ ජාතික පෙරහුරු වැඩසටහන්	38
7.9	ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය	39
7.10	ඇමතුම් මධ්‍යස්ථානය	39
7.11	ඩෙංගු මර්දන වැඩසටහන	39
7.12	ශ්‍රී ලංකා යුද්ධ හමුදා හදිසි ආපදා සහන බළඇණි සඳහා “සෙවීම් හා මුදවා ගැනීම්” පිළිබඳ පස්දින මූලික පාඨමාලාව	40
7.13	ශ්‍රී ලාංකීය නගර සඳහා ආපදා ප්‍රත්‍යස්ථ නගර සංවර්ධන කිරීම හා උපායමාර්ගික පෙර දැනුම්දීමේ සක්‍රියතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 02	40
7.14	2015 වර්ෂය තුළදී කරන ලද ආපදා කළමනාකරණයට අදාළ අනෙකුත් කාර්යයන්	41
7.15	අභියෝග	41
8	2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය	42
9	2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	79
10	2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස්	93

වාර්ෂික වාර්තාව - **2015**

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාවේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමේ සහ ක්‍රමෝපායික මහපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සහ ඒ සඳහා මහපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වනුයේ ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනෙකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් පවරා ඇති පරිදි ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අගමැතිතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරුන් පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවේ 10 වන සභාවාරය 2015 මැයි 11 දින රැස්වූ අතර එහිදී පහත කරුණු පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- පළාත් මට්ටමින් පාසල් ස්වේච්ඡා ශිෂ්‍යාභට කණ්ඩායම් පිහිටු වීම.
- යාපනයේ වලිකාමම් චුන්නාක්කම් ප්‍රදේශයේ භූගත ජල දූෂණය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- 2012, 2013 වර්ෂවල වාර්ෂික වාර්තා හා ගිණුම් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම.
- 2014 හා 2015 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම.

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළං
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- මුහුදු උවදුරු
- ගිනි
- වසංගතයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගලය
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් සහ අධ්‍යක්ෂවරුන්ගේ නායකත්වය සහිත අංශ පහක් සහිතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. එම අංශ පහ වන්නේ, ආපදා අවම කිරීම් හා පර්යේෂණ, පෙර සූදානම් හා සැලසුම්, පුහුණු හා දැනුවත් කිරීම්, මානව සම්පත් සහ මූල්‍ය වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකාරක කමිටු දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇත. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකවරුන්ගේ සහාය සහිතව සහකාර අධ්‍යක්ෂවරු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකාරක කමිටු භාරව කටයුතු කරති.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

දැක්ම

ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම.

මෙහෙවර

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිසා මුල්වන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව අතුරින් පොදුවේ පවුල් ඒකක තුළ සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

අභිමතාර්ථ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයක් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.
- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානමක් ඇති කර ගැනීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෝදිසි සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අඩු කිරීම සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ගත කිරීම.

- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- නිසි කලට තම වගකීම් ඉටු කරනා බවට වගබලා ගැනීම සඳහා ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, රජයේ බලධාරීන්, ආයතන, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය.

2.1 සටහනෙහි දක්වා ඇති පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1:ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධාන ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්.

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීම් පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කර ඇති අතර වසර අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික්ක මට්ටමේ තිබූ පුරප්පාඩුවලින් 30%ක් පමණ පුරවා ඇත. ඇතැම් තනතුරුවලට අදාළව ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් මූලික සුදුසුකම් සම්බන්ධව ඇති ගැටලුකාරී තත්වයන් හේතුකොටගෙන තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. ඉහත ගැටලු රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇත. පහත 2.1 වගුවෙන් 2015 වසරේ පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් 2.2 වගුවෙන් අනුමත කරන ලද සම්පූර්ණ සේවක සංඛ්‍යාවත්, පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් 2015-12-31 වන විට තිබූ පුරප්පාඩු සංඛ්‍යාවත් දක්වා ඇත.

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ (මානව සම්පත් හා මූල්‍ය)	01
පරිපාලන නිලධාරී	01
ආපදා කළමනාකරණ සහකාර	05
කළමනාකරණ සහකාර	03
රියදුරු	01
කාර්යාල සහායක	01

වගුව 2.1: 2015 වසර තුළදී පූරවන ලද පූරප්පාඩු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	හිඟ සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	5	3	2
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	9	0	9
සහකාර අධ්‍යක්ෂ	15	13	2
සහකාර අධ්‍යක්ෂ(දිස්ත්‍රික්)	25	19	6
ගිණුම් නිලධාරී	1	0	1
පරිපාලන නිලධාරී	1	1	0
පුස්තකාලයාධිපති	1	0	1
පුද්ගලික සහකාර	1	0	1
සංවර්ධන සහකාර	1	1	0
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	2	0	2
චලන හා නිශ්චල කැමරා ශිල්පී	1	0	1
සන්නිවේදන කාර්මික ශිල්පී	3	0	3
ගුවන් විදුලි ක්‍රියාකරු	1	0	1
කළමනාකරණ සහකාර	46	46	0
ආපදා කළමනාකරණ සහකාර	100	98	2
රියදුරු	39	35	4
කාර්යාල සහායක	10	7	3
එකතුව	**266**	**226**	**40**

වගුව **2.2:** 2015-12-31 වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික් විසිපහ පුරාම පිහිටුවා ඇත. සෑම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයක්ම සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරයෙක්ගෙන් සමන්විත වේ. යම්කිසි දිස්ත්‍රික්කයක් ආපදාවට ලක්වීමට ඇති හැකියාවේ අඩු වැඩිකම මත දිස්ත්‍රික් ආපදා කළමනාකාරවරු සංඛ්‍යාව දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ. සහකාර අධ්‍යක්ෂවරු (දිස්ත්‍රික්) විසිපස් දෙනෙකුගෙන් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකාර සහකාරවරු අනූ අට දෙනෙකු මෙම දිස්ත්‍රික්ක විසි පහ වෙනුවෙන් සිටිති.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට හමුදාවේ සහ ගුවන් හමුදාවේ 132ක් අනුයුක්ත කර ඇත. කළුතර දිස්ත්‍රික්කය හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය පහත 2.2 රූප සටහනෙහි දක්වා ඇත.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.5 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2015

i. සමස්ත බලපෑම- 2015

ගංවතුර, නායයෑම්, දැඩි සුළං සහ අකුණු නිසා බලපෑමට ලක්වූ මුළු ජනගහනය ආසන්න වශයෙන් 535,774 ක් පමණ වේ. 2014 වසර සමඟ සන්සන්දනාත්මකව බැලීමේදී 80% ක අඩුවීමක් දක්නට ලැබේ. මරණයට පත්වූ සහ තුවාල ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 234ක් සහ192ක් වේ. 2014 සමඟ සන්සන්දනය කිරීමේදී හානියට පත්වූ සහ විනාශයට පත්වූ නිවාස සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත.

බලපෑම්	2013	2014	2015	වෙනස (%)
මරණ/ අතුරුදහන් වීම්	126	154	123	-20.13
තුවාල සිදුවීම්	218	80	69	-13.75
විපතට පත් ගණන	495051	2702545	535744	-80.18
පූර්ණ හානි වූ නිවාස ගණන	543	5312	685	-87.10
අර්ධ හානි නිවාස ගණන	10035	19495	6438	-66.98

වගුව 2.3: සමස්ත බලපෑම



සටහන 2.3: මරණ / අතුරුදහන් වීම් සහ තුවාල



සටහන 2.4: පූර්ණ හා අර්ධ හානි වූ නිවාස



සටහන 2.5: ආපදාවට පත් ප්‍රජාව

මාසය	ආපදාව	ප්‍රදේශය
මාර්තු	දැඩි සුළං	ඇහැළියගොඩ
ජූලි/ අගෝස්තු	නියඟය	අම්පාර
සැප්තැම්බර්	ගං වතුර	මාතර
සැප්තැම්බර්	නාය යෑම්	කොත්මලේ
සැප්තැම්බර්	අකුණු සැර	ඉඹ්බාගමුව

වගුව 2.4: එක් එක් මාසවලදී සිදු වූ ආපදාවන් සහ ආපදාවට ලක්වූ ප්‍රදේශ

ii. **බලපෑම කාලික වශයෙන් පැතිරීම** - 2015



2015 නොවැම්බර් මාසය තුළ හානියට පත් වූ හා විනාශ වූ වැඩිම නිවාස ගණන වාර්තා වී ඇත. එය නිවාස 3889කි. එයින් 97% හානියට පත්ව ඇත්තේ ගං වතුර බලපෑම හේතුවෙනි. එම හානියට පත් නිවාස ගණනින් නිවාස 2478 යාපනය දිස්ත්‍රික්කය තුළින් වාර්තා වී ඇත.

සටහන 2.6: නිවාස විනාශ වීම් සහ හානිවීම්



අප්‍රේල් (මරණ 14), සැප්තැම්බර් (මරණ 25) හා නොවැම්බර් (මරණ 23) මාසවල වැඩිම මරණ හා අතුරුදන් වීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එයට හේතුව වී ඇත්තේ අකුණු සැර, දියේ ගිලීම් රසායනික ප්‍රතික්‍රියා සහ සැප්තැම්බර් මස බලපෑ නුවර එළියේ නායයෑම් තත්වය හා කුරුණෑගල අකුණු සැර වැදීම් ආපදාවන්ය.

සටහන 2.7: මරණ / අතුරුදහන් වීම් සහ තුවාල

වැඩිම තුවාල ලැබූවන් සංඛ්‍යාව වාර්තා වී තිබෙන්නේ ජුනි හා සැප්තැම්බර් මාසවල ය. එයට ප්‍රධාන හේතුව ජුනි මස (තුවාල වූ සංඛ්‍යාව-14) කොළඹ දිස්ත්‍රික්කය තුළ වූ විදුලි සැර වැදීමේ තත්වය හා සැප්තැම්බර් මස (තුවාල වූ සංඛ්‍යාව-13) දකුණු පළාත තුළ පැවති ගං වතුර තත්වයයි.

iii. බලපෑම් අවකාශමය ලෙස බෙදී යාම - 2015



බලපෑමට ලක් වූ ජනගහනය 2015

2015 පීඩාවට පත් වූ ජනගහනයෙන් ඉහළම සංඛ්‍යාව වාර්තා වන්නේ යාපනය සහ අම්පාර දිස්ත්‍රික්කවලයි. එයට නොවැම්බර් දෙසැම්බර් මාසවල පැවති ගං වතුර තත්වය හා අගෝස්තු සැප්තැම්බර් මාසවල අම්පාර ප්‍රදේශයේ පැවති නියඟය හේතු වී ඇත.

කිළිනොච්චිය, මඩකලපුව, ත්‍රිකුණාමලය, මුලතිව්, පුත්තලම, ගම්පහ, ගාල්ල දිස්ත්‍රික්ක 2015 වසරේ විවිධ වර්ගයේ ආපදාවලට ලක්වීම නිසා සැලකිය යුතු ජන සංඛ්‍යාවක් පීඩාවට පත්වූ දිස්ත්‍රික්ක ලෙස දැක්විය හැකිය.



විනාශ වූ සහ හානියට ලක් වූ නිවාස 2015

2015 වැඩි වශයෙන් හානියට පත් වූ හා විනාශ වූ නිවාස ගණන වාර්තා වන්නේ යාපනය, කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කවලිනි. එය නොවැම්බර් මස යාපනය දිස්ත්‍රික්කය තුළ වැඩිම අගයක් ලෙස වාර්තා වේ. වව්නියාව, කුරුණෑගල, කෑගල්ල, නුවර එළිය, රත්නපුර, මොනරාගල, සහ මාතර දිස්ත්‍රික්ක තුළ ද සැලකිය යුතු නිවාස හානි සහ විනාශ වීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සැප්තැම්බර්, ඔක්තොම්බර්, සහ නොවැම්බර් මාසවල කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය හා මාතර ප්‍රදේශවල පැවති අධික ගංවතුර තත්වය , දැඩි සුළං සහ නායයෑම් තත්වයයි.

මාසය	විනාශ වූ හා හානියට ලක් වූ නිවාස
සැප්තැම්බර්	556
ඔක්තොම්බර්	241
නොවැම්බර්	4199
දෙසැම්බර්	942

වගුව 2.5: විනාශ වූ නිවාස ප්‍රමාණයන්

iv. මරණ සහ අතුරුදහන් වූ පුද්ගලයන්- 2015



සටහන 2.8: මරණ සහ අතුරුදහන් වීම්

2015 වසරේ අතුරුදහන් වූ සහ මරණයට පත්වූ සංඛ්‍යාව 90ක් වන අතර එයින් 47%ක් පමණ දියේ ගිලීම් නිසා සිදුවී තිබේ. දෙවැනි වැඩිම මරණ සංඛ්‍යාව වාර්තා වී තිබෙන්නේ මරණ 23ක් අකුණු සැර සහ මරණ 16ක් ගංවතුර මගිනි. අනෙකුත් ව්‍යසන සමඟ සලකා බැලීමේදී නායයෑම් නිසා සිදුවන මරණ සාපේක්ෂව අඩු ප්‍රතිශතයක් වේ.

2014 සාපේක්ෂව දියේ ගිලීම් නිසා වූ මරණ සංඛ්‍යාව විශාල වශයෙන් වැඩි වී ඇත.

ආපදාව	2014	2015	වෙනස
නායයෑම	64	9	-55
ගංවතුර	37	16	-21
අකුණු	21	23	2
තද සුලං/ කුණාටු	2	0	-2
දියේ ගිලීම්	21	42	21
එකතුව	**145**	**90**	**-55**

වගුව 2.6: 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ආපදාවලින් සිදු වූ මරණ සහ අතුරුදහන් වීම්වල අඩුවීම

v. පීඩාවට පත්වූ ජන සංඛ්‍යාව - 2015

පීඩාවට පත්වූ ජනගහනයෙන් 51% ක් පමණ නිරිත දිග සහ ඊසාන දිග මෝසම් කාලය තුළ ඇතිවූ ගං වතුර නිසා පීඩාවට පත් වී තිබේ. වැඩිපුරම පීඩාවට පත්වූ ජනගහනය නැගෙනහිර පළාතෙන් වාර්තා වී ඇත. ජනගහනය මත දෙවැනි වැඩිම බලපෑම සිදුවී ඇත්තේ දැඩි නියඟය මගිනි. අනෙකුත් ව්‍යසන නිසා ජනතාවට සිදුවී ඇති හානිය සාපේක්ෂ වශයෙන් නොසලකා හැරිය හැකිය. ගං වතුර, නායයෑම්, නියඟය සහ දැඩි සුළං මගින් ජනතාවට වූ පීඩාව 2014 සාපේක්ෂව විශාල වශයෙන් අඩු වී ඇත. නමුත්, විදුලි සැර හා දියේ ගිලීම් නිසා පීඩාවට පත් වූ ජනගහනය වැඩි වී ඇත.



සටහන 2.9: ආපදාවට පත් ප්‍රතිශතය

ආපදාව	2014	2015	වෙනස
නායයෑම්/ ඉවුරු කඩා වැටීම්	144404	1469	-142935
ගං වතුර	1177570	270840	-906730
නියඟය	1495082	258096	-1236986
අකුණු සැර	76	188	112
දැඩි සුළං	13907	3987	-9920
දියේ ගිලීම්	0	38	38
එකතුව	**2831039**	**534618**	**-2296421**

වගුව 2.7: පීඩාවට පත් ජන සංඛ්‍යාව 2014 වර්ෂයට සාපේක්ෂව

vi. **විනාශ වූ / හානියට පත්වූ නිවාස- 2015**



දැඩි ගං වතුර නිසා නිවාස 431ක් පමණ විනාශ වූ අතර නිවාස 5112කට වැඩි ප්‍රමාණයක් හානියට පත්විය. 2014 සමඟ සන්සන්දනය කිරීමේදී එය සැලකිය යුතු අඩුවීමකි.

සටහන 2.10: නිවාස හානි

ආපදා	2014		2015	
	පූර්ණ හානි වූ නිවාස ගණන	අර්ධ හානි වූ නිවාස ගණන	පූර්ණ හානි වූ නිවාස ගණන	අර්ධ හානි වූ නිවාස ගණන
නායයෑම	77	170	44	207
ගංවතුර /කාන්දු වීම් හා පිටාර ගැලීම	4918	15535	431	5112
අකුණු	0	18	1	31
තද සුලං/ කුණාටු	206	3648	99	925

වගුව 2.8: නිවාස හානි

vii. ආපදාවල බලපෑමේ සාරාංශය- 2015

- 2014 වසර සමඟ සන්සන්දනාත්මකව බැලීමේදී ස්වාභාවික ආපදා නිසා ජනතාවට සිදුවූ බලපෑම සහ මරණ සංඛ්‍යාව නිවාසවලට සිදුවී ඇති හානිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත.
- 2015 වසර තුළ වැඩි වශයෙන් පීඩාවට පත්වූ ජනතාව සිටින දිස්ත්‍රික්ක ලෙස යාපනය සහ අම්පාර දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- ජනතාවට සැලකිය යුතු බලපෑමක් ඇතිවූ අනෙකුත් දිස්ත්‍රික්ක ලෙස කිළිනොච්චිය, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- 2015 උතුරු පළාතේ ඇතිවූ ගං වතුර නිසා පීඩාවට පත්වූ සංඛ්‍යාව ඉහළම සංඛ්‍යාව ලෙස හැඳින්විය හැකිය. එය 155,671කි.
- දියේ ගිලීම නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 2014ට සාපේක්ෂව ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම.

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන්කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.අ.මෙ.සැ.)

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මගින් පෙන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ඇතිව ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදී. ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් සහ අදාළ පාර්ශවකරුවන් අතර හදිසි අවස්ථා ප්‍රතිචාර යාන්ත්‍රණයන් සහ සම්බන්ධීකරණ කටයුතු අවධාරණය කරමින් ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම මගින් ප්‍රථම වතාවට විස්තීර්ණ පද්ධතියක් ස්ථාපනය කර ඇත.

පාර්ශවකාර ආයතන මගින් ලබාදෙන ලද එම ආයතනයන්හි සම්මත ක්‍රියාකාරකම් හා ක්‍රමවේදයන් වෙබ් අඩවියට (www.dmc.gov.lk/neop) ඇතුළත් කර ඇත. මෙම ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම මේ වන විට නිම කර ඇත.

3.3 ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම (IDMP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආයතනික පෙර සූදානම් සැලැස්ම සකස් කිරීමේ මාර්ගෝපදේශ සකස්කර ඇත. එම මාර්ගෝපදේශය ආයතන සඳහා ක්‍රියාවට නැංවීමෙන් පසුව මතුවන ගැටලු හා දුර්වලතා හැඳින ගැනීමටත් ඒ අනුව මාර්ගෝපදේශය ප්‍රතිශෝධනය කිරීමටත් සැලසුම්කර ඇත.

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණමය කටයුතු සම්බන්ධව තීරණ ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2014 වර්ෂය තුළදී රැස්වීම්වාර 10ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1) ලේකම් , ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති
2) මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - නියෝජිත-සාමාජික
3) ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය - නියෝජිත - සාමාජික
4) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - නියෝජිත- සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව

2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය - සභාපති
2. අතිරේක ලේකම් (පරිපාලන), රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය - සාමාජික

3. ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සමාජික
4. විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව - සාමාජික
5. අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික
6. අධ්‍යක්ෂ, දැනුවත්කිරීම් අංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික
7. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික
8. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) , ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කරන විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව කරුණු මෙහිදී සාකච්ඡාවට භාජනය කරයි. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලයි. පසුව මෙම කරුණු පිළිබඳව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් මධ්‍යස්ථානයේ පැවැත්වෙන කාර්ය මණ්ඩල රැස්වීම්වලිදී මෙම කරුණුවලට අදාළ ප්‍රගතිය පිළිබඳව නැවත සාකච්ඡාවට බඳුන් කරයි. 2014 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකකුත් 2015 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකකුත් පවත්වා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මගපෙන්වීම් කර ඇත.

3.6 ජාතික සුරක්ෂිත දිනය - 2015

ජාතික ආරක්ෂණ දිනය සංවිධානය කිරීමේ අරමුණ වන්නේ ආපදා නිසා තම ජීවිත හානි වූ සියලු දෙනා සිහි කිරීමටත් විශේෂයෙන්ම පාසල් දරුවන් සහ පොදු ජනතාව අතර ආරක්ෂාව සහ ආපදා අවදානම් පිළිබඳ දැනුවත්භාවය සහිත ආරක්ෂිත සංස්කෘතියක් නිර්මාණය කිරීමයි.

2015 ජාතික සුරක්ෂිත දින උත්සවය පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව 2015 දෙසැම්බර් මස 26 වන දින පැවැත්වීමට කටයුතු සුදානම් කර තිබුණි. එහෙත් කාලගුණික හා දේශගුණික තත්ත්වය හේතු කොට ගෙන මෙම උත්සවය පැවැත්වීමට නොහැකි විය. එහෙත් දිස්ත්‍රික් මට්ටමින් සියලුම දිස්ත්‍රික්කවල විවිධ වැඩසටහන් ජාතික සුරක්ෂිත දිනය තේමා කරගෙන ක්‍රියාත්මක කරන ලදී. ආපදාවන් නිසා ජීවිත අහිමි වූ ජනතාවගේ ජීවිත සිහි කිරීම, ආරක්ෂිත සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ විශේෂයෙන්ම පාසල් ළමුන් ඇතුළත්ව මහ ජනතාව අතර ආපදා අවදානම පිළිබඳව දැනුවත් කිරීම ආරක්ෂිත දින උත්සවයේ ප්‍රධාන අරමුණු විය. පාසල් ළමුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ රචනා හා චිත්‍ර තරඟයක් ද පවත්වන ලදී.

3.7 ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව (NDMCC) පිහිටුවා ඇත. මෙම කමිටුවේ සභාපතිත්වය ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් උසුලන අතර අමාත්‍යාංශ නියෝජිතයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, ත්‍රිවිධ හමුදා , පොලිස් බලකාය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම දේශීය රාජ්‍ය නොවන

සංවිධාන සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින් ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම් පවත්වනු ලබයි. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (NDMCC)යේ පරමාර්ථය වන්නේ ආපදාවන්ගේ බලපෑම් අඩුකිරීම සහ ආපදා ප්‍රත්‍යාස්ථ සමාජයක් සඳහා ජාතික උත්සාහයක් ගැනීමටයි. එමෙන්ම,

- තොරතුරු බෙදාහැරීම සහ හුවමාරු කරගැනීම සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී ආයතනයක් ඇතිකිරීම.
- ආපදා අවදානම් අඩු කිරීමේ ක්‍රමවේද සහ උපාය මාර්ග පිළිබඳ උගත් පාඩම් සම්බන්ධ පහසුකම් සැපයීම.
- ආපදා අවදානම් කළමනාකරණ කටයුතු සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සියලුම ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාකරුවන් අතර සම්බන්ධීකරණයක් තබා ගැනීම.

2007 වර්ෂයේ ආයතන 6ක් නියෝජනය කරමින් සමාජිකයන් 14 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද මෙම කමිටුවට වර්තමානය වන විට ආයතන 80ක නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

3.8 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

අත්‍යවශ්‍ය සේවාවන්වල ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දක්වන පාර්ශව කණ්ඩායම් ආපදා අවස්ථාවකදී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී සම්පත් යෙදවිය හැකි හා හදිසි ප්‍රතිචාර කටයුතු කිරීම සෘජුවම සම්බන්ධ පාර්ශවකාර ආයතනවලින් හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව සමන්විත වේ. 2015 වර්ෂය තුළ ජාතික මට්ටමින් හා ජාත්‍යන්තර මට්ටමින් සිදුවූ විශාල ආපදා අවස්ථා දෙකකදී අදාළ සහය හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව මගින් ලබා දීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව 2014 අග භාගයේ දී මීරියබැද්ද ප්‍රදේශයේදී සිදුවූ විශාල නායයෑමට අදාළ සහයෝගය ලබා දීමට අවශ්‍ය කටයුතු 2015 වර්ෂයේ ද ඉටු කරන ලද අතර 2015-04-25 වන දින නේපාලයේ සිදුවූ දරුණු භූමිකම්පාව සිදුවීමෙන් පසු හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ කමිටුවට අදාළ නිලධාරින් ආපදා කළමනාකරණ හදිසි මෙහෙයුම් මැදිරියට පැමිණ විපතට පත් ප්‍රදේශවල සිටින ශ්‍රී ලාංකිකයන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම හා විපතට පත්වූවන්ට සහනාධාර ලබාදීමේ කටයුතු දින ගණනාවක් පුරාවට ඉටු කරන ලදි.

3.9 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය www.dmc.gov.lk යථාවත් කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ කාර්යභාරය වන අතර 2015 වසරේදී ආයතනයේ සිදුවූ ප්‍රධානම සිදුවීම් සියල්ල වෙබ් අඩවියට යොමුකොට ඇති අතර සියලු ආපදාවන්ට සම්බන්ධ තත්ත්ව වාර්තා දෛනිකව වෙබ් අඩවිය වෙත යොමු කරනු ලැබේ. මීට අමතරව www.drr.dmc.gov.lkයන අන්තර්ජාල සම්බන්ධතාව යටතේ ව්‍යාපෘති පිළිබඳ සියලු තොරතුරු අන්තර්ජාලය වෙත ලබා දී ඇති අතර මෙම වසර තුළ පුවත් 8 ප්‍රමාණයක් නිල වෙබ් අඩවියට ඇතුළත් කොට ඇත.

3.10 Desinventor දත්ත ගබඩාව

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventor.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා ආපදාවන් යටතේ කාලවකවානුවට අනුරූපීව මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි

මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ත්ව වාර්තාවලින් මෙන්ම වන රක්ෂණ, සෞඛ්‍ය වැනි අංශවලින් ලබාගන්නා තොරතුරු ද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. 1974 – 2015 දක්වා ආපදා සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් කොට ඇත. 2012, 2013, 2014, 2015 වසරවලදී සිද්ධීන් හා දත්ත ප්‍රමාණයන් පහත වගුවේ ඇතුළත් කොට ඇත.

වසර	සිද්ධීන්	දත්ත ප්‍රමාණය
2012	16	512
2013	16	456
2014	13	456
2015	19	727

වගුව 3.1: Desinventor දත්ත

4. අවම කිරීම, පර්යේෂණ සහ සංවර්ධන අංශය

4.1 හැඳින්වීම

2004 වසරේ ඇතිවූ බිහිසුණු සුනාමි ව්‍යසනයෙන් පසු ප්‍රතික්‍රියාක තත්ත්වයෙන් මිදී පූර්ව ආපදා කළමනාකරණයට මුල්තැන දෙමින් ස්ථාපිත කරන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය ආපදා අවදානම් තක්සේරුව, ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම, ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම තුළින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් හා තිරසාර සංවර්ධනයක් යන ඉලක්ක සපුරාගැනීමට ක්‍රියා කිරීම වේ.

4.2 දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම

2014 වසර තුළදි සිදුවූ ආපදාවන්ගේ සංඛ්‍යාත්මකව සිදුවූ හානි පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී වඩාත් වැඩි අවදානමකට ලක්වන්නේ යටිතල පහසුකම් බව ද ජීවිත අහිමි වීම පහළ මට්ටමක පැවතිය ද ආපදා හේතුවෙන් යටිතල පහසුකම්වලට සිදුවන හානිය දිනෙන් දින ඉහළ යන බවද හෙලිවේ. (වගුව 4.1)

ආපදා (සිද්ධීන්)	සිද්ධීන් ගණන (2014)	මරණ	නිවාස හානි	බෝග හානි
ගංවතුර	271	34	20092	-
නියඟය	1	-	-	-
තදසුළං	182	2	3854	-

වගුව 4.1: Desinventor දත්ත

මෙම කරුණු සැලකිල්ලට ගෙන ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සැලකිල්ලට ගැනීමෙන් පසු ආපදා අවම කිරීම් අංශය රු.මිලියන 500ක් 2015 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරයෙන් අනුමත කොට ඇත. (වගුව 4. 2)

වසර	වෙන්කරන ලද මුදල (රු.මිලියන)
2011	114
2012	122
2013	274
2014	500
2015	500

වගුව 4.2: එක් එක් වර්ෂවලදී අවම කිරීම් අංශය වෙත මහා භාණ්ඩාගාරයෙන් අනුමත කරන ලද මුදල්

2015 වසරේ සිදුවූ එක් එක් ආපදා සැලකිල්ලට ගැනීමේදී එම ආපදාවන්ගෙන් සිදුවන හානිවීම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන මෙම අංශය වෙත වෙන්කරන ලද මුදල පහත වගුව (4.3) මඟින් දක්වා ඇති පරිදි ආපදා අවම කිරීම ව්‍යාපෘති සඳහා වෙන්කර ගන්නා ලදි.

ආපදාව	දිස්ත්‍රික්කය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලියන)			
		2012	**2013**	**2014**	**2015**
ගංවතුර	කළුතර	-	3	7	10
	ගාල්ල	1	10	8	4.1
	මාතර	-	1	-	0.5
	හම්බන්තොට	2	96	121	14.5
	පුත්තලම	-	2	17	17.6
	රත්නපුර	30	3	1	2.6
	කුරුණෑගල	-	13	9	41.4
	නුවරඑළිය	-	3	4	1.9
	මාතලේ	-	10	1	12.6
	කිළිනොච්චි	6	1	23	-
	මුලතිව්	-	7	-	-
	කෑගල්ල	-	13	1	-
	අනුරාධපුර	4	-	1	8.3
	කොලඹ	-	-	11	-
	ගම්පහ	-	-	8	60.2
	ත්‍රිකුණාමලය	-	-	17	5
	පොළොන්නරුව	-	-	14	63.3
	බදුල්ල	-	-	10	-
	මඩකලපුව	-	-	4	3.8
	මන්නාරම	11	-	26	-
	මහනුවර	7	-	23	42
	මොනරාගල	-	-	10	-
	වවුනියා	-	-	6	1.4
	යාපනය	14	-	-	-
	අම්පාර	-	-	-	6.4
එකතුව		**75**	**162**	**322**	**296**
නියඟය	හම්බන්තොට	2	25	41	9.3
	පුත්තලම	-	3	3	-
	මහනුවර	-	4	-	-
	මොනරාගල	-	2	9	4.4
	වවුනියා	19	7	10	4
	කුරුණෑගල	-	-	4	97.6
	ත්‍රිකුණාමලය	-	-	1	2
	පොළොන්නරුව	-	-	7	-
	අම්පාර	-	-	5	-
	මුලතිව්	-	6	-	6
	කිළිනොච්චි	3	-	-	4.7
	අනුරාධපුර	-	-	-	4.2
	බදුල්ල	-	-	-	0.9
	යාපනය	-	-	-	30
	මාතලේ	-	-	-	7.6
එකතුව		23	**47**	**80**	**171**
සත්ව පහරදීම්	මාතර	-	-	6	-
	හම්බන්තොට	-	-	-	0.6
එකතුව		0	**0**	**6**	**0.6**

අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම	මහනුවර	0.8	1	-	-
	බදුල්ල	1	1	6	-
	නුවරඑළිය	93	6	0.2	-
	මාතලේ	-	37	-	-
	කෑගල්ල	-	-	6	-
	රත්නපුර	-	-	2	3.4
	ගාල්ල	-	-	-	1.5
එකතුව		**94.8**	**45**	**14.2**	**4.9**

වගුව 4.3: එක් එක් ආපදාවන්වල දී සිදුවන බලපෑම අනුව අවම කිරීම් අංශය වෙත ලබාදී ඇති ප්‍රතිපාදන

2015 වසරේ දෙසැම්බර් මස 31 දින වන විට මෙම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමස්ත භෞතික ප්‍රගතිය 90% හා මූල්‍ය ප්‍රගතිය 100% වන අතර ව්‍යාපෘති සාර්ථකව නිම කොට ඇත.



ගංවතුර අවම කිරීම - මහනුවර



එළක්කුපුල් අමුණ ප්‍රතිසංස්කරණය - පොළොන්නරුව



නියඟය අවම කිරීම සඳහා නලළිං ඉදිකිරීම - වව්නියා



නායයෑම අවම කිරීම සඳහා කාණු වැඩිදියුණු කිරීම - උඩුනුවර

ආපදා අවම කිරීමේ කෙටිකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 50 පමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබාදී ඇති අතර එම ප්‍රතිපාදන, අන්තරාදායක ලෙස පවතින අස්ථාවර ගල් ඉවත් කිරීම, නිවාසවලට හෝ යටිතල පහසුකම්වලට හානි සිදුවන සේ මාර්ග අවහිර වන සේ පෙරලී ඇති ගල් ඉවත් කිරීම, මාර්ග අවහිර වන සේ ඉදිරි වැටී ඇති ගස් හෝ පස් ඉවත් කිරීම හා ගමනාගමනය අවහිර කරන කුඩා පාලම් ප්‍රතිසංස්කරණය, හදිසි ආපදා අවස්ථාවලදී එම ආපදාවලින් සිදුවිය හැකි හානිය ඉවත් කිරීම සඳහා යන්ත්‍ර කුලියට ගැනීමට හෝ ඉන්ධන වියදම් දැරීම, වැව් අමුණු වේලි හානියට පත්වීමේ අවධානම් අවස්ථාවලදී ඒවා ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම, ආපදාවන්ට ලක්වූවන් ආරක්ෂිත ස්ථානවලට

ප්‍රවාහනය කිරීම, ආපදා බලපෑම් අඩුකිරීම සඳහා අවශ්‍ය උපකරණ (උදලු,කැති ආදිය) මිලදී ගැනීම, ළිං පිරිසිදු කිරීමට වතුර පොම්ප කුලියට ගැනීම, හදිසි ආපදා හේතුකොටගෙන අබලන් වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි හදිසි ආපදා අවම කිරීමේ කටයුතු සඳහා භාවිත කරනු ලැබේ. මේ වන විට රු.මිලියන 50 පමණ ප්‍රතිපාදන මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අතර රු.මිලියන 24 ප්‍රතිපාදන මේ වනවිට වගුව මගින් දක්වා ඇති පරිදි හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආයෝජනය කොට ඇත.

දිස්ත්‍රික්කය	ලබාදී ඇති ප්‍රතිපාදන (රු.)
මොනරාගල	77,100.00
පුත්තලම	2,441,000.00
කොළඹ	650,000.00
හම්බන්තොට	698,853.71
මහනුවර	1,865,037.50
මාතලේ	1,810,325.00
බදුල්ල	789,444.70
කෑගල්ල	1,549,340.43
නුවරඑළිය	2,219,815.91
වව්නියාව	300,000.00
මාතර	245,271.00
ත්‍රිකුණාමලය	1,500,000.00
කළුතර	500,000.00
අනුරාධපුර	1,555,357.50
රත්නපුර	244,909.90
කුරුණෑගල	500,000.00
යාපනය	531,000.00
කිළිනොච්චි	1,052,000.00
ගාල්ල	89,482.00
මන්නාරම	500,000.00
මුලතිව්	500,000.00
ගම්පහ	148,900.00
ගුවන් හමුදාව සඳහා	**4,129,568.21**
එකතුව	**23,897,405.86**

වගුව 4.4: හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන ආයෝජනය කිරීම



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - මාතර



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - කළුතර



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - කෑගල්ල



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - නුවරඑළිය

4.3 පානදුර ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

පානදුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සුළුවැසි තත්ත්වයකදී පවා නාගරික ගංවතුර තත්ත්වයට ගොදුරු වූ අතර මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමුකොට රු.මිලියන 139 වටිනාකමකින් යුත් ව්‍යාපෘතියක් 2012 වසරේ සිට වසර 03 තුළ නිම කිරීම සඳහා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරමින් පවතියි. මෙහිදී මෝඩ ඇල හා කැරපන් ඇල අවහිර වීම ඇල මාර්ගය අනවසර පදිංචිකරුවන් විසින් අවහිර කිරීම, ඇල මාර්ගය නිසිලෙස නඩත්තු නොකිරීම මෙම ගංවතුර තත්ත්වයට හේතුවන බව හඳුනාගන්නා ලදි. ඒ අනුව අනුමත ප්‍රතිපාදන යොදවා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සම්බන්ධීකරණයෙන් පහත්බිම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සැලසුම් පරිදි ඇල මාර්ග සංවර්ධනය කිරීමට කටයුතුකොට ඇත. වසර 03කදී ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 35 පමණ මුදලක් 2015 වසර සඳහා ලැබී ඇති අතර සමස්ත ව්‍යාපෘතියේම සැලසුම් කළ කාර්යන්ගෙන් 90% පමණ මේ වන විට අවසන් කොට ඇත. 2015 වසර සඳහා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 90% පමණ වන අතර 2014 වසරේ නිමකරන ලද කාර්යන් සඳහා ගෙවීම් සිදුකිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා 2015 වසරේ ප්‍රතිපාදන ඒ සඳහා යොදා ගැනීමට සිදුවිය. 2015 වසරේ යෝජිත කාර්යන්ගෙන් 90% පමණ මේ වනවිට අවසන් කොට ඇති අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම, ප්‍රජාවගෙන් පැනනඟින ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ඉලක්කගත ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකිවී ඇත.

4.4 දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

මිරිස්ගෝනිය ඔය හා තම්මැන්නා ඇල අවහිර වීම නිසා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, දඹුල්ල ආරෝග්‍යශාලාව, දඹුල්ල ගම්උදාභූමිය ඇතුළු ආර්ථික හා සමාජීය මධ්‍යස්ථානයන් ගණනාවක් වාර්ෂිකව නාගරික ගංවතුර තත්ත්වයට ගොදුරු විය. මේ පිළිබඳ අවධානය යොමුකොට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාව සැලකිල්ලට ගෙන රු.මිලියන 60ක අවම කිරීමේ ප්‍රතිපාදන ප්‍රමාණයක් අනුමත කළ අතර ව්‍යාපෘතිය 2012 වසරේ සිට වසර 03කදී නිමකිරීමට සැලසුම් කොට ඇත. 2015 වසර සඳහා රු.මිලියන 20ක පමණ ප්‍රතිපාදන වෙන්කොට ඇති අතර 2014 වසරේ නිමකරන ලද කාර්යන් සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම සඳහා 2015 වසරේ ප්‍රතිපාදන ඒ සඳහා යොදා ගැනීමට සිදුවිය. තවද 2015 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ 3 වන අදියර සඳහා ද ප්‍රතිපාදන නිකුත් කර ඇති අතර මෙම ව්‍යාපෘතියෙන් සෘජුව හා වක්‍රාකාරයෙන් දහස් ගණනක් ජනතාව ප්‍රතිලාභ ලබන අතර 2012 වසරේ සිට මේ දක්වා මෙම

ප්‍රදේශය අධික වැසි තත්ත්ව හමුවේදීවත් ගංවතුර තත්ත්වයන්ට ගොදුරු නොවිය. ආපදා හානි සිදුනොවීම, සහනාධාර සඳහා ප්‍රතිපාදන වැය කිරීමට නොවීම, ජනතාවගේ ආර්ථික, සමාජීය, මානසික තත්ත්වයන් නිසි පරිදි පවත්වා ගැනීමට හැකිවීම යන ප්‍රබල කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය රටේ දළ දේශීය නිෂ්පාදනය නැංවීමට මෙන්ම සම්පත් සුරකීමට ද හේතුවී ඇත.

4.5 යාපනය ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

තැනිතලා ප්‍රදේශයක් වන යාපනය දිස්ත්‍රික්කය ජලය බැසයාමේ සීඝ්‍රතාවය ඉතා පහළ මට්ටමක පවතියි. මෙම ප්‍රදේශයේ වැසි ජලය කළමනාකරණය සඳහා තැන තැන ඉදිවූ කුඩා පොකුණු රාශියක් දැකිය හැකි අතර පසුගිය යුධ සමයේ පැවති වාතාවරණය හමුවේ මෙම පොකුණු පද්ධතිය හා වැසි ජලය බැසයාමේ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවූ අතර මේ හේතුවෙන් ගංවතුර ඇතුළු ස්වභාවික ව්‍යසන රැසකට මෙම ප්‍රදේශයේ ජනතාවට මුහුණ පෑමට සිදුවිය. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ආපදා අවම කිරීමේ අංශය මඟින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාවක් රු.මිලියන 120 ප්‍රතිපාදන ප්‍රමාණයක් වසර 03 කාලයක් සඳහා ලබාදීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාදෙන ලදි. ඒ අනුව 2012 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2012, 2013 හා 2014 වසරවල පිළිවෙලින් රු.මිලියන 12, 35 හා 50 බැගින් ලබාදුන් අතර 2014 වසරේ නිමකරන ලද කාර්යයන් සඳහා ගෙවීම් කිරීමට මෙම මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් 2015 වසරේ වෙන්කරන ලද රු.මිලියන 23 ප්‍රමාණයෙන් රු.මිලියන 15 මුදලක් 2014 ගෙවීම සඳහා යොදා ගන්නා ලදි. 2015 වසරේ අපේක්ෂිත ඉලක්කයන්ගෙන් 100% පමණ භෞතික ප්‍රගතියක් ළඟාකර ගෙන ඇති මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 100% වේ. මෙම ව්‍යාපෘතිය මඟින් අතිවිශාල ජනතාවක් ඍජු හා වක්‍රාකාරයෙන් ප්‍රතිලාභ ලැබී ඇත.

4.6 ආපදා අවම කිරීමේ සංවර්ධනයන් ප්‍රධාන ප්‍රවාහය තුළට අනුගත කිරීම

ආපදා තත්ත්වයන් විවිධ විෂය ක්ෂේත්‍ර හා බැඳී පවතින අතර තිරසාර සංවර්ධනයක් සඳහා ආපදා අවම කිරීම අතිශය වැදගත් කරුණකි. මේ පිළිබඳ සැලකිල්ල යොමුකොට නිවාස ඉදිකිරීමේදී ආපදා අවදානම අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම, පළාත් පාලන ආයතනවල තාක්ෂණික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය හා එක්ව අදාළ පාර්ශවකාරී ආයතන හා සහයෝගීතාවයෙන් සිදුකරමින් පවතියි. මෙහිදී පළාත් පාලන ආයතන 300 පමණ නිලධාරීන් 650 ප්‍රමාණයක් ආපදාවන්ට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම පිළිබඳව දැනුවත් කිරීමට ශ්‍රී ලංකා පළාත් පාලන හා පුහුණු ආයතනය සමඟ කටයුතු කොට ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශයන් සැලසීමට ද කටයුතු කොට ඇත. මීට අමතරව එක්සත් ජාතීන්ගේ ජනාවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක සුරක්ෂිත නගර සඳහා සැලසුම් සැකසීමේ ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන සැලසුම් සඳහා මාර්ගෝපදේශයක් සකසා ඇත.

5. පෙර සූදානම් සැලසුම් අංශය

5.1 හැඳින්වීම

ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මෙහි නිර්මාණ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ව්‍යසන කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම හා පිළියෙල කිරීම, 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මගින් නියම කරනු ලැබ ඇති පරිදි ව්‍යසන කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන සඳහා සහායවීම පිළිබඳ වගකීම උසුලනු ලබන පෙරසූදානම් සැලැසුම් අංශය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අංශවලින් එකකි. තවද, ව්‍යසන සඳහා පෙරසූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීමට සහ මුදාගැනීම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන් හට අවශ්‍ය සහාය ලබා දීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. මෝසම් කාලගුණ තත්ත්වය ඇරඹීමට ප්‍රථම පෙර සුදානම් සැලසුම් අංශය විසින් ඕනෑම ව්‍යසන තත්වයකට මුහුණදීම සඳහා ආයතනය සතු සූදානම සහතික කරලීම උදෙසා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව පෙර සූදානම් සැලසුම් අභ්‍යාස ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවලට ප්‍රතිචාර වශයෙන් පෙර සූදානම් වැඩසටහන් සඳහා 2013, 2014 හා 2015 වර්ෂයන්හි පිළිවෙලින් රු. මිලියන 8, 10 හා 12 ලෙස ප්‍රතිපාදන ලබා දුනි. එසේ ලබා දුන් ප්‍රතිපාදන හා වැය වීම පිළිබඳව සන්සන්දනය කිරීම වගු අංක 5.1 හා රූප සටහන් අංක 5.1හි දැක්වේ.

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ ප්‍රතිපාදන	වියදම
2013	8.00	7.89
2014	10.00	9.20
2015	12.00	11.11

5.1 වගුව: ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන හා වැය



සටහන 5.1: ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන හා වැය වීම්

2015 වර්ෂයේදී දිස්ත්‍රික් 25ක ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 12ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මගින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබ ඇත. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය පිළිබඳ 5.2 සටහනෙහි දැක්වේ.



සටහන 5.2: සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් අතර බෙදා දීම

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍යතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2015 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත. තෝරාගත් පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන පැවැත්වීම සඳහා ද මෙම අංශ සහාය ලබා දෙයි. සුනාමි ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙරසූදානම් සැලසුම් නිර්මාණය කිරීම සඳහා ද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ. සමස්ත ප්‍රතිපාදනවලින් විවිධ කටයුතු සඳහා ප්‍රතිපාදන බෙදා දුන් ආකාරය ප්‍රතිශතයක් ලෙස පහත 5.3 සටහනෙහි දැක්වේ.



සටහන 5.3: විවිධ කටයුතු සඳහා බෙදා හරින ලද ප්‍රතිපාදන සමස්ත ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස

5.2 දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් ආපදා පෙරසූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ව්‍යසනයක් සිදුවුවහොත් හෝ ව්‍යසනයක් සිදුවන අවස්ථාවකදී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ යාන්ත්‍රණයක් සංස්ථාපනය කිරීම සඳහා සහාය වන කාර්යසාධන ලේඛනයක් ලෙස දිස්ත්‍රික් ආපදා පෙරසූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයක් තුළ සිදුවන ව්‍යසනයන් සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතනය ලෙස දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව හැඳින්විය හැකිය. මෙම කමිටුවේ, උප කමිටුවල සාමාජිකයන් සහ ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් මෙම සැලසුම තුළ ලැයිස්තුගත කර ඇත. පරිපාලන ප්‍රදේශය, පවතින උවදුරු, අවදානම් තත්වවල ප්‍රතිඵල සහ සිදු කරන ලද අවදානම් තත්ව තක්සේරු කිරීම, ප්‍රධාන ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ආකාරය, ප්‍රදේශය තුළ පවතින භෞතික සහ මානව සම්පත්, ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකාර ආයතනවල වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම් තුළ අන්තර්ගත වේ.

2015 දෙසැම්බර් මාසය වන විට දිස්ත්‍රික් ආපදා පෙරසූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් 25ම සකස් කොට මුද්‍රණය කර ඇත. එමෙන්ම 2015 වර්ෂය සඳහා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය යටතේ ප්‍රාදේශීය ආපදා පෙරසූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් පිළියෙල කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන ලදී. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ඇරඹීම සඳහා සහ ඒවා හඳුන්වාදීම සඳහා මූලික වැඩමුළු 41ක් පවත්වන ලදී. ප්‍රාදේශීය ආපදා පෙරසූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම්වල අවසාන කෙටුම්පත් පාර්ශවකාර ආයතන වෙත පිරිනැමීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ වැඩමුළු පවත්වන ලද අතර ඒවා පිළිබඳ තොරතුරු 5.2 වගුවේ දැක්වේ.

	දිස්ත්‍රික්කය	ආරම්භක වැඩමුළු		අවසාන වැඩමුළු	
		වැඩමුළු සංඛ්‍යාව	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	වැඩමුළු සංඛ්‍යාව	ප්‍රාදේශීය ලේකම් කාර්යාල
1	කළුතර			03	කළුතර, බණ්ඩාරගම, මතුගම
2	ගම්පහ	02	මීරිගම, මීගමුව		
3	ගාල්ල	03	වැලිවිටිය-දිවිතුර, කරන්දෙනිය, නියාගම	01	ගෝනපීනුවල
4	මහනුවර	02	උඩපලාත, මැද දුම්බර		
5	මාතලේ	02	උකුවෙල, මාතලේ	03	මාතලේ, රත්තොට, උකුවෙල
6	රත්නපුරය	06	රත්නපුර දි.ලේ කාර්යාලය -2, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය, නිවිතිගල, අයගම	05	කිරිඇල්ල, බලංගොඩ, වැලිගෙපොළ, ඇලපාත, රත්නපුර
7	කුරුණෑගල	06	වීරඹුගෙදර, මල්ලවපිටිය, බමුණාකොටුව, කුලියාපිටිය-බටහිර, වැරැල්ලගම, ගල්ගමුව	03	මල්ලපිටිය, බමුණාකොටුව, වීරඹුගෙදර
8	අනුරාධපුරය	02	නාච්චාදුව, තලාව		
9	මන්නාරම	03	මන්නාරම, දි.ලේ.කාර්යාලය, සිලාවතුර	02	මඩු, මන්නාරම
10	ත්‍රිකුණාමලය	05	වෙරුගල්, නගර සහ කඩවත්, පදවි ශ්‍රීපුර, මොරවැව, ගෝමරන්කඩවල		
11	මඩකලපුව			02	පෝරතිව්පත්තු, කාත්තන්කුඩි
12	මොනරාගල	03	කතරගම, මැදගම, වැල්ලවාය	02	දි.ලේ.කාර්යාලය-වැල්ලවාය, කතරගම
13	යාපනය	03	ඩෙලිෆ්, කෝපායි, කරවෙඩ්ඩි	03	වේලනායි, කරවෙඩ්ඩි, කරෛයිනගර්
14	වවුනියාව	03	වව්නියාව-දකුණ, වව්නියාව, වව්නියාව-උතුර	02	වව්නියාව, වව්නියාව-උතුර
15	හම්බන්තොට	01	බෙලිඅත්ත	01	බෙලිඅත්ත
	මුළු එකතුව	**41**		**27**	

වගුව 5.2: ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලැසුම්වල අවසන් කෙටුම්පත් පාර්ශවකාර ආයතන වෙත පිරිනැමීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පැවැත්වූ වැඩමුළු සම්බන්ධ තොරතුරු




5.3 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ගම්මානවල පවතින විවිධ උවදුරු සැලකිල්ලට ගනිමින් ප්‍රජා ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සකස් කරන ලදී. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා මට්ටමේ ආපදා සිතියම්ගත කිරීම ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කටයුතු වේ. තවද, ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම් පිළියෙල කිරීම, ආරක්ෂිත මාර්ග හා ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම, ප්‍රථමාධාර, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් සඳහා කඳවුරු ස්ථාපනය කිරීම සහ කඳවුරු කළමනාකරණය කිරීම පිළිබඳව ද ඔවුන්හට පුහුණුව ලබා දෙන ලදී. 2015 වර්ෂය තුළ සියලුම දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් 236ක් සකස් කරන ඇති අතර එහි භෞතික ප්‍රගතිය 100%කි.




යාපනය දිස්ත්‍රික්කයේ පැවති ග්‍රාමීය පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ වැඩසටහනක්

5.4 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ පෙරහුරු වැඩසටහන්

2015 වර්ෂය තුළ සුනාමි, ගංවතුර හා නායයෑම් ආදි ආපදාවන්ට ලක්වීමේ වැඩි නැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්ක තුළ හදිසි අවස්ථාවල ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවත්වූ අතර එහිදී සුනාමි පෙරහුරු වැඩසටහන් 122ක් ද, නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් 92ක් ද, ගංවතුර පෙරහුරු වැඩසටහන් 37ක් ද වන පරිදි වැඩසටහන් 251ක් පවත්වන ලදී.

	දිස්ත්‍රික්කය	සුනාමී පෙරහුරු වැඩසටහන් ගණන	ගංවතුර පෙරහුරු වැඩසටහන් ගණන	නාය යෑම් පෙරහුරු වැඩසටහන් ගණන
1	කොළඹ	8	1	
2	ගම්පහ	6	2	
3	කළුතර	12	2	7
4	මාතර	4	2	5
5	ගාල්ල	9		5
6	හම්බන්තොට	7		
7	රත්නපුර		4	8
8	කෑගල්ල			6
9	බදුල්ල			34
10	මොනරාගල		1	
11	නුවරඑළිය			11
12	මහනුවර			8
13	මාතලේ		3	8
14	පුත්තලම	7		
15	කුරුණෑගල			
16	අනුරාධපුර			
17	පොළොන්නරුව			
18	අම්පාර	13		
19	මඩකළපුව	8	5	
20	ත්‍රිකුණාමලය	9		
21	වව්නියාව		7	
22	මන්නාරම	12	1	
23	කිළිනොච්චි	6	7	
24	යාපනය	11	1	
25	මුලතිව්	10	1	
		122	37	92

5.3 වගුව - දිස්ත්‍රික්කවල පවත්වන ලද පෙරහුරු වැඩසටහන් පිළිබඳ සාරාංශය



සුනාමී පෙරහුරු වැඩසටහනකදී ආබාධිත පුද්ගලයන් රැගෙන යන අයුරු- බදුල්ල දිස්ත්‍රික්කය



සටහන 5.4: 2015 වසරේ දිස්ත්‍රික්ක තුළ පැවැත්වූ පෙරහුරු වැඩසටහන්

5.5 විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළි සුළඟක් හෝ භූ චලනයක් හෝ සිදුවන අවස්ථාවකදී ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත්වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. 2015 වර්ෂය තුළ මේ වන විට වේලි ආශ්‍රිත දැනුවත් කිරීම් හා පෙරහුරු වැඩසටහන් 30ක් පවත්වා ඇත. සෝදිසි හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර කඳවුරු කළමනාකරණය සහ ගම්මානවල ආරක්ෂාව යනාදී කටයුතු අනු කමිටු නිර්මාණය කිරීම පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරණ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන කරා ජනතාව රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මගින් ජලාශ වේලි පාමුල ජීවත්වන අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වැඩසටහනට ඇතුළත් විය.

5.6 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා සිදු වී යයි වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩිවීමේ නැඹුරුතාවයන් පසුගිය වසර කිහිපය තුළ ඇති විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංඥා පුවරු පිහිටුවීම සහ එමඟින් අනතුරුදායක පොකුණු ගංගා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. රත්නපුර, මොනරාගල, මාතර හා අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ කළුගඟ, කතරගම, පොල්හේන හා නුවරවැව, තිසා වැව ආශ්‍රිතව සංඥා පුවරු ස්ථාපිත කරන ලදී. මේ වන විට සංඥා පුවරු 57ක් ස්ථාපිත කර ඇත.





5.7 මෝසම් පෙර සූදානම් සැලසුම්

ඊසාන දිග, නිරිත දිග හා අන්තර් මෝසම් සුළං සමඟ ඇතිවන වර්ෂාව නිසා සිදුවන ආපදා තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා එය බලපාන දිස්ත්‍රික්ක හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල පෙර සූදානම් සැලසුම් සකස් කිරීම කරනු ලබයි.

ජාතික වශයෙන් පෙර සූදානම් වැඩසටහන් 03ක් පවත්වන ලද අතර මෙයින් වැඩසටහන් 02ක් ආපදා කළමනාකරණය සඳහා ස්ථාපිත කරඇති හදිසි මෙහෙයුම් කමිටු රැස්කර හදිසි අස්ථාවකදි ප්‍රතිචාර දැක්වීම සඳහා ඔවුන් දැනුවත් කරන ලදි. ජාතික වශයෙන් පැවැත්වූ අනෙකුත් වැඩසටහන වන්නේ මාධ්‍ය දැනුවත් කිරීම වේ. ඊසාන හා නිරිත දිග මෝසම් සුළං බලපාන දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණය සම්බන්ධ පාර්ශව ආයතන හදිසි අවස්ථාවලදි ප්‍රතිචාර දැක්වීම සඳහා මෙම වැඩසටහන් 19ක් පවත්වන ලදි. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් 69ක් පවත්වන ලදි.

5.8 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදි රෝහල් කරා එන රෝගීන්ට ප්‍රතිකාර ලබා දීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ. මෙම වැඩසටහන තුළදි රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවික ආපදාවලට ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම් ගතකර ඒ අනුව එම ආපදා අවම කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම, දැනුවත් කිරීම හා පෙරහුරු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් සැලැස්මක් වේ. මෙම වැඩසටහන් යටතේ දිස්ත්‍රික් 18ක වැඩසටහන් පවත්වන ලදි.





5.9 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් 25 තුළ මෙම වැඩසටහන් 76ක් 2015 වසරේදී නිම කරන ලදි. මෙම වැඩසටහන් මගින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ එම පාසලේ ආපදා අවදානම් සිතියම් සකස් කිරීම, ආපදා පිළිබඳ දැනුවත් කිරීම සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණ වේ.

5.10 2015 වර්ෂයේදී සිදු කරන ලද අනෙකුත් පෙර සූදානම් ක්‍රියාකාරකම්

5.10.1 බදුල්ල දිස්ත්‍රික් ආපදා අවදානම් සිතියම් හා පස් අවුරුදු උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම.

බදුල්ල දිස්ත්‍රික්කය ආපදා අධික දිස්ත්‍රික්කයක් වන අතර විශේෂයෙන් නායයෑම්, ගංවතුර, කැලෑගිනි හා වන අලි උවදුරු ප්‍රධාන වේ. මෙම ආපදා අතරින් නායයෑම් ආපදා ඉතා අධික දිස්ත්‍රික්කයක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇත. මෙයට බොහෝ දුරට බලපා ඇත්තේ ස්වභාවික හේතූන්ට වඩා මිනිසා විසින් කරන අවිධිමත් ඉඩම් පරිහරන රටාව වේ.

බදුල්ල දිස්ත්‍රික්කයේ තිබෙන ආපදා ප්‍රදේශ හඳුනාගෙන ඒ අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ සියලු ආයතන සම්බන්ධ වේ .මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් අනුග්‍රහය ලබාදෙන අතර මූලික වැඩකටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එය 2016 ජුනි මස වනවිට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

5.10.2 ප්‍රජාමූල ආපදා අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය සකස් කිරීම.

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබීය. විශේෂයෙන් ගංවතුර, නායයෑම්, නියඟය මේ අතරින් ප්‍රධාන තැනක් ගනී. ශ්‍රී ලංකාවේ ප්‍රජාමූල අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ කිහිපයක් රාජ්‍ය නොවන සංවිධාන මගින් සකස් කර ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවති. නමුත් ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාදාමයේදී එම සැලසුම්වලට ආපදා අවදානම් අනුගත නොකිරීම නිසා ආපදා වැඩිවීමක් පෙන්නුම් කරයි. මේ ආදී හේතූන් නිසා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහභාගීත්වයෙන් මෙම මාර්ගෝපදේශයන් සකස් කරන ලදි.

මෙම ප්‍රජාමූල ආපදා අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී කාලගුණ විපර්යාස, පරිසරය, සමාජීය, සංස්කෘතික, ආර්ථික හා භෞතික යන කරුණු සලකා බලා සකස් කරන ලදි. මෙම මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන වන DEPICO ආයතනය මගින් අනුග්‍රහය ලබාදෙන ලදි.

5.10.3 පෙරහුරු වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම. (Simulation Guideline)

2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුග්‍රහය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නායයෑම්, ගංවතුර, සහ සුනාමි වැනි ආපදා සඳහා පෙරහුරු වැඩසටහන් කිරීම සඳහා මාර්ගෝපදේශය සකස් කරන ලදි.

ඒ අනුව තෝරාගත් දිස්ත්‍රික් 06ක එනම් පුත්තලම, පොළොන්නරුව, අම්පාර, මොණරාගල, මාතර, රත්නපුර යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් නිලධාරීන් ආපදා අවස්ථාවලදී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්මට අනුව ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ පෙරහුරු වැඩසටහන් (Table Top Exercise) පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකාවේ ප්‍රජාමූල අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ කිහිපයක් රාජ්‍ය නොවන සංවිධාන මගින් සකස් කර ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවති.

6. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සඳහා වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම රාජ්‍ය, දෙපාර්තමේන්තු, ආයතන, ත්‍රිවිධ හමුදා, පොලිසිය, සිවිල් ආරක්ෂක අංශ, මෙන්ම රාජ්‍ය නොවන පාර්ශවකාර ආයතනවල නියෝජිතයින් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම ප්‍රධාන වගකීම වන්නේය.

මෙම පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සහ ග්‍රාම නිලධාරී මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාතික මට්ටමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

2015 වර්ෂයේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 15ක මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලදී. මෙම මුදල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත නිදහස් කරනු ලැබුයේ 2015 වර්ෂයේ මැයි මාසයෙන් පසුව බැවින් 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කෙසේ වූවද 2015 වර්ෂයේ ජාතික මට්ටමේ වැඩසටහන් මෙන්ම දිස්ත්‍රික් මට්ටම් ආකාරයෙන් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 544ක් ක්‍රියාත්මක කරන ලදී.

6.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩයේ ධාරිතා වර්ධන වැඩසටහන්

පුහුණු හා දැනුවත් කිරීමේ අංශය විසින් ආපදා කළමනාකරණ යාන්ත්‍රණය රට පුරා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා නවීන තාක්ෂණික දැනුමින් මෙන්ම කලාපීය හා ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 2.5ක් මධ්‍යස්ථානය වෙත ලැබුණි. මෙම මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, කාර්යාල කාර්ය සහායකයින් මෙන්ම රියදුරන් 2015 වර්ෂයේ පුහුණු කරන ලදී. මීට අමතරව මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලයේ සමාජිකයින් ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ වැඩමුළු හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.





6.2 ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

පහත සඳහන් වන්නේ 2015 වර්ෂයේ දැනුවත් කිරීමේ අංශය විසින් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඒ සඳහා යොදවන ලද මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විස්තරය පහත සඳහන් වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන් ප්‍රමාණය	වියදම් වූ මුදල්
1	අනුරාධපුර	14	160,000.00
2	අම්පාර	17	279,170.00
3	බදුල්ල	48	705,000.00
4	මඩකලපුව	17	259,381.00
5	කොළඹ	18	241,931.00
6	ගාල්ල	15	223,841.00
7	ගම්පහ	17	185,600.00
8	හම්බන්තොට	18	310,039.50
9	යාපනය	18	323,923.94
10	මහනුවර	45	416,625.00
11	කුරුණෑගල	15	372,060.00
12	කෑගල්ල	18	319,318.00
13	කළුතර	18	250,500.00
14	කිළිනොච්චිය	17	263,518.20
15	මාතර	17	230,482.93
16	මාතලේ	41	619,998.00
17	මන්නාරම	20	287,050.00
18	මුලතිව්	18	144,751.00
19	මොනරාගල	18	283,341.00
20	නුවර එළිය	22	427,780.00
21	පුත්තලම	18	259,272.89
22	පොළොන්නරුව	21	752,556.00
23	රත්නපුර	18	294,095.00
24	ත්‍රිකුණාමලය	17	177,590.50
25	වවුනියා	16	274,469.00
			8,062,293.96
26	ප්‍රධාන කාර්යාලය	23	331,759.51
	මුළු වැඩසටහන් ප්‍රමාණය	544	
	වියදම් කරන ලද මුදල		**8,394,053.47**

වගුව 6.1: දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් හා ඒ සඳහා යොදවන මූල්‍ය ප්‍රතිපාදන

6.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විසින් ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. පාර්ශවකාර නියෝජිත ආයතනවලට හා ත්‍රිවිධ හමුදා පොලිස් නිලධාරින්හට මෙම පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.




6.2.2 රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම

ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනවල සහයෝගය සහ දායකත්වය අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ රට තුළ රාජ්‍ය නිලධාරින් ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහන් 10ක් 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී.




6.2.3 පාසැල් ගුරුවරුන් හා සිසුන් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල සහයෝගය ඇතිව සියලුම දිස්ත්‍රික්වල පාසැල් ගුරුවරුන් සහ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 83ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් ආපදා පෙර සුදානම් මෙන්ම ආපදා අවස්ථාවකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව දැනුම හා කුසලතා වර්ධනය ඇති කරයි. පාසැල් තුළ හා ප්‍රජාව තුළින් මෙම දැනුම යොදා ගනිමින් ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සක්‍රීයව දායකත්වය ලබා ගැනීම අරමුණ වේ.




6.2.4 සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු වැඩසටහන්

ආපදා අවස්ථාවකදී ජනතාව බේරා ගැනීම ප්‍රමුඛ කාර්යක් වන බැවින් සෙවීම් හා ගලවා ගැනීමේ පුහුණු වැඩසටහන් දිවයින පුරා අදාළ අනෙකුත් ආයතනවල සහයෝගය ඇතිව වැඩසටහන් 16 ක් ක්‍රියාත්මක කරන ලදී.




6.2.5 ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ පොලිස් නිලධාරින් සඳහා වූ පුහුණු වැඩසටහන්

2015 වර්ෂයේ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරින්ට මෙන්ම සිවිල් ආරක්ෂක අංශ නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් 23ක් පවත්වා ඇත.




6.2.6 පාසැල් තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ ක්‍රියාවලියට තරුණ තරුණියන්ගේ හා පාසැල් සිසුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා ඔවුන් ස්වෙච්ඡා සේවයන් ලෙස තම පාසැල තුළ මෙන්ම ප්‍රජාව තුළ සක්‍රීයව ක්‍රියාකිරීමට අවශ්‍ය දැනුම කුසලතා හා අවබෝධය ලබාදීම මෙමඟින් සිදුකෙරේ. ඒ අනුව 2015 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් 100ක් ද, තරුණ තරුණියන් 50ක් ද, ස්වෙච්ඡා කණ්ඩායම් ලෙස පුහුණු කරන ලදී.




6.2.7 ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන්

ආපදා අවස්ථාවකදී ආපදාවට ලක්වන ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අරමුණින් ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දිස්ත්‍රික් කාර්යාලය හරහා අදාළ කණ්ඩායම් පුහුණු කිරීම සිදු කෙරිණි. ඒ අනුව 2015 වර්ෂයේ ප්‍රථමාධාර හා කඳවුරු කළමනාකරණ වැඩසටහන් 44ක් ක්‍රියාත්මක කරන ලදී.




6.2.8 ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්

කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා ඇති වන විවිධ බලපෑම්වලින් මුහුදු ධීවර ප්‍රජාවගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා එවැනි ආපදා අවස්ථාවකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳවත්, ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධවත් මුහුදු ප්‍රජාව ජීවත් වන දිස්ත්‍රික්කවල ජනතාව ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2015 වර්ෂයේ මුහුදු ධීවර ප්‍රජාව වෙනුවෙන් වැඩසටහන් 37ක් ක්‍රියාත්මක කරන ලදී.



6.2.9 ග්‍රාමීය ආපදා කළමනාකරණ කමිටු යාවත්කාලීන කිරීමේ වැඩසටහන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා අවදානම් කලාපවල ස්ථාපිත කර ඇති ආපදා කළමනාකරණ ග්‍රාමීය කමිටු යාවත්කාලීන කිරීම වාර්ෂිකව සිදුවේ. ඒ අනුව 2015 වර්ෂයේ ආපදා කළමනාකරණ ග්‍රාමීය කමිටු 156ක් යාවත්කාලීන කෙරිණි.




6.2.10 ජංගම ප්‍රදර්ශන රථය යොදා ගෙන සිදු කරනු ලබන වැඩසටහන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ජංගම ප්‍රදර්ශන රථය යොදාගෙන පාසැල් සිසුන් හා ග්‍රාමීය ප්‍රජාව ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ නොකඩවා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.




7. හදිසි මෙහෙයුම් අංශය

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය 2006 වර්ෂයේදී පිහිටුවන ලද අතර එය සතියෙහි දින 07හිම පැය 24 පුරාවටම ක්‍රියාත්මක වේ. සිදුවීමට ඉඩ ඇති ආපදා පිළිබඳව තාක්ෂණික ආයතන හා මහජනතාව වෙතින් ලැබෙන පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත ලැබෙන අතර අදාළ තොරතුරු ලැබිය යුතු පුද්ගලයන්ට තොරතුරු ලබාදීම සහ එම තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම මෙම මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ. දෛනිකව රට පුරා සිදුවන ස්වාභාවික සහ මිනිසා විසින් සිදු කරනු ලබන ආපදා පිළිබඳව සියලු තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් එකතු කොට දෛනික තත්ත්ව වාර්තාවක් ද පිළියෙල කර එම වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන වෙත නිකුත් කරනු ලැබේ. එසේම මෘදු පිටපතක් විද්‍යුත් තැපෑල හරහා පාර්ශවකරුවන් වෙත නිකුත් කරනු ලබයි.

තවද සියලුම ආපදා අවස්ථාවකදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන විසින් සන්නද්ධ හමුදා, පොලිසිය, ගිනි නිවීම් ඒකක සහ අනිකුත් අදාළ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් පරීක්ෂාව සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, සම්පත් යෙදවීම සහ හදිසි සහනාධාර සැපයීම සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.




හදිසි මෙහෙයුම් මැදිරිය

7.1 ගංවතුර ආපදාවලදි ගත් ක්‍රියාමාර්ග

2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වුණු ජල ගැලීම් හේතු කොටගෙන විපතට පත්වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 62,052ක් විය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකකවල ඉල්ලීම් මත හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන විසින් පොලිසිය සහ සන්නද්ධ හමුදා සහාය ලබා ගෙන මුදවා ගැනීම්, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම සහ හදිසි අවස්ථා සහනාධාර ලබා දීම් කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබිණි.

7.2 දැඩි සුළං ආපදාවලදි ගත් ක්‍රියාමාර්ග

2015 වර්ෂයේ දැඩි සුළං සිද්ධි 99ක් වාර්තා වූ අතර පවුල් 1080ක් ඉන් විපතට පත් වූහ. මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එළිපෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිස්ථාපනය කිරීම සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහය ඇතිව විපතට පත්වූවන්හට සහන ලබාදීමට හදිසි මෙහෙයුම් අංශයට හැකි විය. මෝසම් කාලය ඇරඹීමට පෙර තම නිවාස හා ගොඩනැගිලි අසල ඇති අනතුරුදායක ගස් සහ අතු කපා ඉවත් කර ගන්නා ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මහජනතාවට උපදෙස් ලබා දෙන ලදී.

7.3 ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය හදිසි අවස්ථා උපකරණ මිලට ගැනීම

ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍යවන පහත සඳහන් උපකරණ මිලදී ගැනීමේ කටයුතු සිදු කළ අතර එම උපකරණ හදිසි ආපදා අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක 25 සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ ගිනි නිවීමේ ඒකක වෙත ද බෙදාදීමට කටයුතු කරන ලදී.

විස්තරය	මුළු ප්‍රතිපාදන 2015 (රු.මිලියන)
දම්වැල් කියත් 75ක් මිලදී ගැනීම	5.79
එංජිම සහිත බෝට්ටු 33ක් මිලදී ගැනීම	16.18
අඟුල් 50ක් මිලදී ගැනීම	6.64
බේරා ගැනීමේ හා සොයා ගැනීමේ බෑගයන් 4500ක් මිලදී ගැනීම	7.43
අතින් ක්‍රියා කරවන සයිරන් නළා 241ක් මිලදී ගැනීම	5.89
ගම් බූට්ස් 3000ක් මිලදී ගැනීම	3.86
වතුර ටැංකි (ලීටර් 1000) 100ක් මිලදී ගැනීම	0.81

වගුව 7.1: හදිසි අවස්ථාවලදී උපකරණ මිලට ගැනීම

7.4 ගිනි උවදුරු ආපදාවලදි ගත් ක්‍රියා මාර්ග

2015 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය ශ්‍රී ලංකාව තුළ ගිනි ගැනීමේ සිද්ධි 37ක් වාර්තා වූ අතර කඩිනමින් ගිනි නිවන හමුදා සහය, පොලිසියේ, ගුවන් හමුදාවේ සහ යුධ හමුදාවේ සහාය ලබාගනිමින් එම ගිනි උවදුරු මැඩලීමට ක්‍රියා කරන ලදි. මිනිසුන්ට, දේපලවලට සහ පරිසරයට සිදුවිය හැකි විශාල පරිමාණයේ හානි මෙමඟින් වළක්වා ගැනීමට හැකි වූ අතර මේ සඳහා සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ගම්වාසීන්ගේ සහාය ද ලබා ගැනිමට හැකිවිය.

7.5 නියඟයෙන් පීඩාවට පත්වූ ජනතාව වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග

2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික් 6ක නියඟය හේතු කොට ගෙන විපතට පත්වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 73242ක් විය. මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක විසින් සහනාධාර ලබාදීම් කටයුතු සිදු කරනු ලැබිණි. ට්‍රැක්ටර් බවුසර් මඟින් පීඩාවට පත්වූ ජනතාවට ජලය ලබාදීම සඳහා කටයුතු යොදන ලදී.

ආපදාව	සංඛ්‍යාව	විපතට පත්		මරණ සංඛ්‍යාව	තුවාල සිදු වූ පුද්ගලයන් සංඛ්‍යාව	අතුරුදහන් වූ පුද්ගලයන් සංඛ්‍යාව	හානි වූ නිවාස සංඛ්‍යාව	
		පවුල් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව				පූර්ණ ලෙස	අර්ධ ලෙස
නියඟය		73242	258096	0	0	0	0	0
ගං වතුර		62052	240065	15	18	1	431	5112
දැඩි සුළං	99	1080	3987	0	4	0	99	925
ඉවුරු කඩා වැටීම්	38	144	659	2	6	0	33	57
පිටාරගැලීම	8	9061	30415	0	0	0	0	0
ටෝනාඩෝ	1	57	185	0	0	0	18	41
දියේ ගිලීම්	24	14	38	36	2	6	0	0
අකුණු සැර	44	51	188	23	11	0	1	31
නාය යෑම්	35	207	810	7	1	0	11	150
ගල් පෙරලීම	19	127	385	2	1	0	4	25
එකතුව		**146035**	**534828**	**85**	**43**	**7**	**597**	**6341**

මූලාශ්‍රය *: Disinventra*

වගුව 7.2: 2015 ජනවාරි පළමු වැනි දින සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළදී ව්‍යසන මඟින් සිදුවූ අලාභ හානි පිළිබඳ සාරාංශය

7.6 පූර්ව දැනුම්දීම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි, දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් තුළ පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පූර්ව දැනුම් දීමේ පද්ධතිය විකාශනය කොට ඇත. තවද VHF ක්‍රමවේදය හරහා ද සන්නිවේදන කටයුතු විකාශනය කිරීම සඳහා ක්‍රියාකොට ඇත. පූර්ව දැනුම් දීමේ කුළුණු 77ක් ශ්‍රී ලංකා වෙරළ තීරය සවි කොට එමඟින් ප්‍රජාවන් දැනුවත් කිරීමේ කටයුතු සිදුකරනු ලබයි. DEWN කෙටි පණිවිඩ පද්ධතිය නවීකරණය කර, ප්‍රධාන කණ්ඩායම් ප්‍රමුඛතාවයකට අනුකූලව පෙළගස්වා අදාළ තොරතුරු ප්‍රජාව වෙත ලබාදීම සිදුකරයි.

7.7 අන්තර් රාජ්‍ය ජාලය (Inter Government Network)

ඩයලොග් ආයතනය **Broad band** අන්තර්ජාල පහසුකම ඔස්සේ අඩු වියදම් ක්‍රමවේදයක් ලෙස ස්ථාපනය කිරීමට හැකිවිය. තාක්ෂණික ආයතන, මාධ්‍ය ආයතන, පොලිස් හදිසි මෙහෙයුම් ඒකකය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක 25 ආවරණය වන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය සමඟ පූර්ණ ලෙස සම්බන්ධ වී ඇත. මෙම **IGN** ජාලය සඳහා කෙටි අංක (අංක 03 ක්) භාවිතා කර දුරකථන මාර්ග 42ක් ඔස්සේ අන්තර් සන්නිවේදන ක්‍රමවේදය තවදුරටත් ව්‍යාප්ත කර ඇත.

ඩයලොග් **Broad band** අන්තර්ජාල පහසුකම භාවිතයෙන් හදිසි ආපදා අවස්ථාවකදී සන්නිවේදන කටයුතු විධිමත්ව කරගෙන යෑමට අන්තර් රාජ්‍ය සන්නිවේදන පද්ධතියක් යලි ස්ථාපිත කර ඇත. එලෙසම සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි මෙම පද්ධතිය ව්‍යාප්ත කරන ලදී. එමඟින් ඔවුන් අතර අඩු වියදමින් සම්බන්ධතාවය ගොඩනගා ගැනීමේ හැකියාව වර්ධනය කළ හැක.

7.8 සුනාමි අවස්ථාවලදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ වූ ජාතික පෙරහුරු වැඩසටහන්

සුනාමි ව්‍යසනයට භාජනය වීමට වැඩි නැඹුරුතාවයක් ඇති දිස්ත්‍රික්ක 14ක් (කොළඹ, ත්‍රිකුණාමලය, කිළිනොච්චිය, මන්නාරම, හම්බන්තොට, මාතර, මුලතිව්, කළුතර, අම්පාර, ගාල්ල, යාපනය, පුත්තලම, ගම්පහ, මඩකලපුව) ආවරණය කරමින් වෙරළබඩ ප්‍රජාවන්ගේ ආරක්ෂණ සහ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීම සඳහා සුනාමි අවස්ථාවලදී ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම පිළිබඳ ජාතික මට්ටමේ පෙරහුරු වැඩසටහනක් 2015 මාර්තු මස 10 වන දින පවත්වන ලදී.

මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ පෙර සූදානම් මට්ටම් නිශ්චය කරගැනීම, ආපදා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියෙහි විශ්වාසනීයභාවය පරීක්ෂා කර බැලීම සහ අවසාන සැකසුම් දක්වා තොරතුරු සන්නිවේදනයේ කාර්යක්ෂමතාවය මැන බැලීමයි. සුනාමි අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් අතර දැනුවත්භාවයේ සහ මෙම ක්‍රියාවලිය තුළ ඇති අඩුපාඩු හඳුනාගැනීම සඳහා සහ ගොඩබිම තුළ ආරක්ෂිත ස්ථාන කරා ජනතාව ගමන් කරවීම වැඩිදියුණු කිරීම උදෙසා මෙය ජාතික මට්ටමින් පෙරහුරු වැඩසටහන් සිදු කිරීම වැදගත් වේ. ආරම්භක අවස්ථාවේදී එනම් 2010 වර්ෂයේදී ප්‍රජාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීමට පැය 1 කුත්

විනාඩි 40ක් ගත වූ නමුත් 2015 වර්ෂයේදී දිස්ත්‍රික්ක මට්ටමින් ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීමට ගතවූයේ විනාඩි 35 ක් පමණි.




7.9 ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය

ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය ප්‍රයෝජනයට ගනිමින් එක් එක් දිස්ත්‍රික්කයන්හි වර්තමානයේ පවතින විවිධ උපකරණ හා මානව සම්පත් හඳුනාගනිමින් එම උපකරණ හා මානව සම්පත් හදිසි අවස්ථාවලදි කුලී පදනම මත ලබාගැනීම සිදුකරනු ලබයි. හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීමට එක් එක් දිස්ත්‍රික්කය තුළ පවතින මෙම සම්පත් පිළිබඳ විස්තර දත්ත පදනමකට සකස් කර ඇති අතර වසරකට වරක් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් එය යාවත්කාලීන කරනු ලැබේ.

7.10 ඇමතුම් මධ්‍යස්ථානය

වර්ෂ 2013 සිට ක්‍රියාත්මක වන ආපදා කළමනාකරණ ඇමතුම් මධ්‍යස්ථානය (ඇමතුම් අංකය 117) ආපදා අවස්ථාවලදී මහජනතාව සමග සන්නිවේදනය කිරීම සඳහා ස්ථාපිත කරන ලදී. ඇමතුම් ක්‍රියාකරුවන් 21 දෙනෙකු බඳවා ගනු ලැබූ අතර දැනට හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය පැය 24 පුරාම ක්‍රියාත්මක වේ. මේ දක්වා ඇමතුම් මධ්‍යස්ථානය වෙත පැමිණිලි ඇමතුම්, හදිසි ඇමතුම්, මගහැරීගිය ඇමතුම් සහ විසන්ධි වූ ඇමතුම් ආදී විවිධාකාරී වූ ඇමතුම් මෙම වසරේ දෙසැම්බර් 31 දක්වා 123,194 ක් ලැබී ඇත.




7.11 ඩෙංගු මර්ධන වැඩසටහන

2015 වර්ෂය තුළදී ද දිස්ත්‍රික්ක 25 තුළම ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් පලාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් දිවයින පුරාම ඩෙංගු මර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කරන ලදි. තවද තවදුරටත් ආපදා කළමනාකරණ ඒකකය විසින් ප්‍රදේශයේ

සෞඛ්‍ය නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයින් සහ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සහයෝගය ලබා ගනිමින් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවති.

7.12 ශ්‍රී ලංකා යුද්ධ හමුදා හදිසි ආපදා සහන බණ්ඩ සඳහා "සෙවීම් සහ මුදවා ගැනීම්" පිළිබඳ පස් දින මූලික පාඨමාලාව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කොළඹ නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිත මුදවා ගැනීමේ ඒකකය හා ලෝක සෞඛ්‍ය සංවිධානය එක්ව 2015 සැප්තැම්බර් 14 සිට 2015 නොවැම්බර් 20 දක්වා පැවති දින 05ක සෙවීම් සහ මුදවා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාව වැල්ලවත්ත, රොක්සි ගාඩන් හි පිහිටි නගර සභා ගිනි නිවීම් හා ජීවිත මුදවා ගැනීමේ පුහුණු පාසලේදී සාර්ථකව නිමාවට පත් විය. යුද්ධ හමුදා සෙවීම් සහ මුදවා ගැනීමේ කණ්ඩායමේ සාමාජිකයන් 100 දෙනෙකු (සාමාජිකයන් 20 x වැඩසහන් 05) සමඟ ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සාමාජිකයන් 5×5=25 දෙනෙකු මෙම පුහුණුව සඳහා සහභාගී වීමෙන් එකිනෙකා අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමටද විශේෂ අවස්ථාවක් හිමි විය.



ගිනි නිවීම් හා ජීවිත මුදවා ගැනීමේ පුහුණු පාසැල-වැල්ලවත්ත

7.13 ශ්‍රී ලාංකීය නගර සඳහා ආපදා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම හා උපායමාර්ගික පෙරදැනුම්දීමේ සක්‍රියතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 02 වන අදියර *(UNHABITAT)*

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගැනීම් යටතේ VHF බේස් ස්ටේෂන් 16, රිපීටර් ස්ටේෂන් 02, ගම්බූට්ස් 200, ජන ඇමතුම් කට්ටල 04 ,අතින් ක්‍රියාකරවන සයිරන් 08, සෙවීම් සහ මුදවා ගැනීමේ කඹ (මීටර් 200) 04, පරිගණක 02ක්, ජංගම සන්නිවේදන උපකරණ 02ක් මිලදී ගෙන උපකරණ බෙදා දී මෙම ව්‍යාපෘතිය 2015 වසරේදි අවසන් කරන ලදී.

මානව ජනාවාස සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත ආපදාවලට ඔරොත්තු දෙන නගර සංවර්ධන ක්‍රම උපායන් පිළිබඳ ව්‍යාපෘතියේ දෙවන අදියර අම්පාර, මුලතිව්, වව්නියා සහ මන්නාරම දිස්ත්‍රික් තුළ ක්‍රියාත්මක විය. මේ හරහා ජනතාවගේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ හැකියාව පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය ඉහළ නැංවීමේ කටයුතු සිදු කරන ලදි.

7.14 2015 වර්ෂය තුළදී කරන ලද ආපදා කළමනාකරණයට අදාළ අනිකුත් කාර්යයන්

පාසල් සිසුන්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් 25ක් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් යොදා ගෙන දැනුවත් කිරීම් සිදු කරන ලදී.

7.15 අභියෝග

- **තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණික උපකරණ සහ පුහුණු කිරීම.**

  හදිසි අවස්ථාවක බිම් මට්ටමේ ජනතාව වෙත තොරතුරු සැපයීම සඳහා ඉහත කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුවිය යුතුය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව දැනට පවත්නා සන්නිවේදන සම්ප්‍රේෂණ පද්ධතිය සමස්ත ආපදාවන්ට ලක්විය හැකි ජනතාව ආවරණය කිරීමට තරම් ප්‍රබල මට්ටමක නොපවති. මෙම විවිධ පද්ධතීන් පුර්ව අනතුරු ඇඟවීමේ ජාලය එක් කළ ද ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීමත්, අමතර කොටස් සඳහා අධික මිලක් හේතුවෙන් පවත්නා පද්ධතීන් නඩත්තු කිරීමේ අභියෝගය පවති.

- **කාලගුණ වෙනස්කම් හා ඒවායේ අහිතකර බලපෑම්**

  ආපදා අවම කිරීම පියවර සුදානම් කර තිබුණත් ආපදා හටගැනීම වැළැක්විය නොහැකිය. එබැවින් කාලගුණ විපර්යාසවලින් හට ගැනෙන අභියෝගවලට මුහුණ දීම සඳහා හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම බලගැන්වීම උදෙසා වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතුය.

  කාලගුණික වෙනස්කම් නිසා ඉකුත් වසර කිහිපය තුළ අසාමාන්‍ය කාලගුණික රටාවක් අත්දැකීමට ලැබුණි. එබැවින් කෙටිකාලයකදී අධික වර්ෂාපතනයක් ලැබුණු විට අනාවැකි පළ කළ නොහැකි අන්දමේ ආපදා සිදු වේ. අහිතකර කාලගුණික තත්වයකදී නිවාස, යටිතල පහසුකම්, වගාවන්, පශු සම්පත් ආදිය හානියට පත්වේ. එබැවින් පෙර සුදානම්, කාලගුණ විපර්යාසවලට අනුගතවීම ගැන වැඩි අවධානයක් යොමුකළ යුතු අතර කාලගුණ විපර්යාසවල අහිතකර බලපෑම ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

8. මූල්‍ය ප්‍රගතිය – 2015 දෙසැම්බර් 31

2015 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.මි. 939.81 ප්‍රතිපාදන ලබාදෙන ලදි. ඉන් රු.මි. 9.5ක් ජාතික සභාවේ වියදම් සඳහා ද, රු.මිලියන 168ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්තන වියදම් සඳහා ද, රු.මි. 762.37ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන්කරන ලදී. මෙම සමස්ත ප්‍රතිපාදන මුදලින් 2015 දෙසැම්බර් මස 31 දින වන විට රු. මි. 865.5ක මුදලක් පහත දැක්වෙන පරිදි වැයකර ඇත.

වැය විෂය අංකය	**වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම**	**මුළු ප්‍රතිපාදන 2015(සංශෝධිත) (රු. මිලියන)**	**ලැබුණු ප්‍රතිපාදන 2015 (රු.මිලියන)**	**මුළු වියදම 2015 (රු. මිලියන)**
106-2-3-1-1503	ආපදා කළමනාකරණ ජාතික සභාව (NDMC)	9.5	1.0	0.34
106-2-3-2-1503	පුනරාවර්තන වියදම් (DMC)	168	168	167.5
ප්‍රාග්ධන වියදම්				
106-2-3-2401	පුහුණු හා හැකියා වර්ධනය	2.5	2.5	2.12
106-2-3-5-2201 (I සහ II)	කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	500	499.42	327.54
106-2-3-5-2201-(III)	හදිසි අවස්ථාවන්හිදී ආරක්ෂිත කටයුතු කිරීම.	50	21.77	21.43
106-2-3-7-2201	හදිසි ගංවතුර අවස්ථාවන්ට මුහුණ දීමට උපකරණ මිලට ගැනීම.	75	50	47.06
106-1-2-13-2502	ආපදාවන්ට මුහුණදීමේ සැලසුම් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහාය දීම. *	12	12	9.94
106-2-4-26-2201	ගංවතුර වැළැක්වීම කළුතර දිස්ත්‍රික්කය, පානදුර ප්‍රදේශය.	35	35	28
106-2-4-26-2201	ගංවතුර වැළැක්වීම දඹුල්ල ප්‍රා.ලේ කොට්ඨාසය.	42	42	5
106-2-4-26-2201	ගංවතුර වැළැක්වීම යාපනය දිස්ත්‍රික්කය.	23	23	23
106-2-4-25-2201	දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	15	15	8
	මුළු ප්‍රාග්ධන වියදම් - දේශීය අරමුදල්	**754.5**	**700.69**	**472.09**
ප්‍රාග්ධන වියදම් -විදේශ අරමුදල්				
106-1-2-13-2502	පූර්ව අනතුරු ඇගවීමේ පද්ධතිය වර්ධනය කිරීම- UNHABITAT (Phase - ii) **	7.81	7.81	7.8
	මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන සහ වියදම් - දේශීය සහ විදේශීය අරමුදල්	**762.31**	**708.5**	**479.89**
	මුළු වියදම් - (පුනරාවර්තන හා ප්‍රාග්ධන)	**939.81**	**877.5**	**647.73**

වගුව 8.1: 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

- ආපදාවන්ට මුහුණදීමේ සැලසුම් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහාය දීම සඳහා වන වැඩසටහන වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදෙනුයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගිනි. මේ සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දෙනු ලබන්නේ ද ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ 106-01-02-13-2502-13 යන වැය විෂයය යටතේය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2015 රු. සත.	2014 රු. සත.
ආදායම	01	167,119,514.00	160,000,000.00
වෙනත් ආදායම්	02	195,351,155.31	246,391,847.19
		362,470,669.31	406,391,847.19
පරිපාලන වියදම්	03	(373,722,384.06)	(382,884,411.16)
වෙනත් වියදම්	04	(4,511,174.17)	(20,891,375.17)
මෙහෙයුම්වල අතිරික්තය (හිඟය)		(15,762,888.92)	2,616,060.86
මූල්‍ය වියදම්		-	-
බදුවලට පෙර අතිරික්තය (හිඟය)		(15,762,888.92)	2,616,060.86
බදු		-	-
වසර සඳහා මුළු අතිරික්තය (හිඟය)		(15,762,888.92)	2,616,060.86

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 16 දක්වා අමුණා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2015 රු. සත.	2014 රු. සත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	05	1,285,538,301.94	1,460,770,656.98
ජංගම වත්කම්			
කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති	06	203,166,796.22	77,262,863.25
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	07	33,706,203.05	13,193,408.48
භාණ්ඩ ලේඛන	08	2,574,007.56	2,887,945.41
පෙර ගෙවුම් සහ අත්තිකාරම්	09	2,906,314.37	9,269,335.23
තැන්පත් සහ අනෙකුත් ලැබිය යුතු දෑ	10	1,723,808.72	1,435,163.62
මුදල් සහ මූල්‍ය තුල්‍යන්	11	23,520,286.72	5,755,454.02
මුළු ජංගම වත්කම්		**267,597,416.64**	**109,804,170.01**
මුළු වත්කම්		**1,553,135,718.58**	**1,570,574,826.99**
අරමුදල්, සංචිත සහ වගකීම්			
ශුද්ධ වත්කම්/ කොටස්		-	-
සමුච්චිත අරමුදල්		(45,278,568.73)	(35,294,840.79)
සංචිත			
මහා භාණ්ඩාගරයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන		833,185,769.81	901,357,691.45
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන -භාණ්ඩාගාරය		7,505,000.00	12,245,000.00
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - ICET		1,244,186,078.53	1,423,794,229.73
ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	12	(525,322,864.53)	(752,671,921.64)
මුළු ශුද්ධ වත්කම් / කොටස්		**1,514,275,415.08**	**1,549,430,158.75**
ජංගම නොවන වගකීම්			
වෙනත් සංවිධානවලින් ලැබෙන ප්‍රදාන	13	14,979,600.38	5,117,213.12
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	14	21,174,185.63	12,474,738.75
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	15	2,500,505.93	3,346,704.81
වෙනත් ප්‍රතිපාදන	16	206,011.56	206,011.56
මුළු ජංගම වගකීම්		**2,706,517.49**	**3,552,716.37**
මුළු වගකීම්		**38,860,303.50**	**21,144,668.24**
මුළු අරමුදල් සහ වගකීම්		**1,553,135,718.58**	**1,570,574,826.99**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 16 දක්වා අමුණා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 වන දිනට ආයතනයේ කටයුතු පිළිබඳව සහ අවසාන වූ වර්ෂය සඳහා එහි අතිරික්තය (හිඟය) පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශ රජයේ රීති සහ රෙගුලාසිවලට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකියනු ලැබේ.

නිශාන්ත අබේසිංහ
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
දිනය

මේජර් ජෙනරල් එල්. බී. ආර්. මාර්ක් (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
දිනය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ කොටස්වල වෙනස්කම් දැක්වෙන ප්‍රකාශය

	භාණ්ඩාගාරය ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අරමුදල	ශුද්ධ වත්කම් මුළු එකතුව
	රු. සත.	රු. සත.	රු. සත.
2014 ජනවාරි 01 දිනට ශේෂය	540,245,702.20	(41,740,875.81)	498,504,826.39
ගිය වර්ෂයේ ගැලපුම්		3,829,974.16	3,829,974.16
2014 වර්ෂය තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	744,435,986.97	-	744,435,986.97
2014 වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන මත කරන ලද ආයෝජන	(769,194,631.17)	-	(769,194,631.17)
2014 වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)		2,616,060.86	2,616,060.86
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	515,487,058.00	(35,294,840.79)	480,192,217.21
2015 ජනවාරි 01 දිනට ශේෂය	515,487,058.00	(35,294,840.79)	480,192,217.21
පෙර වර්ෂයේ ගැලපුම්	-	5,779,160.93	5,779,160.93
2015 වර්ෂය තුළ ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන	684,500,000.00	-	684,500,000.00
2015 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන මත කරන ලද ආයෝජන	(525,322,864.53)	-	(525,322,864.53)
2015 වර්ෂය සඳහා අතිරික්තය(හිඟය)	-	(15,762,888.92)	(15,762,888.92)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	674,664,193.47	(45,278,568.78)	629,385,624.69

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 16 දක්වා අමුණා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015	2014
	රු. සත.	රු. සත.
බදුවලට පෙර අතිරික්තය(හිඟය)	(15,762,888.92)	2,616,060.86
ගැලපීම්		
ක්ෂයවීම්	187,020,281.57	231,275,411.42
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(181,500,222.57)	(223,930,259.48)
පාරිතෝෂික ගෙවීම		(124,351.25)
සේ.අ.අ. අමතර දායකත්වය ගෙවීම		(209,918.47)
මෝටර් වාහන ගැලපුම් ක්‍රමක්ෂය	2,847,928.63	-
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් ප්‍රතිපාදන	8,699,446.88	3,530,994.37
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)	1,304,545.59	13,157,937.45
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
වෙනත් ලැබීම්වල වැඩිවීම් (අඩුවීම්)	(288,645.10)	-
භාණ්ඩ ලේඛනවල වැඩිවීම් (අඩුවීම්)	313,937.90	(510,015.25)
තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ වැඩිවීම් (අඩුවීම්)	(20,512,794.57)	2,316,642.08
පෙර ගෙවීම් සහ අත්තිකාරම් වැඩිවීම් (අඩුවීම්)	6,363,020.86	(5,341,732.33)
වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් (අඩුවීම්)	(846,198.88)	(6,495,871.68)
වෙනත් ප්‍රතිපාදනවල වැඩිවීම් (අඩුවීම්)	-	(2,670,787.50)
ප්‍රාග්ධන WIP ව්‍යාපෘති වැඩිවීම් (අඩුවීම්)	(125,903,932.97)	11,908,826.67)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් දළ මූල්‍ය ප්‍රවාහය	(139,570,067.17)	12,364,999.44
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම්	(11,787,926.53)	(1,023,373.57)
පොළී ආදායම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් දළ මූල්‍ය ප්‍රවාහ	(11,787,926.53)	(1,023,373.57)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රදාන (ලැබීම්) ශුද්ධ වැඩිවීම්	684,500,000.00	744,435,986.97
ප්‍රාග්ධන ප්‍රදාන (ගෙවීම්) ශුද්ධ වැඩිවීම්	(525,322,864.53)	(769,194,631.17)
රා.නො.සං සහ අ.රා. නො. සං වලින් ශුද්ධ ප්‍රදාන	9,945,691.37	3,479,354.33
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් දළ මූල්‍ය ප්‍රවාහ	169,122,826.84	(21,279,289.87

මුදල් සහ මූල්‍ය තුල්‍යන්ගේ දළ මූල්‍ය ප්‍රවාහ	17,764,832.70	(9,936,664.00)
වර්ෂය අවසානයේ මුදල් සහ මූල්‍ය තුල්‍යන්	5,755,454.02	15,692,118.02
වර්ෂය අවසානයේ මුදල් සහ මූල්‍ය තුල්‍යන් (සටහන ඒ)	23,520,286.72	5,755,454.02

සටහන ඒ - මුදල් සහ මූල්‍ය තුල්‍යන්	**රු. සත.**	**රු. සත.**
බැංකුවේ ඇති මුදල්	23,464,131.47	5,714,298.77
අතැති මුදල්	56,155.25	41,155.25
	23,520,286.72	5,755,454.02

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 16 දක්වා අමුණා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 ස්ථානය සහ නෛතික ස්වභාවය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට සහාය දීම සඳහා 2005 අංක 13 දරන පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. අමාත්‍යාංශයේ නම මහජන සාමය ආපදා කළමනාකරණ සහ ක්‍රිස්තියානි කටයුතු වශයෙන් 2015දී වෙනස් කරන ලදී.

1.2 සංස්ථාගත කරන ලද රට

2005 අංක 13 දරන පාර්ලිමේන්තු පනත යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සංස්ථාගතකොට තිබේ.

1.3 මෙහෙයුම් කටයුතු කෙරෙන ප්‍රධාන ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත ,කොළඹ 07හි පිහිටා තිබේ .එසේම සෑම කච්චේරියකම දිස්ත්‍රික් කාර්යාල 25ක් පිහිටුවා තිබේ.

1.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ ස්වාභාවික, තාක්ෂණික සහ මිනිසා විසින් ඇති කරන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම තුළින් ජාතිය සහ ප්‍රජාවන් අතර ආරක්ෂිත සංස්කෘතියක්

නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීමයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ 'ප්‍රජාවන් ආරක්ෂිත සහ සූදානම් සහිත බව තහවුරු කිරීම' වේ

2. සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශයන්ට **පූර්ණ ආදායම් ප්‍රකාශයක්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්, අරමුදල් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශවලට ඇති සටහන්වලින් සමන්විත වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර තිබේ. තවදුරටත් එමඟින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.**

2.1.2 සැකසීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල්වලින් සකස් කර ඇති මෙම ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන උද්ධමනාත්මක සාධක සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නැත. අවශ්‍ය අවස්ථාවල භාවිතා කරන ලද විශේෂ ප්‍රතිපත්තීන් පසුව එන සටහන්වලින් විස්තර කර තිබේ.

2.1.3 සන්සන්දනාත්මක තොරතුරු

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ස්ථාවරව යොදාගෙන තිබේ.

2.1.4 මූල්‍ය වර්ෂය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වර්ෂය වන්නේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂයයි.

2.2 දේපල, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය හෝ සමුච්චිත ක්ෂයවීම් අඩුකළ තක්සේරුව මත සඳහන් කර තිබේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ පහත පරිදි සමාන වාරිකවලින් තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් දේ ලියා හැරීමට සඳහා වන සින්නක්කර ඉඩම්වලට වඩා සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මතය.

	අනුපාතය%
ගොඩනැගිලි සහ ආකෘති	2.5
සුනාමි සහ පූර්ණ අනතුරු ඇඟවීමේ කුළුණු	5
කාර්යාල උපකරණ	10
ගෘහ භාණ්ඩ සහ උපකරණ	10
පරිගණක සහ උපාංග	10
මෝටර් වාහන	20
විදුලි සන්දේශ උපකරණ	5-20
ගිණුම්කරණ මෘදුකාංග	20

2013ට පෙර ක්ෂයවීම් ඉදිරිපත් කර ඇත්තේ මිලදී ගත්/ ඉදිකළ වත්කම් භාවිතා කරන වසර තුළ වේ. මිලදී ගත්/ ඉදිකළ වසර තුළ ක්ෂයවීම් අයකර නොගන්නා නිසාත් එම වත්කම බැහැර කරන වර්ෂයේ එය සම්පූර්ණයෙන් ක්ෂය කරන නිසාත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තම ක්‍රමය වෙනස් කර තිබේ.

2.3 විශ්‍රාමික පාරිතෝෂික ගෙවීමේ ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයන්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කළ සෑම වර්ෂයක් වෙනුවෙන්ම ලිත් වර්ෂයේ අවසන් මාසය සඳහා වූ වැටුපෙන් අඩක් ගණනය කර ගිණුම් හරහා විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සකස් කර තිබේ. මෙම විෂයය විලම්බන වගකීම් යටතේ කාණ්ඩගත කර තිබේ. මෙම ප්‍රතිපාදන බාහිර වශයෙන් මූල්‍යකරණය කිරීමක් හෝ ආයුගණක ලෙස ඇගයීමක් සිදු කොට නැත.

2.4 වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත සාක්ෂාත් කරගතහැකි වටිනාකමක් මත ගෙන යයි. වසර අවසානයේදී සියලුම ලැබිය යුතු ප්‍රමාණයන් සමාලෝචනය කොට ඒ මත පදනම්ව සැක සහිත ලැබිය යුතු දෑ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබේ. බොල් ණය ඒවා හඳුනාගත් වර්ෂයේ කපා හරිනු ලැබේ.

2.5 මුදල් සහ මූල්‍ය තුල්‍යන්

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සඳහා මුදල් සහ මුදල් තුල්‍යන්වලට අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු, බැංකු අයිරාවන් ආදිය ඇතුළත් වේ. ශේෂ පත්‍රය තුළ බැංකු අයිරාවන් ජංගම වගකීම්වල ගත් ණය තුළ ඇතුළත් වේ.

2.6 වාර්තාකරන කාල සීමාවෙන් පසු සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට පසුව සිදුවන සියලුම ද්‍රව්‍යමය සිද්ධීන් සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවල සහ ස්ථානවල අවශ්‍ය ගැලපීම් කරනු ලැබේ.

2.7 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ඇතුළත් කරනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති (තවදුරටත්)

2.8 නිශ්චිත දායකත්ව සැලසුම්

සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබයි. ආයතනය විසින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් 12% ක සහ 3% ක් දායකත්වයක් සපයයි.

2.9 ආදායම

2.9.1 වර්තන ස්වරූපයේ ආධාර

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 29, 30 හා 31 වන වගන්තිවලට අනුව ආණ්ඩුවේ ප්‍රදාන සහ ආණ්ඩුවේ ප්‍රදාන හෙළිකිරීම්, වර්තන වියදම් වෙනුවෙන් ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන ආදායම් ලෙස ගණන් ගන්නා අතර ආයතනය විසින් උපදවාගන්නා සියලු ප්‍රදාන සෘජුවම අනෙකුත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

2.9.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රදාන

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 29, 30 හා 31 වන වගන්තිවලට අනුව ආණ්ඩුවේ ප්‍රදාන සහ ආණ්ඩුවේ ආධාර හෙළිකිරීම්, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන ආදායම් ලෙස ගණන් ගන්නා අතර ආයතනය විසින් උපදවාගන්නා සියලු ප්‍රදාන සෘජුවම අනෙකුත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

2.1.0 වියදම් පිළිගැනීම

වසර සඳහා වියදම අනුව ආදායම ගණන් බැලීමේදී ආයතනය පවත්වාගෙන යාම සඳහා තිබෙන වර්තන ස්වභාවයේ සියලුම වියදම් ආදායමට එක් කරනු ලැබේ.

2.1.1 භාණ්ඩ ලේඛන පොත්

භාණ්ඩ ලේඛන පොත් තථ්‍ය පිරිවැයට අනුව ඇගයුම් කර ඇති අතර පළමුව පැමිණි පළමුව පිටවීම යන පදනම මත නිකුත් කර තිබේ. භාණ්ඩ ලේඛනවල අවසන් ශේෂය මිලට ගත් අවසන් අගයට අනුව අගයනු ලැබේ.

2015 මූල්‍ය ප්‍රකාශයට සටහන්	**2015**	**2014**
	රු. සත.	**ර. සත.**
සටහන 01 - ආදායම්		
වර්තන වියදම් සඳහා ප්‍රධාන	167,119,514.00	160,000,000.00
	167,119,514.00	160,000,000.00

මහා භාණ්ඩාගාරය වෙතින් ලැබෙන වර්තන වියදම් සඳහා වන ප්‍රදාන ලංකා ගිණුම්කරන ප්‍රමිති 20 - ආණ්ඩුවේ ආධාර සහ ආණ්ඩුවේ සහාය හෙළිදරව් කිරීම සඳහා වන ගිණුම්කරණය අනුව පිළිගනු ලබයි. එම ප්‍රමිතීන්ට අනුව ආණ්ඩුවේ ආධාර එම ආධාර ලැබෙන බවට ප්‍රමාණවත් තහවුරුවක් ලැබෙන තෙක් පිළිනොගත යුතුය. එමනිසා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වර්තන ආධාර පමණක් 2014 දෙසැම්බර් 31 දිනට තම ආදායම ලෙස පිළිගෙන තිබේ. එහෙත් අදායමට අනුව වියදම් සිදුවූ පදනම් මත ගණන් බලා තිබේ.

සටහන 02 -	**රු. සත.**	**රු. Cts.**
Oxfam සහාය	-	-
UNDP සහාය	271,382.00	190,611.00
World Vision සහාය	-	-
ADPC සහාය	-	1,301,908.00
ADRC සහාය	-	-
Asian Foundation සහාය	-	-
UNDP for Safety Day Donation සහාය	990,000.00	-
SAARC (SDMC) සහාය	-	-
CSE සහාය	-	-

රතු කුරුස සංවිධානයේ සහාය	-	299,092.77
Save the Children සහාය	-	-
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	-	12,500,000.00
තොරතුරු තාක්ෂණය සම්බන්ධ තොරතුරු / ගිණුම්	-	-
ටෙන්ඩර් තැන්පත්/ ආපසු නොගෙවන	85,500.00	104,000.00
ආශ්‍රිත පාසල් ප්‍රධානීන්	-	-
සුනාමි ඉවත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශට	-	-
කෙයා ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා	-	-
විවිධ ආදායම්	145,106.12	24,290.37
ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය	181,500,222.57	223,930,259.48
දැයට කිරුළ සඳහා ආ.ක. අ. සහාය	-	3,820,535.39
UN Spider සහාය	-	-
සංඥා පුවරු සඳහා සහාය	-	-
ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සහාය	627,585.00	105,000.00
SADKN වෙතින් සහාය	-	-
Satellite Con. සහාය. ආ.ක.අ. ගාස්තු	-	-
UNHABITAT සහාය	7,704,531.09	-
ඩයලොග් සහාය	-	339,300.00
ආරක්ෂිත දිනය සඳහා CHA සහාය	-	171,126.56
ජාහමෙසැ සඳහා UNDP සහාය	-	581,000.00
ADPC ආරක්ෂිත දින සහාය	-	1,034,215.00
වැඩමුළු සඳහා සාක් සහාය	-	40,000.00
ජාඅාකම සහාය	1,000,000.00	-
රක්ෂණ හිමිකම් පෑම්	27,550.00	140,787.52
සාක් අවශ්‍යතා තක්සේරු වැඩසටහනේ සහාය	151,349.90	1,809,721.10
	195,351,155.31	246,391,847.19

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015

සටහන් 02 - වෙනත් ආදායම්

උපසටහන - 02:01 වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

ප්‍රදානය කරන ලද වත්කම්	2015.01.01 දිනට මුළු වියදම	වසරේ කළ එකතු කිරීම්/ ආයෝජන	පෙර වර්ෂයේ ගැළපුම්	2015.12.31 ට මුළු වියදම
	රු. සත.	රු. සත.	රු. සත.	රු. සත.
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු-	426,286,941.28			426,286,941.28
කාර්යාල උපකරණ	5,916,010.90			5,916,010.90
ගෘහභාණ්ඩ සහ උපකරණ	558,600.00			558,600.00
මෝටර් වාහන	259,413,229.98			259,413,229.98
විදුලි සන්දේශ උපකරණ– ICET	1,547,757,171.74			1,547,757,171.74
පරිගණක සහ උපාංග– ICET	66,762,750.01			66,762,750.01
මෝටර් වාහන, භාණ්ඩාගාරය, වෙනත්	23,700,000.00			23,700,000.00
	2,330,394,703.91	-	-	2,330,394,703.91

ක්‍රමක්ෂය	2015.01.01 දිනට සමුච්චිත ශේෂය	වසර සඳහා ක්‍රමක්ෂය	පෙර වර්ෂයේ ගැලපීම්	2015.12.31 දිනට සමුච්චිත ශේෂය
මෝටර් වාහන, භාණ්ඩාගාරය, වෙනත්	11,455,000.00	4,740,000.00	-	16,195,000.00
මෝටර් වාහන ICET	248,242,421.44	8,061,845.65	2,847,928.63	259,152,195.79
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ICET	90,584,996.58	21,314,347.06	-	111,899,343.64
පරිගණක සහ උපාංග ICET	33,381,375.55	6,676,275.00	-	40,057,650.55

කාර්යාල උපකරණ ICET	4,998,710.90	183,460.00	-	5,182,170.90
විදුලි සන්දේශ උපකරණ ICET	505,373,669.71	140,468,434.86	-	645,842,104.57
ගෘහ භාණ්ඩ සහ උපාංග	279,300.00	55,860.00	-	335,160.00
	894,355,474.18	181,500,222.57	2,847,928.63	1,078,663,625.48

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වත්කම් ප්‍රාග්ධන ආධාර ක්‍රමක්ෂය සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිය 2013 වසරේදී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 - ආණ්ඩුවේ ආධාර සහ ආණ්ඩුවේ සහාය හෙළි කිරීම සඳහා වන ගිණුම්කරණය අනුව වෙනස් කරන ලදී. ඉහත ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා ගිණුම්කරණ පිළියම් ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 8 , ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැරදි යනුවෙන් සඳහන් ආපස්සට බලපාන යෙදවුම් මගින් 2013 වසරේදී සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015

සටහන 03 - පරිපාලන වියදම්	2015 Rs. Cts.	2014 Rs. Cts.
ක්ෂයවීම්		
කාර්යාල උපකරණ	1,942,488.05	1,863,013.15
ගිණුම්කරණ මෘදුකාංග	107,500.00	100,000.00
ගොඩනැගිලි සහ ආකෘති	-	-
වාහන	13,436,202.25	55,478,873.40
ගෘහ භාණ්ඩ සහ උපකරණ	640,294.25	628,023.29
සුනාමි සහ පූර්ව දැනුම් දීමේ කුළුණු	21,366,091.07	21,366,091.07
විදුලි සන්දේශ උපකරණ	140,709,514.86	143,077,671.42
ඉඩම්	-	-
පරිගණක	8,818,191.09	8,761,739.09
නඩත්තු වියදම්		
ගොඩනැගිලි නඩත්තු	-	566,422.80
වාහන නඩත්තු	11,364,219.73	8,570,810.30
යන්ත්‍රෝපකරණ සහ අනෙක් උපකරණ නඩත්තුව	10,216,494.63	6,869,949.74
පුද්ගල පාරිශ්‍රමික		
ආ.ක. අයේ සේ.අ.සා.අ. දායකත්වය (12%)	11,705,037.08	8,863,530.78
වෙනත් දීමනා	51,951,060.00	29,300,243.22
ආ.ක. අයේ සේ.අ.සා.අ. දායකත්වය (3%)	2,876,463.18	2,166,251.95
වැටුප් සහ පඩිනඩි පිරිවැය ගිණුම	44,706,750.18	43,002,704.63
රියදුරන් සඳහා නිල ඇඳුම් දීමනා	136,000.00	-
අතිකාල වියදම්	4,319,858.54	4,107,445.04
චර්තන වියදම්		
ගෙවියයුතු සේඅඅසහ සේභාඅ සඳහා ප්‍රතිපාදන	-	-
ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිලාභ	8,936,348.13	3,530,994.37
බදු	-	-
සේවා		
තැපැල් සහ විදුලි සන්දේශ	8,263,874.48	8,033,626.85
වෙළෙඳ දැන්වීම්	187,696.50	353,328.00
පරිවර්තන ගාස්තු	273,548.00	144,585.50
ප්‍රගති සමාලෝචන රැස්වීම් වියදම්	202,694.00	-

ඩෙංගු වැඩසටහන් සඳහා වියදම්	-	-
AMC ගෙවීම්	28,000.00	58,400.00
වෙනත් වියදම්	552,262.96	1,048,936.68
විදුලිය සහ ජලය	10,710,750.94	12,158,665.97
ආරක්ෂක සේවා	1,529,040.54	1,743,000.00
නෛතික ගාස්තු	-	-
ප්‍රවාහන වියදම්	-	95,885.60
සනීපාරක්ෂක සේවා	1,088,166.73	997,181.27
විමසීම් ගාස්තු	37,725.00	107,664.25
දැයට කිරුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	-	111,500.00
කුළිය සහ දේශීය බදු	624,723.58	573,633.48
IMC ගෙවීම්	187,649.50	192,448.50
සම්මුඛ පරීක්ෂණ ආශ්‍රිත වියදම්	1,725.00	7,200.00
සැපයුම්		
පුවත්පත් සහ වෙනත්	72,970.00	207,780.00
ඉන්ධන වියදම්	7,729,214.17	10,421,404.26
සංග්‍රහ වියදම්	240,078.55	234,334.69
මුද්‍රණය, ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	3,182,018.36	3,362,911.41
ප්‍රවාහන සහ යැපුම් වියදම්		
ප්‍රවාහන සහ යැපුම් වියදම්- දේශීය	2,874,994.21	2,628,824.00
ප්‍රවාහන සහ යැපුම් වියදම් - විදේශීය	2,702,738.50	2,149,336.45
	373,722,384.06	382,884,411.16

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015	2015	2014
	රු. සත.	රු. සත.
සටහන 04 - වෙනත් වියදම්		
UNESCAP ආධාර වියදම්	-	-
Oxfam ආධාර වියදම්	-	-
චීන ආධාර වියදම්	-	-
UNDP ආධාර වියදම්	19,382.00	41,611.00
ඉතාලි ආධාර වියදම්	-	-
World Vision ආධාර වියදම්	-	-
ADPC ආධාර වියදම්	1,140,000.00	1,301,908.00
ADRC ආධාර වියදම්	-	-
Asian Foundation ආධාර වියදම්	-	-
CBSM ආධාර වියදම්	-	-
UNDP for Safety day donation ආධාර වියදම්	-	-
SAARC ආධාර වියදම් (SDMC)	-	-
CSE ආධාර වියදම්	-	-
රතු කුරුස සහාය වියදම්	-	191,041.26
සේව් ද චිල්රන් වෙතින් වියදම්	-	-
තොරතුරු තාක්ෂණයට අදාළ උපකරණ	-	-
සූදානම් වීමේ සැලසුම්වල හානිපූර්ණය	-	-
සුනාමි ඉවත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය	-	-
ජාඅාකම වියදම්	336,348.00	11,959,246.00
ආශ්‍රිත පාසල් ප්‍රධානීන්	-	-
වෙනත්	-	-
දැයට කිරුළ වියදම්	-	3,818,506.25
ලෝක සෞඛ්‍ය සංවිධාන ආධාර වියදම්	601,289.84	105,000.00
CHA -ආරක්ෂක දිනය සඳහා වියදම්	-	-

NEOP සඳහා UNDP ආධාර	1,418,320.00	419,000.00
ADPC ආරක්ෂණ දිනය සඳහා වියදම්	-	-
වැඩමුළු සඳහා සාක් වියදම්	10,000.00	40,000.00
සාක් අවශ්‍යතා තක්සේරු වැඩසටහනෙන් වියදම්	151,349.90	1,809,721.10
CHA -ආරක්ෂණ දින වියදම්	-	171,126.56
ADPC - ආරක්ෂණ දින වියදම්	5,800.00	1,034,215.00
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා China CAMC Eng. Co. Ltd වෙතින් වියදම්	-	-
IDMP වියදම්	396,400.00	-
RSSDP වියදම්	36,045.00	-
SFDRR වියදම්	321,122.43	-
DOSEG වියදම්	75,117.00	-
ප.පා.වල ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍යදාරාගතකිරීමෙන් වියදම්	-	-
	4,511,174.17	20,891,375.17

සටහන 05 - දේපල, පිරියත සහ උපකරණ

		2015.01.01	වසර තුළ	2015.12.31	2015.01.01
		දිනට	එකතු කිරීම්/ මාරු කිරීම්	දිනට	දිනට
ස්ථාවර වත්කම්		මුළු වියදම		මුළු වියදම	වටිනාකම
		රු. සත.	රු. සත.	රු. සත.	රු. සත.
සුනාමි සහ පූර්ව දැනුම් දීමේ කුළුණු	5%	427,321,821.33	-	427,321,821.33	336,374,616.73
කාර්යාල උපකරණ	05:02 10%	23,350,381.39	239,810.00	23,590,191.39	7,125,697.86
ගෘහභාණ්ඩ සහ උපකරණ	05:03 10%	6,384,267.48	193,172.53	6,577,440.01	3,343,534.34
පරිගණක සහ උපාංග	05:05 10%	87,896,890.85	550,520.00	88,447,410.85	49,941,069.59
මෝටර් වාහන	05:04 20%	297,462,051.98	-	297,462,051.98	21,202,236.43
විදුලිසන්දේශ උපකරණ	05:01 5-20%	1,547,757,171.74	10,774,424.00	1,558,531,595.74	1,042,383,502.03
ගිණුම්කරණ මෘදුකාංග	20%	500,000.00	30,000.00	530,000.00	400,000.00
		2,390,672,584.77	11,787,926.53	2,402,460,511.30	1,460,770,656.98

		2015.01.01 ට	වසරේ	2015.12.31ට	2015.12.31
		සමුච්චිත ශේෂය	ප්‍රතිපාදන/ ගැලපීම්	සමුච්චිත ක්ෂයවීම්	දිනට ලියාතබන ලද
ක්ෂයවීම්					ශේෂය
		රු සත.	රු. සත.	රු සත.	රු. සත.
සුනාමි සහ පූර්ව දැනුම් දීමේ කුළුණු	5%	90,947,204.60	21,366,091.07	112,313,295.67	315,008,525.66
කාර්යාල උපකරණ	10%	16,224,683.53	1,942,488.05	18,167,171.58	5,423,019.81
ගෘහභාණ්ඩ සහ උපාංග	10%	3,040,733.14	640,294.25	3,681,027.39	2,896,412.62
පරිගණක	10%	37,955,821.26	8,818,191.09	46,774,012.35	41,673,398.50
වාහන	20%	276,259,815.55	13,436,202.25	289,696,017.80	7,766,034.18
විදුලි සන්දේශ උපකරණ	5-20%	505,373,669.71	140,709,514.86	646,083,184.57	912,448,411.17
ගිණුම්කරණ මෘදුකාංග	20%	100,000.00	107,500.00	207,500.00	322,500.00
		929,901,927.79	187,020,281.57	1,116,922,209.36	1,285,538,301.94

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015 **උප සටහන 05:01**

සටහන 05 - දේපල, පිරියත සහ උපකරණ

උප සටහන - 05:01 සන්නිවේදන උපකරණ		**2015.12.31 දිනට**	**2014.12.31 දිනට**
අයිතමය		**වියදම**	**වියදම**
		රු . සත.	**රු. සත.**
බේස් රේඩියෝ VHF බේස් රේඩියෝ පොළ	37	7,984,435.00	
දත්ත ජාලය	1	121,376,538.95	121,376,538.95
සැඩ පහර සහ අකුණුවලින් ආරක්ෂාව	60	137,180,491.64	137,180,491.64
සන්නිවේදන පද්ධති Vsat	2	287,691,768.00	287,691,768.00
උපස්ථ බල පද්ධති සූර්ය ශක්ති ඉන්වර්ටර් පදනම් කරගත්	25	17,086,057.80	17,086,057.80
ඇම්ප්ලිෆයර් A AMP 43- pa case.Amplif.CPA -760 75W	25	1,868,552.11	1,868,552.11
Handhelds VHF	150	45,817,808.40	45,817,808.40
Transceivers TR 7180-K-VHF FM - 136-174 MHZ	18	9,084,751.20	9,084,751.20
Repeaters Motorola CDR 500 wall Mounted Link (UNHABITAT)	2	2,789,989.44	
පුනරාවර්තන පොළී	4	71,820,000.00	71,820,000.00
RP ගුවන් විදුලි පද්ධති	10	19,920,633.60	19,920,633.60
සන්නිවේදනය මත calling ducts සහ floor ducts, ඇතුළුව කේබල් කිරීම	1	9,576,000.00	9,576,000.00
සන්නිවේදන සේවා සහ ස්ථාන පහසුකම් EOC / 24/7 මධ්‍යස්ථානය	1	426,912,428.04	426,912,428.04
පද්ධති සහ තාක්ෂණික EOC / 24/7 මධ්‍යස්ථානය	1	182,582,400.00	182,582,400.00
මෘදුකාංග EOC / 24/7 මධ්‍යස්ථානය	1	40,112,906.40	40,112,906.40
Trunk Radio	1	176,726,835.60	176,726,835.60
එකතුව	**339**	**1,558,531,595.74**	**1,547,757,171.74**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන - 2015 උප සටහන : **05:02**

සටහන 05 දේපල, පිරියත සහ උපකරණ

උප සටහන - 05:02 කාර්යාල උපකරණ		**2015.12.31**	**2014.12.31 දින වන විට වියදම**
විෂය		**දිනට වියදම**	
		රු . සත.	**රු. සත.**
ප්‍රවේශ ස්ථානය	2	16,500.00	16,500.00
පේපර් ශ්‍රෙඩර්	1	9,791.00	9,791.00
පොටෝ කොපි	16	1,855,000.00	1,855,000.00
ප්‍රොජෙක්ටර්	40	5,554,820.20	5,554,820.20
ෆැක්ස් මැෂින්	42	996,422.50	785,512.50
කැමරා	64	1,759,784.95	1,696,784.95
ටෙලිවිෂන්	34	2,734,349.61	2,734,349.61
ඩුප්ලෝ මැෂින්	1	514,050.00	514,050.00
ජීපීඑස්	16	677,600.00	677,600.00
වර්ල්ඩ් ස්පේස් රේඩියෝ	50	575,120.00	575,120.00
PA පද්ධති	56	1,530,697.13	1,530,697.13
සේප්පු	4	109,681.75	109,681.75
සේප්පු දාරක	4	17,708.99	17,708.99
දුරකථන	173	5,456,377.26	5,456,377.26
විදුලි පංකා	3	24,450.00	5,250.00
ෆ්‍රෑන්කින් පද්ධති	2	483,720.00	483,720.00
සින්ගර් ශීතකරණ	1	44,290.00	44,290.00
බොයිලේරුව	1	4,800.00	4,800.00
සීලිම් විදුලි පංකා	1	3,400.00	3,400.00
ඇණිලි සළකුණු යන්ත්‍ර	1	61,600.00	61,600.00
මූල්‍ය රෙගුලාසි සහ ආයතන සංග්‍රහ	6	1,549.00	1,549.00

ස්පීකර්ස්	1	825.00	825.00
ජල පෙරණ	2	18,520.00	9,000.00
කාර්යාල උපකරණ	-	8,055.00	8,055.00
වීඩියෝ රෙකෝඩර	1	17,360.00	17,360.00
වායු සමීකරණ යන්ත්‍ර 24000 BTU (spilt type)	4	877,000.00	877,000.00
නොකියා -105 S/N – 359972059294613	5	14,950.00	14,950.00
නොකියා 106 NV S/N – 359195054699207	1	3,590.00	3,590.00
Panasonic LED TV	1	89,999.00	89,999.00
SAMSUNG GALAXY Core Duos GT-1826	5	191,000.00	191,000.00
කාන්දම් ෆ්ලිප් චාට් බෝඩ් ෆ්ලිප් චාට් 2' x 3'	2	17,500.00	-
කාන්දම් නොවන ෆ්ලිප් චාට් බෝඩ් ෆ්ලිප් චාට් 2' x 3'	3	24,750.00	-
රවුටර්	3	12,930.00	
එකතුව	**544**	**23,590,191.39**	**23,350,381.39**

උප සටහන් - 05:03 ගෘහ භාණ්ඩ සහ උපකරණ **අයිතමය**		**2015.12.31** **දිනට වියදම** **රු. සත.**	**2014.12.31** **දිනට වියදම** **රු. සත.**
කැම මේස	4	21,907.00	21,907.00
ලිපිගොනු කැබිනට්	43	478,349.27	478,349.27
උස ඇන්ද සහිත විධායක පුටු	20	141,242.75	141,242.75
යතුරු ලියනනන් සඳහා පුටු	31	187,530.52	144,465.52
කැම මේසයට පුටු	12	36,195.00	36,195.00
සම්මන්ත්‍රණ මේසය	6	361,300.50	361,300.50
පරිගණක මේස	18	153,609.96	134,934.96
රෙදි අත්පුටු	65	433,715.17	433,715.17
පුස්තකාල කැබිනට්	5	87,641.96	87,641.96
සැකසිය හැකි රාක්ක සහිත කාර්යාල කබඩ්	24	254,387.53	254,387.53
අඩ කබඩ් සහ ලිපිගොනු කැබිනට්	7	77,553.32	77,553.32
උස ඇඳි සහිත පුටු	15	127,437.66	115,472.04
ලියන මේස	56	852,033.29	852,033.29
පරිගණක පුටු	16	52,842.00	52,842.00
වානේ කැබිනට්	2	19,055.50	19,055.50
L.P.Ex:Table 52x76 cm cur.top with p.Draw.	5	50,287.50	50,287.50
L.P.Ex.Table 183x91cm cur.top with p.draw	1	11,335.50	11,335.50
L.P.site Table 12x61 cm	1	6,030.00	6,030.00
බහුකාර්ය ආධාරකය	1	345.70	345.70
වීදුරු මතුපිට සහිත කෝපි මේසය	2	12,091.75	12,091.75
ප්‍රින්ස් සෝෆා සෙට්	2	98,134.00	98,134.00
මධ්‍ය පසුඇන්ද සහිත විධායක පුටු	5	33,750.00	33,750.00
කළු ආවරණය සහිත විධායක පුටු	8	44,266.50	44,266.50
LP කණිෂ්ඨ විධායක මේස	3	23,935.50	23,935.50
ගැලපිය හැකි රාක්ක 3ක් සහිත එහා මෙහා කළ හැකි කැබිනට්	9	50,139.00	50,139.00
රෙදි අත් පුටු	8	22,500.00	22,500.00
Cpu & Ups සඳහා එහා මෙහා කළ හැකි කැබිනට්	3	10,147.50	10,147.50
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ තබන රාක්ක	1	6,826.50	6,826.50
ආරක්ෂිත පෙට්ටි	2	2,500.00	2,500.00
ස්විචි බෝඩ්	1	10,746.00	10,746.00
රාක්ක	20	1,417,679.02	1,417,679.02
බංකු ඇඳ	4	29,300.00	29,300.00
මෙට්ට	8	16,776.80	16,776.80
පහත් ඇන්ද සහිත පුටු	9	41,116.49	41,116.49
විධායක මේස	1	94,453.63	94,453.63
ප්ලාස්ටික් පුටු	24	15,175.63	15,175.63
වානේ කබඩ්	3	26,836.00	26,836.00
වානේ මේස	4	25,760.00	25,760.00
ලී පුටු	8	15,300.00	15,300.00
වයිට් බෝඩ්	4	6,912.00	6,912.00
කාර්යාල පුටු	4	7,700.00	7,700.00

හිටවන විදුලි පංකා	2	11,700.00	11,700.00
IP Ex. Table 60*30 Curved Top	3	45,885.00	45,885.00
KD Cop.Table (80*48*78)cm Beech	6	42,270.63	42,270.63
ලාච්චු දෙකක් සහිත සයිඩ් රිටර්න්	2	23,978.75	23,978.75
පුවත්පත් කියවන මේස (12" * 2")	3	145,656.00	145,656.00
ලාච්චු 2ක් සහිත එහා මෙහා ගෙන යා හැකි කැබිනට්	3	28,072.49	28,072.49
විධායක පුටු	1	9,975.00	9,975.00
ටෙන්ඩර් පෙට්ටිය	2	8,512.00	8,512.00
ඇමතුම් මධ්‍යස්ථානය- කොන්සෝල මේස සහ පුටු	11	165,103.75	165,103.75
සම්මන්ත්‍රණ පුටු	20	159,600.00	159,600.00
එම්ඩීඑෆ් කාර්යාල මේස 48*24	1	9,000.00	9,000.00
වැඩකරන්නගේ ලොකර්	6	123,292.50	123,292.50
KD අඩ දොර කැබිනට්	13	154,099.35	154,099.35
ඕවල් ටියුබ් පුටු	12	73,031.25	73,031.25
3D හැඟින් පෙඩස්ටල් 1	1	8,420.14	8,420.14
සයිඩ් රිටර්න් මේස 1	1	8,837.72	8,837.72
අමුත්තන්ගේ පුටු 1	18	99,251.44	75,692.07
සයිඩ් රිටර්නි සහිත ලියන මේස පූර්ණ කට්ටලය M 07	1	18,265.62	-
අඩදොර කබඩ් 78Mx37CMx197CMBEECH (M12)	2	28,977.14	-
සාකච්ඡා මේස KDSOO1 තද දුඹුරු	1	13,837.50	-
ෆයිල් රාක්ක - විශාල LF-OX-BR-L	1	8,549.10	-
වානේ කාර්යාල කබඩ් WFL-OFF-CUB	2	26,278.18	-
එකතුව	**534**	**6,577,440.01**	**6,384,267.48**

සටහන 05 - දේපල, පිරියත සහ උපකරණ

උප සටහන - 05:04 මෝටර් වාහන		**2015.01.01**	වසර තුළ	**2015.12.31**
		දිනට	එකතු කිරීම්/ මාරු කිරීම්	දිනට මුළු
	ප්‍රමාණය	මුළු වියදම		වියදම
		රු. සත.	රු. සත.	රු. සත.
ඩබල් කැබ්	30	230,585,067.58	-	230,585,067.58
විධාන වාහන WPLF 1101	1	20,000,000.00	-	20,000,000.00
මෝටර් ලොරි WPLG 8843	1	3,806,137.00	-	3,806,137.00
ලැන්ඩ් කෲසර් ජීප් KI 4666	1	19,500,000.00	-	19,500,000.00
හයි ඒස් වෑන්	2	13,028,162.40	-	13,028,162.40
යතුරු පැදි	1	59,500.00	-	59,500.00
පාපැදි	1	8,185.00	-	8,185.00
JCB යන්ත්‍ර	1	5,475,000.00	-	5,475,000.00
ජල බවුසර්	1	5,000,000.00	-	5,000,000.00
ක්‍රමක්ෂය එක් කිරීම්/ආයෝජන.	-	-	-	-
එකතුව	**39**	**297,462,051.98**	**-**	**297,462,051.98**

2015 සඳහා ක්ෂය වීම්

ඩබල් කැබ්	6,946,213.57
මෝටර් ලොරි WPLG 8843	634,356.60
ලැන්ඩ් කෲසර් ජීප් KI 4666	3,249,999.60
හයි ඒස් වෑන්	2,605,632.48
වාහනවල සමස්ත ක්ෂය වීම්	**13,436,202.25**

මිලදී ගත් වර්ෂය තුළ භාවිත වන වත්කම් සඳහා වියදම පදනම් කරගෙන සෘජුරේඛා ක්‍රමය යටතේ ක්ෂයවීම් ඉදිරිපත්කර තිබේ. ICET ව්‍යාපෘතිය යටතේ ලබාදුන්/ ඉදිකළ වත්කම්වල ක්ෂයවීම් ගණනය කිරීම ඒවා ලැබීම/ ඉදිකිරීම නිමවූ වර්ෂයට පසු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කර තිබේ.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් - 2015 **උප සටහන 05:05**

සටහන 05 - දේපල, පිරියත හා උපකරණ

උප සටහන - 05:05 පරිගණක අයිතම		**Cost as at 12.31.2015**	**Cost as at 12.31.2014**
<u>පරිගණක සහ උපාංග</u>		**Rs. Cts.**	**Rs. Cts.**
නෝට්බුක්	97	12,727,768.19	12,475,768.19
ඩෙස්ක්ටොප්ස්	143	71,701,636.76	71,701,636.76
යූපීඑස්	106	761,497.21	761,497.21
ලේසර් ජෙට් ප්‍රින්ටර්	39	945,597.75	932,097.75
ස්කෑන් යන්ත්‍ර	3	269,950.00	269,950.00
පෙන් ඩ්‍රයිව්	38	62,700.00	62,700.00
මොඩම්	1	2,850.00	2,850.00
යූපීඑස් බැටරි	6	13,923.84	13,923.84
භාණ්ඩලේඛණ පාලන පද්ධති	1	49,000.00	49,000.00
රවුටර්	1	9,790.00	6,770.00
සීඩී පද්ධති	21	367,500.00	367,500.00
ලේසර් ජෙට් වර්ණ ප්‍රින්ටරය	20	546,900.00	546,900.00
ඉන්ක් ජෙට් ප්‍රින්ටරය	6	430,500.00	430,500.00
ඩොට් මෙට්‍රික් ප්‍රින්ටරය	1	65,000.00	65,000.00
බහුකාර්යය ප්‍රින්ටරය	1	61,040.00	61,040.00
අන්තර්ජාල ඩොන්ගල්	1	3,257.10	3,257.10
දෘඩ තැටි	6	146,500.00	146,500.00

E	1	29,000.00	-
සැමසුන්ග් ගැලැක්සි නෝට් 11 ටැබ්	2	118,000.00	-
ලේසර් ජෙට් ප්‍රින්ටරය HP P1102	10	135,000.00	-
			-
එකතුව	**487**	**88,447,410.85**	**87,896,890.85**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015

සටහන 06 - කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ව්‍යාපෘති ආරම්භ කොට පවත්වාගෙන යාම සඳහා අක්මුදල් පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස නිදහස් කර ඇති එහෙත් 2015 දෙසැම්බර් 31 දිනවන විට තවමත් අවසන් කර නැති ව්‍යාපෘති කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස හැඳින්වේ. මෙම ව්‍යාපෘතිවල වටිනාකම් 2015 කාරක ප්‍රාග්ධන ලැයිස්තුවට මාරු කර තිබේ.

ව්‍යාපෘතිවල විස්තර පහත පරිදි වේ;

සංඛ්‍යාව	ව්‍යාපෘතිය	ස්වාභාවය	දිස්ත්‍රික්කය	**ප්‍රතිපාදන**	**සම්පූර්ණ ගෙවීම**
				රු. සත.	රු. සත.
1.පුනරුත්ථාපනය	රම්බාවවන් ඇල	ගංවතුර	අනුරාධපුර	5,539,747.50	5,539,747.50
2.පුනරුත්ථාපනය	හල්ම්බරාවැව	නියඟය	හම්බන්තොට	3,000,000.00	3,000,000.00
3.ඉදිකිරීම්	බෝක්කු අත්තනයාය	ගංවතුර	හම්බන්තොට	4,998,000.00	4,998,000.00
4.වැටියෙගෙදර	අමුණ - ප්‍රතිසංස්කරණ	නියඟය	කුරුණෑගල	27,605,000.00	27,605,000.00
5.ඉදිකිරීම්	අමුණු පන්නල	ගංවතුර	කුරුණෑගල	225,000.00	225,000.00
6.ඉදිකිරීම්	පල්ලෙකැලේ පැති බැම්	ගං වතුර	කුරුණෑගල	1,362,044.58	1,362,044.58
7.ප්‍රතිසංස්කරණය	ජලාපවාහන පද්ධතිය	යටිතල පහසුකම්	කුරුණෑගල	27,720,581.98	27,720,581.98
8.ප්‍රතිසංස්කරණ	මෙමල්පිටිට ඇල	නියඟය	මාතලේ	1,127,058.00	1,127,058.00
9.දඹුල්ල	ගං වතුර අවම කිරීම අදියර III	ගංවතුර	මාතලේ		37,000,000.00
10.ඉදිකිරීම්	මාමඩුව පාලම	ගංවතුර	වව්නියාව	6,000,000.00	4,554,477.10
11ඉදිකිරීම්	නාවලපිටිය බෝක්කු	ගංවතුර	මහනුවර	20,000,000.00	20,000,000.00

12.අකුරණ	ගංවතුර අවම කිරීම අදියර 11	ගංවතුර	මහනුවර	22,900,000.00	22,900,000.00
13 ඉදිකිරීම්	අඹන්ගඟ පැති බැම්ම	ගංවතුර	පොළොන්නරුව	18,831,175.74	18,831,175.74
14 ප්‍රතිසංස්කරණය	දිවලංකඩවල වැව	ගංවතුර	පොළොන්නරුව	1,500,000.00	1,500,000.00
15. ප්‍රතිසංස්කරණය	කුඹුක්ගැටේ අමුණ	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
16. ප්‍රතිසංස්කරණය	අලුත්වැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
17. ප්‍රතිසංස්කරණය	පලුගස්වැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
18. ප්‍රතිසංස්කරණය	සියඹලාගස්වැව	ගංවතුර	පොළොන්නරුව	1,800,000.00	1,800,000.00
19.ප්‍රතිසංස්කරණය	ඇත්දත්වල අමුණ	ගංවතුර	පොළොන්නරුව	1,800,000.00	1,800,000.00
20. ප්‍රතිසංස්කරණය	නෙළුම්වැව අමුණ	ගංවතුර	පොළොන්නරුව	1,800,000.00	1,800,000.00
21. ප්‍රතිසංස්කරණය	දඹගහවැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
22. ප්‍රතිසංස්කරණය	අඹලෙලි වැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
23.ප්‍රතිසංස්කරණය	හල්මිල්ල වැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
24. ප්‍රතිසංස්කරණය	පාලුවැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
25. ප්‍රතිසංස්කරණය	දියබෙදුම වැව	ගංවතුර	පොළොන්නරුව	2,000,000.00	2,000,000.00
26. ප්‍රතිසංස්කරණය	කවුඩුල්ල වන් ඇල	ගංවතුර	පොළොන්නරුව	4,907,000.00	4,907,000.00
27.ඉදිකිරීම්	කිරිමැටියාව පාලම	ගංවතුර	පොළොන්නරුව	1,220,352.38	1,220,352.38
28. ඉදිකිරීම්	කාණු පද්ධතිය	ගංවතුර	පුත්තලම	5,900,000.00	5,900,000.00
29. ඉදිකිරීම්	බෝක්කු සහ කාණු	ගංවතුර	පුත්තලම	4,112,318.90	4,112,318.90
30. ඉදිකිරීම්	බෝක්කු සහ කළපු	ගංවතුර	පුත්තලම	8,158,000.00	7,084,622.00
	එකතුව			**186,506,279.08**	**203,166,796.20**

2014 දෙසැම්බර් 31 දිනට ශේෂය

වසර තුළ කරන ලද එකතු කිරීම්

2015 දෙසැම්බර් 31 දිනට ශේෂය

සටහන 07 - තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ

අයිතමය	2015 ප්‍රමාණය	2015 මුළු එකතුව රු. සත.	2014 ප්‍රමාණය	2014 මුළු වටිනාකම රු. සත.
දම්වැල් කියත	50	3,857,250.00	9	726,184.04
ජීවිතාරක්ෂක කබා	189	500,850.00	2187	5,795,550.00
බෝට්ටු එන්ජින්	11	3,388,000.00		
බෝට්ටු (බඳ)	11	2,007,500.00		
ආ.ක.ම .හඳුනාගැනීමේ කබා	2997	1,483,515.00	3721	1,841,895.00
වතුර පොම්ප 2	-	-	-	-
වතුර බව්සර	-	-	-	-
ට්‍රෙලර් සහිත ට්‍රැක්ටර්	-	-	1	1,342,880.00
සයිරන් සහිත මෙගා ෆෝන්	-	-	11	44,000.00
විදුලි සයිරන්	-	-	-	-
අතින් ක්‍රියා කරන සයිරන්	241	5,885,220.00	-	-
වර්ෂාමාපක	-	-	6	11,334.00
ට්‍රැක්ටර් මවුන්ටඩ් බවුසර්	-	-	3	1,713,600.00
මන්නාකැනි	10	6,328.05	20	12,656.00
සෙවීමේ සහ බේරාගැනීමේ කඹ	-	-		
සෙවීම සඳහා යොදාගන්නා විදුලි පහන්	67	105,860.00	98	154,840.00
බෝට්ටු ගෙන යන ට්‍රෙලර් Modl Nu-SH 718 BT	-	-		
කට්ටුමරන්	50	6,637,500.00		
පී ඒ පද්ධති UNHABITAT	-	-		
පී ඒ පද්ධති UNHABITAT	-	-	-	-
වැය ශීර්ෂ 7 යටතේ මිලදී ගත් ගම් බූට්	3000	3,862,800.00		
විදුලිජනක යන්ත්‍ර	1	38,080.00	24	913,920.00
එන්ජින් සහිත බෝට්ටු	-	-		.

බෝට්ටු ගෙන යන ට්‍රේලර්	-	-	1	212,000.00
අත් සයිරන් UNHABITAT	-	-	8	269,149.44
වතුරපොම්ප BGVSP 2' SP	5	155,400.00	5	155,400.00
ආ.ක.ම .හඳුනාගැනීමේ කඹා UNDP	2000	990,000.00	-	-
බේරාගැනීමේ බෑගය	2410	3,976,500.00	-	-
වතුර ටැංකිය 1000 l	100	811,400.00	-	-
මුළු වටිනාකම		**33,706,203.05**		**13,193,408.44**

වසර ආරම්භයේදී ආපදා ප්‍රතිචාර උපකරණ තොගය රු. 13,193,408.44 වූ අතර වසර එම අයිතම බෙදාහරින ලද නිසා එය රු.10,903,375.44ක් වටිනා ආපදා ප්‍රතිචාර උපකරණ තොග වියදම් සඳහා මාරු කරන ලදී. එසේම එය 2015 වසරේදී රු.මිලියන 47ක වටිනා ආපදා ප්‍රතිචාර උපකරණ මිලදී ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015	2015 රු. සත.	2014 රු. සත.
සටහන 08 - භාණ්ඩලේඛන		
ලිපිද්‍රව්‍ය	271,004.66	363,807.40
පරිගණක ටෝනර් සහ කාට්රිජ්	685,630.00	1,222,738.00
පත්‍රිකා	58,000.00	65,250.00
පොත්පිංච	966,420.00	342,150.81
ටයර්	504,452.90	873,073.18
වෙනත්	88,500.00	20,926.00
මුළු එකතුව	**2,574,007.56**	**2,887,945.39**

සටහන 09 - පූර්වගෙවීම් සහ අත්තිකාරම්	**රු. සත.**	**රු. සත.**
අත්තිකාරම්– උත්සව	303,500.02	202,000.02
අත්තිකාරම්– UNDP	-	153,400.00
අත්තිකාරම් – මුද්දර	18,910.70	18,910.70
අත්තිකාරම් - සාක් අවශ්‍යතා තක්සේරු වැඩසටහන	-	151,349.90
පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු සඳහා පෙර ගෙවුම්	75,000.00	6,858,436.05
අත්තිකාරම්- මුදල් - ප්‍රධාන කාර්යාලය	298,743.95	69,285.00
සූදානම් වීම සහ සැලසුම්- ප්‍රධාන කාර්යාලය	8,750.00	-
පුහුණු වීම් - ප්‍රධාන කාර්යාලය	0.49	-
අත්තිකාරම් - ඉන්ධන - ප්‍රධාන කාර්යාලය	2,060.00	2,060.00
අත්තිකාරම්- සේවා සහ නඩත්තු ප්‍රධාන කාර්යාලය	1,315,569.80	302,192.52
අත්තිකාරම් - දිස්ත්‍රික්කවල සූදානම් වීම සහ සැලසුම්	431,529.57	426,247.00
අත්තිකාරම්- දිස්ත්‍රික්කවල පුහුණු සහ දැනුවත් වීමේ වැඩසටහන්	223,898.34	322,931.84
අත්තිකාරම්- ඉන්ධන දිස්ත්‍රික්ක	22,984.00	557,154.70
අත්තිකාරම් - දිස්ත්‍රික්ක - සේවා සහ ගාස්තු	205,367.50	205,367.50
	2,906,314.37	**9,269,335.23**

සටහන 10 - තැන්පත් සහ අනෙකුත් ලැබිය යුතු දෑ	**රු. සත.**	**රු. සත.**
ඩොන්ගල් මත තැන්පතු	3,000.00	3,000.00
තැන්පතු - ලංකා විදුලි බල මණ්ඩලය	1,108,500.00	1,108,500.00
තැන්පතු- ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය	51,500.00	51,500.00
වෙනත් ලැබියයුතු දෑ	560,808.72	272,163.62
	1,723,808.72	**1,435,163.62**

සටහන 11 - මුදල් සහ මුදල් තුල්‍යන්	**රු. සත.**	**රු. සත.**
ලංකා බැංකුව – 2744646	23,464,131.47	5,714,298.77
අතැනි මුදල්	56,155.25	41,155.25
	23,520,286.72	**5,755,454.02**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015	2015	2014
සටහන 12 -ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	**රු. සත.**	**රු. සත.**
ප්‍රාග්ධන වියදම්		
ධාරිතා වර්ධනය- මානව සම්පත් සංවර්ධන	2,115,113.04	499,400.00
කුරුණෑගල, මාතර, හම්බන්තොට, කළුතර, මාතලේ,මුලතිව් සහ බදුල්ල දිස්ත්‍රික්කවල මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීම් ව්‍යාපෘති	367,101,455.22	481,377,157.45
දිස්ත්‍රික්කවල කුඩා ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	-	-
හදිසි අවස්ථාවන්හිදී ආරක්ෂිත ඉවත් කිරීම්	19,309,427.21	49,717,934.57
හදිසි ගං වතුර තත්ත්වයන් සඳහා උපකරණ මිලදී ගැනීම් (DMC)	52,265,991.99	77,565,002.56
සූදානම් වීමේ සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය නියෝජිතායතනවලට සහාය දීම (DMC)	10,895,758.24	9,986,973.37
ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණයේ ධාරිතා වර්ධනය -UNDP (DMC)	-	-
පානදුර කළුතර ප්‍රා. ලේ. බල ප්‍රදේශය තුළ ගංවතුර පාලනය	35,000,000.00	45,000,000.00
දඹුල්ල ප්‍රා. ලේ. බල ප්‍රදේශය තුළ ගංවතුර පාලනය	5,000,000.00	20,000,000.00
යාපනය දිස්ත්‍රික්කයේ ගං වතුර පාලනය	23,000,000.00	50,000,000.00
දැනුවත් කිරීම්	8,663,038.57	11,851,325.69
පූර්ව දැනුම් දීමේ පද්ධතිවල ධාරිතා වර්ධනය - UNHABITAT	284,149.44	4,552,957.50
පූර්ව දැනුම් දීමේ පද්ධතිවල ධාරිතා වර්ධනය - UNHABITAT අදියර II	1,687,930.82	2,121,170.50
හදිසි අවස්ථාවන්හිදී ආරක්ෂිත ඉවත් කිරීම්	-	-
ප්‍රාග්ධන ප්‍රදාන මත දළ ආයෝජන	**525,322,864.53**	**752,671,921.64**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015	2015	2014
	රු සත.	රු. සත.
සටහන 13 - වෙනත් සංවිධානවලින් ලැබෙන ප්‍රදාන		
UNDP	966,420.00	151,171.49
ADPC	1,405,242.30	1,405,242.30
CSE	420,785.81	420,785.81
රුකුකුරුස	-	1,332.48
SAARC අවශ්‍යතා තක්සේරු වැඩසටහන	501,323.10	-
UNDP ආරක්ෂකදිනය සඳහා	38,320.00	1,028,320.00
තොරතුරු තාක්ෂණය සම්බන්ධ උපකරණ වායු සමීකරණ	37,770.22	37,770.22
UNHABITAT	-	259,112.91
Ministry of DM for DeyataKirula	120,672.92	-
UNHABITAT අදියර II	109,475.68	39,680.06
NEOP සඳහා UNDP	1,724,792.50	419,000.00
ADPC ආරක්ෂක දිනය	90,203.85	90,203.85
SAARC FOR Workshop	1,264,594.00	1,264,594.00
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා China CAMC Engineering Co, Ltd	2,000,000.00	-
IDMP සඳහා UNDP	1,500,000.00	-
RSSDP සඳහා UNDP	1,000,000.00	-
SFDRR සඳහා UNDP	1,300,000.00	-
DOSEG සඳහා UNDP	1,500,000.00	-
ප.පා.ආ. වල ආ.අ.අ ධාරාගතකිරීම සඳහාUNDP	1,000,000.00	-
	14,979,600.38	**5,117,213.12**

සටහන 14 - විශ්‍රාමික ප්‍රතිලාබ බැඳීම්

	2015	**2014**
	රු. සත.	**රු. සත.**
2015 ජනවාරි 01 දිනට ශේෂය	**12,474,738.75**	9,068,095.63
වසර සඳහා ප්‍රතිපාදන	8,936,348.13	3,530,994.37
ගෙවීම්	236,901.25	124,351.25
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**21,174,185.63**	**12,474,738.75**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගිණුම්වල විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර මූල්‍ය වර්ෂයේ අවසන් මස ගත් වැටුපෙන් අඩක අගය ආපදා කළමානකරණ මධ්‍යස්ථානයේ සේවය කළ වසර ගණනට අනුව ගණනය කරනු ලැබේ. මෙම අයිතමය විලම්බිත වගකීම් යටතේ කාණ්ඩ කර තිබේ. මෙම ප්‍රතිපාදනයට බාහිර මූල්‍යකරණයක් හෝ ආයුගණක ලෙස ගණනය කිරීමක් කර නැත.

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව - ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති සේවක ප්‍රතිලාභ ප්‍රමිති සම්බන්ධයෙන් 57 ඡේදය සහ 'ඩී' පරිශිෂ්ට තුළ විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන සැලසීමට නිර්ණායක සකස් කර ඇති අතර ඒ අනුව යම් ආයතනයකට සේවකයන් 100කට වැඩි කාර්ය මණ්ඩලයක් සිටියි නම් 'ඊ' පරිශිෂ්ටයේ ලබා දී ඇති උපදෙස් පිළිපැදිය යුතුය. පරිශිෂ්ටය 'ඩී' (2) තුළ භාණ්ඩ අලෙවිය හෝ සේවා සැපයීම සම්බන්ධ රාජ්‍ය සංස්ථා ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2015	2015	2014
	රු. සත.	රු. සත.
සටහන 15 - වෙනත් ගෙවියයුතු දෑ		
ගබඩා භාරකරු ආරක්ෂක තැන්පතු	3,600.00	3,600.00
ටෙන්ඩර් තැන්පත් – ප්‍රතිපූරණය කළ හැකි	145,000.00	145,000.00
ගෙවිය යුතු වැටුප් සහ පඩි	72,736.47	-
අතිකාල ගෙවිය යුතු	348,022.11	449,593.71
ප්‍රවාහන වියදම් ගෙවිය යුතු	180,498.40	479,270.95
ගෙවිය යුතු කුළී සහ දේශීය බදු	31,500.00	68,000.00
තැපැල් සහ සන්නිවේදන	676,353.09	729,188.22
ගෙවිය යුතු විදුලිය සහ ජලය	837,292.48	965,699.22
ගෙවිය යුතු වෙනත් සේවා	205,503.38	408,008.00
වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු තැන්පතු	-	8,345.71
සොෆ්ට්ලොජික් රිටේල් පුද්ගලික සමාගම	-	89,999.00
	2,500,505.93	**3,346,704.81**

සටහන 16 - වෙනත් ප්‍රතිපාදන	රු. සත.	රු. සත.
තොග අහිමි වීම සඳහා ප්‍රතිපාදන	206,011.56	206,011.56
	206,011.56	**206,011.56**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒඑමජී/ඒ/ඩිඑමසි/1/15/10 මෙම අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 16 දින

අධ්‍යක්ෂ ජනරාල්,

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා වාසන කළමනාකරණ පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වියවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංරගිප්‍ර) වලට අනුකූල වීම.

ශ්‍රීලංරගිප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ - පෙර වර්ෂයන් තුළදී රු.මිලියන 278 ක පිරිවැයකට මධ්‍යස්ථානය විසින් ප්‍රසම්පාදනය කරන ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රමිතියේ 65 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ සමාලෝචනය කිරීමෙන් තොරව හා වෙනස්කම් ගිණුම් ගත කිරීමෙන් තොරව භාවිතා කරමින් පැවතුණි.

2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 5.28 ක පිරිවැයට 2013 හා 2014 වර්ෂවලදී ප්‍රසම්පාදනය කරන ලද වත්කම් නඩත්තු පිරිවැය ලෙස සාවද්‍යව ලියා හැර තිබූ අතර මෙම දෝෂය සමාලෝචිත වර්ෂය තුළදී නිවැරදි කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන ඒ අනුව යළි ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආපදා කළමනාකරණය හා අවදානම් අවම කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 18 කට ප්‍රේෂණය කරන ලද රු.මිලියන 18.21 ක මුදලක්, 2015 දෙසැම්බර් 31 වන විටත් එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණද, සම්පූර්ණ කරන ලද වැඩ ලෙස සලකා ඒ අනුව ගිණුම් වලට ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2010 වර්ෂයේදී රු.මිලියන 1,034.39 ක පිරිවැයකට මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, අරමුදල් සපයන ව්‍යාපෘතියක් විසින් වෙන් කරන ලද අරමුදල් යොදා ගනිමින් කෘලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක ඉදිකර තිබුණි. කෙසේ වුවද අදාළ ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළ පරිත්‍යාග ලෙස මධ්‍යස්ථානයට ලැබුණු එන්ජින් සහිත ගලවා ගැනීමේ බෝට්ටු 15 ක්, ලැප්ටොප් පරිගණක 05 ක්, කැමරා 05ක්, මුද්‍රණ යන්ත්‍රයක් හා වෙනත් වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඉ) මධ්‍යස්ථානයට 2016 ජනවාරි මාසයේදී ලැබුණු රු.මිලියන 20.36ක් වටිනා ගම්බූට්ස් 300 ක තොගයක්, අතින් ක්‍රියාකරන සයිරන් 241 ක් හා ප්ලාස්ටික් ජල ටැංකි 100 ක් යන තොග 2015 දෙසැම්බර් 31 දිනට අකැති තොග ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාවද්‍යව දක්වා තිබුණි.

(ඊ) හදිසි ශිල්පීය ක්‍රම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය ව්‍යාපෘතියෙන් (International Centre for Emergency Techniques Project) ලැබුණු රු.මිලියන 1,244 ක ප්‍රදාන, පිටපත් කිරීමේ දෝෂ හේතුවෙන් රු.මිලියන 2.85 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.628,008 ක් වූ ගෙවිය යුතු ගිණුම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඌ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂය සහ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් වටිනාකම් පිළිවෙලින් රු.214,080 කින් හා රු.91,097 කින් අඩුවෙන් දක්වා තිබුණි

2.2.3. පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අත්තිකාරම් ශේෂයන් 04 ක හා අනුරූපි වාර්තාවල දැක්වෙන ශේෂයන් අතරම එකතුවේ රු.371,066 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු හා ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යෝක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) රු.334,588 ක් පිරිවැය වූ ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට අයත් ජංගම නොවන වත්කම් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් වෙනත් විවිධ ස්ථානවල ඉන්වෙන්ට්‍රි ලේඛන කිහිපයක් පවත්වා තිබූ බැවින් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා වෙනත් තොග පිළිබඳ විස්තර විගණනය සඳහා අප්‍රමාදව ලබා ගැනීමට නොහැකි විය.

(ඇ) දිස්ත්‍රික්ක 06 ක පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අදාළව 2015 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 371(5) ට අනුව ලබාදෙන ලද සියලු අත්තිකාරම් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම නිරවුල් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ ලබා දෙන ලද එකතුව රු.මිලියන 2.58 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකර පැවතුණි.

(ආ) මධ්‍යස්ථානයට අයත් මෝටර් වාහන 09ක් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 14ක දී අනතුරුවලට භාජනය වී තිබුණද, මූලික විමර්ශනයන් පිළිබඳ වාර්තා මුදල් රෙගුලාසි 104

ප්‍රකාරව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද එම අනතුරු පිළිබඳ විස්තර මුදල් රෙගුලාසි 110 ට අනුකූලව හානි ලේඛනයක ඇතුළත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 15.76 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.මිලියන 2.62 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු.මිලියන 18.38 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 51.04 කින් වෙනත් ආදායම් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේවුවද, පහත දැක්වෙන පරිදි වූ ගැලපීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඉහත ඌනතාවය රු.මිලියන 49.04 ක අතිරික්තයක් වී තිබුණි.

විස්තරය	මුදල
	රු.මිලියන
වර්ෂය සඳහා ඌනතාවය	(15.76)
එකතු කළා - පාරිශ්‍රමික	59.28
ප්‍රාග්ධන ප්‍රදාන මත ක්ෂය හා ක්‍රම ක්ෂය	5.52
වර්ෂය සඳහා අතිරික්තය/දායකය	49.04

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කුඩා පරිමාණයේ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති 83ක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය සැලසුම් කර තිබුණු අතර මෙම කාර්යය සඳහා රු.මිලියන 505.39 ක මුදලක් රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණි. කෙසේ වුවද ඒ සඳහා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාලනයන්, අධීක්ෂණය හා පසු විපරම් ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත විස්තර කෙරේ.

(i) මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, කුඩා පරිමාණයේ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති 42 කට අදාළ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසානයට ඉටු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන භාගයේදී කාර්යයන් ආරම්භ කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, ප්‍රදේශයේ පැවති සමාජ උද්ඝෝෂණ හා අහිතකර දේශගුණික තත්ත්වයන් වැනි කරුණු කිහිපයක් හේතුවෙන් එම අවම කිරීම් ව්‍යාපෘති සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකි වූ බව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම හා ඒ පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පැවරී තිබුණි. කෙසේ වුවද, අරමුණු කළ කාර්යයන් සඳහා වෙන් කරන ලද අරමුදල් උපයෝජනය පිළිබඳ අධීක්ෂණ පාලනයන් මධ්‍යස්ථානය විසින් ප්‍රමාණවත්ව සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

- දිස්ත්‍රික් මට්ටමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 176.49 ක මුදලක් මුදා හැර තිබුණද, දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ආපදා කළමනාකරණ හා අවම කිරීමේ ව්‍යාපෘති 38 ක් පිළිබඳ වැඩ නිම කිරීමේ වාර්තා 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නොතිබුණි.

- කොන්ත්‍රාත්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමෙන් තොරව රු.මිලියන 191.43 ක් වටිනා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 34 ක් සඳහා කොන්ත්‍රාත්තු බාහිර පාර්ශවයන් සඳහා ප්‍රදානය කර තිබුණි.
- රු.මිලියන 77.90 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 26 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේවුවද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 57.59 ක මුදලක් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට මුදා හැර තිබුණි.

(iii) කුඩා පරිමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද අරමුදල් මධ්‍යස්ථානය විසින් මුදාහැර තිබුණේ සමාලෝචිත වර්ෂය අවසානයේදී බව තවදුරටත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති නිශ්චිත කාලපරිච්ඡේද ඇතුළත ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. රු.මිලියන 52.45 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති 12 කින් ව්‍යාපෘති 11ක් සඳහා පමණක් 2015 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබූ බව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය. ඉතිරි ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ගිවිසුම 2016 ජනවාරි මාසයේදී එළඹ තිබුණි.

(iv) මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීම සඳහා අදාළ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය මත පදනම් ව අරමුදල් මුදා හරිනු වෙනුවට, පරිවයක් වශයෙන්, ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආරම්භක අදියරේදී මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට සම්පූර්ණ මුදල් වෙන් කිරීම් මුදා හරිනු ලැබේ. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පැහැදිලි කිරීමට අනුව සමහර ව්‍යාපෘති සඳහා විශේෂිත අවස්ථාවල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉල්ලීම් කරන ලද පරිදි සම්පූර්ණ වෙන් කිරීම් මුදා හරින ලදී.

(v) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2015 අගෝස්තු මාසයේදී සංශෝධනය කළ බවත්, පෙර ක්‍රියාකාරී සැලැස්ම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 33 ක් සංශෝධිත සැලැස්මෙන් ඉවත් කර තිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීම සඳහා අපේක්ෂා කරන ලද ජලගැලීම් අවම කිරීමේ විශාල ව්‍යාපෘති 03ක් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර, ඉන් යාපනය අර්ධද්වීපයේ ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩ ප්‍රමාණක් සමාලෝචිත වර්ෂය තුළ නිම කර තිබුණි. දඹුල්ල ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 95 ක් ප්‍රමාණක් වෙන් කර තිබුණද, එම කාර්යය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 114.79 ක මුදලක් ප්‍රේෂණය කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය යටතේ වැඩ, 2016 ජූනි 30 දින වන විටත් නිම කර නොතිබුණි. තවද කළුතර ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩ සඳහා රු.මිලියන 139 ක් වූ සම්පූර්ණ වෙන් කිරීම 2015 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් වෙත මුදා හැර තිබුණද, 2016 ජූනි 31 වන විටත් එම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. මේ අතර මෙම ව්‍යාපෘතිය යටතේ කරපන්-ඇල කාණු පද්ධතියේ සංවර්ධන වැඩ 2014 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, රු.මිලියන 16.14 ක පිරිවැයකට සංවර්ධන වැඩ නිම කිරීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණේ 2015 දෙසැම්බර් 01 දින දීය.

(ඇ) මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය විසින් පැවැත්වීම සඳහා සැලසුම් කර තිබූ සිද්ධි විධාන පද්ධතිය (Incident Command System) පිළිබඳ පුහුණු වැඩ මුළුවක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි. තවද, ආපදා පෙර සූදානම් හදිසි ප්‍රතිචාර සැලසුම් (Disaster Preparedness Emergency Response Plans) සංශෝධනය කිරීම සඳහා මධ්‍යස්ථානයේ පෙර සුදානම් සැලසුම් අංශය විසින් පැවැත්වීම සඳහා අපේක්ෂා කර තිබූ වැඩ සටහන් 04 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාදුක්ක පිහිටි තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය හා එහි සවි කරන ලද රු.මිලියන 72.47 ක වටිනා උපකරණ 2011 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. පසුව අදාළ උපකරණ ගලවා 2015 මැයි 15 දින සිට මධ්‍යස්ථාන ගබඩා වල තබා තිබුණි. එබැවින් පෙර වර්ෂවල බරපතල ස්වාභාවික ආපදාවන්ට රට මුහුණ පා සිටියද, සැටලයිට්

තාක්ෂණය යොදාගැනීම මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ ආපදා කළමනාකරණ වැඩ සටහන සඳහා සැලසුම් අත්හැර දමා තිබුණි. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ට අනුව, විධිමත් අධ්‍යයනයකින් තොරව හදිසි ශිල්පීය ක්‍රම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථාන ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලද අතර, මධ්‍යස්ථානය විසින් ස්ථාපිත කරන් ලද අනෙකුත් පද්ධතිවලට එය අනුකූල වී නොතිබුණි. එබැවින් උපකරණ ගලවා කොළඹ මධ්‍යස්ථානයේ ගබඩාවලට ගෙන යෑමට කටයුතු කළ අතර උපකරණ මෙන්ම අනුගමනය කරන ලද තාක්ෂණයද ඒ අනුව අභාවිත විය. තවද තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ හිමිකරු වූ ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් ඔවුන්ගේ කටයුතු සඳහා අදාළ ඉඩම මුදාහරින ලෙස ඉල්ලීමක්ද කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කරන ලද කාර්යයන් රේඛීය ආමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වී නොතිබුණි. රේඛීය ආමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්යයන් 40 ක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ තවත් කාර්යයන් 09ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද මධ්‍යස්ථානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්යයන් 09ක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ කාර්යයන් 04 ක් පමණක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. තවද රේඛීය ආමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාර්යයන් 02 ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් කාර්යයක් පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හා පොළොන්නරු දිස්ත්‍රික්කයේ පිළිවෙලින් කාර්යයන් 13 ක් හා 16 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් සැලසුම් කර තිබුණි.

4.3 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් තනතුරු 266 ක් හා 226 ක් වූයෙන් එදිනට තනතුරු 40 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ තනතුරු වශයෙන් ප්‍රධාන කළමනාකරණ තනතුරු 2011 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවති අතර මධ්‍යස්ථානයේ පහසු ක්‍රියාකාරිත්වය සඳහා එය අයහපත් ලෙස බලපා තිබුණි. මධ්‍යස්ථානයේ බඳවා ගැනීම් හා උසස් වීම් පටිපාටියට අනුව, මධ්‍යස්ථානයේ මානව සම්පත් හා මූල්‍ය හා පරිපාලන කටයුතු මානව

සම්පත් හා මූල්‍ය අධ්‍යක්ෂවරයාගේ විෂය පථය යටතේ පැවති අතර එම තනතුර වර්ෂ 05කට වැඩි කාලයක් පිරවීමෙන් තොරව පැවතුණි. මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කාර්යයන් 2011 වර්ෂයේ සිට සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් ක්‍රියාත්මක කරන බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) මධ්‍යස්ථානයේ බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටියට අනුව, අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක වර්ෂ 15 ක පළපුරුද්දක් අවශ්‍ය වේ. කෙසේවුවද එම පළපුරුද්ද නොමැති පුද්ගලයන් එම තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 ආපදා කළමනාකරණ පනත ස්ථාපිත කිරීම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවස්ථා කළමනාකරණ පනතේ 18 වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද ජාතික ආපදා කළමනාකරණ සභාවේ විෂය පථය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරනු ලැබේ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මධ්‍යස්ථානයට අතිරේක බලතල පැවරීමට හැකිවන පරිදි පනත සංශෝධනය කිරීමට කෙටුම්පත් පනත 2014 ජූනි 16 දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබුණද කෙටුම්පත් පනත, 2016 මැයි 31 වන විටත් අනුමත කර නොතිබුණි.

5.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවස්ථා කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරව හදිසි තත්ත්වයකදී ගලවාගත් පුද්ගලයින් හා දේපල පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ අරමුණින් මධ්‍යස්ථානය විසින් පිළියෙල කරන ලද ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම රටට ඉතා අත්‍යවශ්‍ය වුවද පහත සඳහන් කරුණු හේතුවෙන් එය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(අ) මධ්‍යස්ථානය විසින් ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ආපදා කළමනාකරණ සභාවේ අතුරු කළමනාකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු රජයේ දෙපාර්තමේන්තු 48 කින් රජයේ දෙපාර්තමේන්තු 07 ක අදහස් දැක්වීම්, එම දෙපාර්තමේන්තුවල කාර්යයන් හා වගකීම් මාරු වීම, සැලැස්ම පිළියෙල කිරීම සඳහා සහභාගි වූ නිලධාරීන් වෙනත් දෙපාර්තමේන්තුවලට මාරු කිරීම හා ඒ පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ගවල ප්‍රමාදයන් වැනි විවිධ කරුණු හේතුවෙන් 2016 ජූනි 30 වන විටත් මධ්‍යස්ථානයට ලැබී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් සැලැස්ම 2016 ජූනි 30 වන විටත් අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

5.3 වාහන උපයෝජනය

ප්‍රවාහන ඒකකයෙන් ලැබුණු තොරතුරු අනුව මධ්‍යස්ථානයේ වාහන සංචිතයේ මෝටර් වාහන 39ක් විය. කෙසේ වුවද මෝටර් වාහන 37 ක තොරතුරු පමණක් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන්ව තිබුණි. ඉන් මෝටර් වාහන 07 ක් පමණක් මධ්‍යස්ථානය නමින් ලියාපදිංචි කර තිබූ අතර අනෙකුත් වාහන රේඛීය අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ මෝටර් වාහන පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් මුදල් රෙගුලාසි 756 හි නියමය පරිදි සිදු කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කර තිබුණද, නිලධාරීන් දෙදෙනෙකු පමණක් අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම, වියදම හා වෙනත් මෙහෙයුම් කාර්යයන් වලින් සියයට 30 ක් අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 15 ක විගණන නිරීක්ෂණ පිළිබඳ කළමනාකරණයේ අදහස් දැක්වීම් 2015 දෙසැම්බර් 31 දිනට ලැබී නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබූ අවශ්‍ය ප්‍රමාණයන්ට වැඩියෙන්, ගලවා ගැනීම් මළු, කුඩාරම් හා පිරික්සා බැලීම් උපකරණ වැනි විෂයයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා කටයුතු කර තිබූ බවත්, ඒ සඳහා රු.මිලියන 4.30 ක මුදලක් අතිරේකව වැය කර තිබූ බවත් නිරීක්ෂණය විය. ප්‍රාග්ධන විෂයයන් 10 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 75ක මුදලක් ප්‍රසම්පාදන සැලැස්මේ වෙන් කර තිබූ අතර, 2015 ජූනි 30 ට පෙර එම ප්‍රසම්පාදනයන් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවද එම වත්කම් ප්‍රසම්පාදනය කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි. එබැවින් මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන සැලැස්ම, මූල්‍ය පාලනය පිළිබඳ ඵලදායී උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

	ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ)	ගබඩා කළමනාකරණය	ගබඩාවට භෞතිකව ලැබී නොතිබුණු රු.මිලියන 20.36 ක වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 2015 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.
(ආ)	ගිණුම්කරණය	විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
(ඇ)	අත්තිකාරම් නිරවුල් කිරීම	බාහිර පාර්ශවයන් සඳහා මෙන්ම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයටද ලබා දෙන ලද අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව එම අත්තිකාරම් දීර්ඝ කාලයක් තිහ හිට පැවතුණි.

(ඇ) මානව සම්පත් කළමනාකරණය

විශේෂිත දැනුමක් හා හැකියාවන් සහිත කාර්ය මණ්ඩලයක් නොමැතිව මධ්‍යස්ථානය ක්‍රියාත්මක කර තිබුණි. එබැවින් ආපදා කළමනාකරණය පිළිබඳ මධ්‍යස්ථානයේ අනාගත මානව සම්පත් අභියෝගවලට මුහුණ දීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව මධ්‍යස්ථානය විසින් ක්‍රියාමාර්ග ගත යුතුය.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක ඩීඒමජී/ඒ/ඩීඒඑමසී/1/15/12 හා 2015 ජූනි මස 15 වන දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාළ කරුණු දැක්වීම පහත පරිදි වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07

එකඟ වෙමි .

අදාළ වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින අතර 2016 වසරේදී ඊට අදාළ අගයන් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) එකඟ වෙමි.
මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ශේෂයන් සංශෝධනය කර ඉදිරිපත් කළ යුතුය යන්නට එකඟ වන අතර 4,821,600/= ක් වටිනා උපකරණ නඩත්තු වියදම් ලෙස ලියාහැර නොතිබුණි. එම උපකරණ මිලදී ගැනීම් 2013 වසරේ ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම්වලින් ආයෝජන ලෙස සටහන් අංක 12 මගින් වාර්තා කර ඇත.

(ආ) එකඟ විය නොහැක.
2015 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට සම්පූර්ණ කර නොතිබුණු ව්‍යාපෘති පිළිබඳව ආපදා අවම කිරීමේ අංශය මගින් මූල්‍ය අංශයට ලබාදුන් සියලු විස්තර සටහන් අංක 06 යටතේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඇත.

(ඇ)
2016 වර්ෂය තුළදී මධ්‍යස්ථානය වෙත එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන වෙතින් ලැබී ඇති යතුරු පැදි 12 මධ්‍යස්ථානය වෙත භාරදීම විධිමත් පරිදි සිදුවී නොමැති අතර ඒ අනුව එම යතුරු පැදි මධ්‍යස්ථානය නමින් පවරා ගැනීම ද මේ දක්වා සිදුවී නොමැත. මෙම වාහන පැවරීමට අදාළව මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ එම්.ටී.ඒ. 6 සහ එම්.ටී.ඒ.8 පෝරම මධ්‍යස්ථානය වෙත ලැබී ඇතත් යතුරු පැදි 04 ක එම පෝරම හා ලියාපදිංචි සහතික මෙම මධ්‍යස්ථානයේ නොමැති බවට ද කරුණු අනාවරණය වී ඇත. පැවරීමට අදාළ ලිපි ලේඛනවල පවරන්නා විසින් මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත යැවිය යුතු පිටපත සහ පවරන්නා සන්තකයේ තබාගත යුතු පෝරමය හැර සෙසු පෝරම යතුරු පැදි 08කට අදාළව පවතින බව මුදල් අංශය වෙතින් දැනගන්නට ලැබී ඇති අතර එම පෝරම දින සහිතව අත්සන් තබා ඇත. ඒ අනුව මෙම යතුරු පැදි පැවරීමට අදාළ ලිපි ලේඛන අත්සන් කර මේ වන විට වසර 06 ක පමණ කාලයක් ගතවී ඇත.

මෝටර් වාහනයක් පැවරීමට අදාළ ලිපි ලේඛන අත්සන් කර දින 14ක් තුළ ඊට අදාළ පැවරීමේ කටයුතු අවසන් කළ යුතු වන අතර එසේ දින 14ක් ඉක්මවීමෙන් අනතුරුව එක් දිනක් වෙනුවෙන් රු.100.00 දඩ මුදලක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සාමාන්‍ය නීතිය වේ. ඒ අනුව මෙම යතුරු පැදි වර්තමානයෙදී පවරාගනු ලබන්නේ නම් එක් යතුරු පැදියක් වෙනුවෙන් රු.200,000.00කට පමණ අධික මුදලක් දඩ වශයෙන් මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු වනු ඇත. මෙම යතුරු පැදි බොහොමයක් භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින බවත් ඒ හේතුවෙන් ඒවා භාවිතයෙන් ඉවත්කර දිස්ත්‍රික් කාර්යාලවල පවතින බවට ද කරුණු සොයා බැලීමේදී අනාවරණය වී ඇත. මෙම තත්ත්වය මත එකී යතුරු පැදි සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර් කාලීන කළමනාකරණ කමිටුව වෙත කරුණු වාර්තා කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) එකඟ වෙමි.

අදාළ නිවැරදි කිරීම් 2016 වසරේදී සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) එකඟ වෙමි.
ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවට අයිතිව තිබූ සියලුම වත්කම් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සතුවන බැවින් ඒ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් විමසීමෙන් නිවැරදි තොරතුරු ලබාගතහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

(ඊ) එකඟ වෙමි.
සටහනේ අදාළ තොරතුරු නිවැරදි නොවුව ද ශේෂ පත්‍රයේ නිවැරදිව සටහන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(උ) එකඟ විය නොහැක.
මධ්‍යස්ථානයේ වත්කම් ක්ෂය ගණනය කිරීමේ ප්‍රතිපත්තියට අනුව වත්කම් මිලදී ගත් / අත්පත් කරගත් වර්ෂය සඳහා ක්ෂය ගණනය නොකරයි. ඒ අනුව ගිණුම් ප්‍රකාශනයේ සටහන් අංක 05 මගින් නිවැරදිව ක්ෂය ගණනය කර ඉදිරිපත් කර ඇත.

(ඌ) එකඟ වෙමි.
උපචිත පදනම අනුව ගිණුම් තැබීම සඳහා වසර අවසානයේ ගෙවිය යුතු වියදම් හැකි පමණ ගිණුම්කරණ පද්ධතිය තුළම ගෙන ඇත. නමුත් මෙවැනි ආයතනයක දිස්ත්‍රික් මට්ටමේ ගනුදෙනු සම්පූර්ණයෙන් උපචිත පදනමට ග්‍රහණය කිරීම සීමිත කාලයක් තුළ කර ගැනීම අපහසු කටයුත්තකි. එම නිසා වර්ෂය අවසාන දින 15කට පමණ අදාළ වන ඉන්ධන වියදම්, ආරක්ෂක කටයුතු සඳහා වන වියදම් හා පිරිසිදු කිරීමේ කටයුතු සඳහා වන වියදම් මෙම වටිනාකම තුළ අන්තර් ගත වී ඇති අතර එම සියලු වියදම් වර්ෂය අවසන් වී දින කිහිපයක් තුළ මුළුමනින්ම ගෙවා දමා ඇත.

(එ) එකඟ වෙමි.
2013 වර්ෂයේදී ක්‍රමාක්ෂය ගණනය කිරීමේ ඇති වූ දෝෂයක් හේතුවෙන් එම වෙනස ඇති වී තිබෙන අතර එය 2016 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

(ඒ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල හා ඉඩම මධ්‍යස්ථානයට පවරා ගැනීමට අදාළ කැබිනට් පත්‍රිකාව කෙටුම්පත් කර ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඔ) එකඟ වෙමි.

2015 මූල්‍ය වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු නිමකර මිලදී ගැනීම් ඇනවුම් නිකුත්කර තිබූ අදාළ භාණ්ඩ හා උපකරණ පරීක්ෂා කර බලා අදාළ ගෙවීම් කර තිබේ. එසේ මිලදී ගත් උපකරණ 2016 වර්ෂයේදී ඇති වූ හදිසි ගංවතුර තත්වයට මුහුණදීම සඳහා යොදාගෙන තිබේ. එම අවස්ථාවේදී ඒවා මිලදීගෙන නොතිබුණි නම් එසේ භාවිතාකළ නොහැකිවනු ඇති බවද කාරුණිකව දන්වා සිටිමි.

(ඕ) එකඟ වෙමි.
මෙම භාණ්ඩ හා උපකරණ අතර භාවිතා කරන ලද ඒවාද ඇතුළත් වන අතර ඒවායෙහි අගය තක්සේරු කර ගිණුම්ගත කළ යුතුව ඇත. අනෙකුත් භාණ්ඩවල අගයන් ගිණුම්ගත කිරීම සඳහා අදාළ පිරිවැය ලබාගත නොහැකිවූ බැවින් ගිණුම් ගත කළ නොහැකි විය. එනමුත් එම භාණ්ඩ හා උපකරණවල අගය 2016 වසරේදී ලබාගැනීමට කටයුතු කර ගිණුම්ගත කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ක) එකඟ විය නොහැක.
ශේෂ පත්‍රයේ සටහන් අංක 13 යටතේ ඉදිරිපත් කර ඇති රු. 14,979,600 ක් වන අගය නිවැරදි වන අතර ආයතනයේ ලෙජර් ගිණුම්වලින් එය පැහැදිලිව තහවරු කර ගත හැකිව තිබේ. තවද වෙනත් සංවිධානවලින් වර්ෂය තුළ ලැබීම්වලින් අදාළ වර්ෂය තුළ වැය කර ඇති මුදල් සටහන් අංක 4 මගින් වෙනත් වියදම් ලෙස ඉදිරිපත්කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) 2015 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දී ඇත්තේ 2015 වර්ෂයේ මැයි මාසයේ බැවින් මුල් මාස හය තුළ සැලසුම් කළ වැඩසටහන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් 2014 වර්ෂයේ ඉතිරි වූ මුදල්වලින් කොළඹ , රත්නපුර සහ යාපනය දිස්ත්‍රික්කවල දින 100 ජාතික වැඩසටහන් යටතේ මූල්‍ය ප්‍රතිපාදන යොදවා ගෙන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව එහි ප්‍රගතිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර් කළමනාකරණ කමිටුව වෙත ද වාර්තා කර ඇත.

(ආ) හදිසි මෙහෙයුම් මැදිරියේ කාර්යයන් ලෙස, ඇතිවන හදිසි ආපදා සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි. 2015 වසරේදී සිදුවූ සියලු ආපදා හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම සියලු කරුණු හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් නිකුත් කරන දෛනික තත්ත්ව වාර්තාවන්හි ඇතුළත්වී ඇත. මීට අමතරව 2015 වසර සඳහා ප්‍රගති වාර්තාව තුළ හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදුකළ කාර්යයන් ඇතුළත් කර ඇත.

(ඇ) එකඟ නොවෙමි.
පොදු 35 ආකෘතිය මගින් රු.168,000 මුදලක් චෙක්පත් අංක - 006106 - 09/09/2015 OSAKA IT වෙත ගෙවීම් සිදුකර ඇත. මුදල් ගෙවූ බව සනාත කිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන ගොනුගත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.4 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 104 මුදල් රෙගුලාසි 110

වාහන අනතුරු සම්බන්ධ අදාළ වාර්තා සම්පූර්ණ කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

(ii) මුදල් රෙගුලාසි 371 (5)
එකඟවෙමි.
මෙම අත්තිකාරම් මුදල් වර්ෂය අවසන් වී මාසයක් ඇතුළත පියවා ඇති අතර එම අත්තිකාරම් පියවීම ප්‍රමාදවීමට හේතුවී ඇත්තේ භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රමාදවී ලබාදීම නිසා දිස්ත්‍රික්කවලට අත්තිකාරම් මුදල් ප්‍රමාදවී ලබාදීම නිසාය. ඉදිරියේදී අත්තිකාරම් මුදල් අදාළ කාලය තුළ පියවා දැමීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(iii) මුදල් රෙගුලාසි 757 (1) (අ) සහ (ආ)
එකඟ වෙමි.
භාණ්ඩ ලේඛන පොත තුලනය කර ඇත. එමෙන්ම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් ශේෂයන් සමීක්ෂණයට ලක්කර නිවැරදි බවට තහවුරු කර ඇති බව ද කාරුණිකව දන්වා සිටින අතර ඉදිරියේදී ගබඩා භාර නිලධාරියා විසින් ද සහතික කර ඔහුගේ අත්සන ද තැබීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

2.5 නොසැසඳු ගිණුම්

(අ) එකඟ විය නොහැක.

2.5 (අ) යටතේ i, ii, iii හා iv වශයෙන් දැක්වෙන අත්තිකාරම් ගිණුම්හි අවසන් ගිණුම් අනුව ශේෂයන් ලෙජරය අනුව ශේෂයන් හා එකඟ වන බව කාරුණිකව දන්වා සිටිමි.

ගිණුම්කරණ ලෙජරය පරිගණක ගත පද්ධතියක් වන අතර අවසාන ගිණුම් ඒ අනුව පිළියෙළ කර ඇත. විගණනයට අවශ්‍ය සියලු මුල්‍ය තොරතුරු මෙම පද්ධතිය මගින් ලබාගත හැකි බව කාරුණිකව දන්වා සිටින අතර ගිණුම්කරණ ලිපිකරුවන් ඔවුන්ගේ පහසුව තකා ලිඛිත ලේඛන ද පවත්වාගෙන යනු ලබන බවද දන්වා සිටිමි. එමෙන්ම අත්තිකාරම් සම්බන්ධ මෙම ලිඛිත ලේඛන සිහිවටන පදනමින් පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛන නුදුරු අනාගතයේදී භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කෙරේ.

(ආ) එකඟ වෙමි.
මූලතිව්, මඩකලපුව හා මන්නාරම දිස්ත්‍රික්කවලට අදාළ වියදම් වාර්තා ගෙන්වාගෙන 2016 වසරේදී අදාළ පියවීම් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) එකඟ නොවෙමි.

රු.560,809/=න් රු 256,568.87ක් කේ.විමලරාජා මහතාගෙන් අයකරගත යුතුය. ලැබිය යුතු රු. 168,645.10 සම්බන්ධයෙන් 5.3 (ඇ) යටතේ පිළිතුරු සපයා ඇත. රු. 120,000/= ක් PB 9379 කැබ් රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් කේ. ජී. එම්. ජගත් මහතාගෙන් ලැබිය යුතුය. ඉන් රු.20,000/=ත් 2016 මැයි 12 දින රිසිට් අංක RCT 244 පියවා ඇත. ඉතිරි මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ලිඛිතව ඔහු වෙත ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) එකඟ වෙමි.

2016 වසරේ සිට මුල්‍ය ප්‍රකාශවල අදාළ හෙළිදරව් කිරීම සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) එකඟ වෙමි.

2016 වසරේ සිට මුල්‍ය ප්‍රකාශවල අදාළ හෙළිදරව් කිරීම සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) <u>සුළු පරිමාණ ව්‍යාපෘති</u>

සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික්ක 23ක් සඳහා ව්‍යාපෘති 83ක් සඳහා රුපියල් මිලියන 614,872,537.74කට ඇස්තමේන්තු කොට රුපියල් මිලියන 505,390,624.09ක ඇස්තමේන්තු ගත මුදලක් 2015 වර්ෂය සඳහා වෙන් කොට ඇත.

(i) මෙම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 44ක වැඩ 2015 දෙසැම්බර් 31 වන විට අවසන්ව නොතිබුණ අතර, එම ව්‍යාපෘති 2015 වසරේ අවසාන කාර්තුවේ ආරම්භ කිරීම, ටෙන්ඩර් ප්‍රධානයේදී ඇතිවී තිබූ ගැටළුකාරී තත්ත්ව ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශවල පැවති සමාජීය ගැටළු හා පැවති අයහපත් කාලගුණික තත්ත්ව මේ සඳහා හේතු ලෙස දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු සමඟ කාර්තුමය ලෙස පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී හෙළිවී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ii) අදාළ ව්‍යාපෘතින්හි කුරුණෑගල හා පොළොන්නරුව ව්‍යාපෘතීන් එම දිස්ත්‍රික්කවල ආපදාවට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණයට අදාළව පැවති රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ අනුව ක්‍රියාත්මක කොට ඇති අතර මෙම ව්‍යාපෘති අතරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 03 හැර ඉතිරි ව්‍යාපෘති 2015 දෙසැම්බර් 31 වන විට ආරම්භකර ඇති බව අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙත මෙන්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මාසික ප්‍රගති වාර්තාවල ද දක්වා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ඇති අතර, දිස්ත්‍රික් ලේකම්වරයා වෙත සම්පූර්ණම මුදලම ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරයා ඉල්ලීම් කර ඇති අතර මේ සම්බන්ධව අමාත්‍ය ලේකම්වරයාගෙන් මෙන්ම ස්වදේශකටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ද උපදෙස් ලබාගැනීමට කටයුතු කොට ඇත. කෙසේ වුවද අවසන් කාර්තුව වන තෙක් එකඟතාවයකට පැමිණීමට නොහැකිවීම නිසා අදාළ අත්තිකාරම් මුදල් මධ්‍යස්ථානය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කොට ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(iii). 2015 වර්ෂයේ සිදු වූ ගංවතුර තත්වය හේතුවෙන් සැලසුම් කර තිබූ කාල වකවානු තුළ එම ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(iv) මෙම ව්‍යාපෘති සියල්ලම සඳහා ලිඛිත ගිවිසුම් අත්සන් තැබීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් මට්ටමින් සිදුවන අතර සෑම ව්‍යාපෘතියකටම අදාළ ගිවිසුම් ඇති බව දන්වා සිටින අතර, අදාළ ගිවිසුම්වල පිටපත් ගොනුගත කර ඉදිරිපත් කරන බවද කාරුණිකව දන්වා සිටිමි.

(v) මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නිකුත්කිරීම අදාළ කර්තව්‍යයට අනුව සවිස්තරාත්මක ඇස්තමේන්තු මත පදනම්ව අත්තිකාරම් මුදල් ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(vi) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුර තත්ත්වය සමාලෝචනය සඳහා පැවති රැස්වීමකදී ගනු ලැබූ තීරණයක් අනුව ගංවතුර ආපදාවෙන් සිදුවූ හානි ප්‍රතිසංස්කරණය කරන ලෙස ලබාදෙන ලද උපදෙස් පරිදි වර්ෂයේ අවසාන භාගයේදී ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කොට මෙම ව්‍යාපෘති ඇතුළත් කර ඇත. ඒ අනුව එම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිවලට ගිවිසුම්ගත වීම ප්‍රමාදවී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(vii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකිරීමට සම්පූර්ණ මුදල් ප්‍රමාණයම ඇතැම් අවස්ථාවන්හිදී දිස්ත්‍රික් ලේකම්වරුන් ඉල්ලා සිටින අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව එය අවශ්‍යතාවයක් බවද පෙන්වා දී ඇත. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත එවැනි සුවිශේෂී අවස්ථාවන්හිදී මුදල් නිකුත්කර තිබුණ ද පසුව පැවති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීමට කටයුතු කොට ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(viii) ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අවස්ථාවේදී පැවති රැස්වීමේදී ගන්නා ලද තීරණ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළ ව්‍යාපෘති දළ ඇස්තමේන්තු ගත අගයකට අනුව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලෙස උපදෙස් ලැබී ඇති අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේදී මෙම ව්‍යාපෘතීන්ට අදාළ සවිස්තරාත්මක ඇස්තමේන්තුව හා ව්‍යාපෘති වාර්තා ලබාදෙන ලෙසට දන්වා ඇත. එහෙත් එම තොරතුරු ප්‍රමාණවත් පරිදි ලබා නොදීම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවද ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට සිදුවූ බවද කාරුණිකව දන්වා සිටිමි.

(අ) <u>මහා පරිමාණ ව්‍යාපෘති</u>

(i) 2014 වර්ෂයේදී කළුතර, යාපනය හා දඹුල්ල යන ව්‍යාපෘතීන් අවසන් කිරීමට යෝජිතව තිබූ අතර, යාපනය හා දඹුල්ල ව්‍යාපෘතීන්වලට අදාළව එම වර්ෂය තුළදී නිමකිරීමට සැලසුම් කළ කාර්යයන් අදාළ වර්ෂය තුළදී අවසන් කළ ද සියලු ගෙවීම් නිම කිරීමට අවශ්‍ය වන ප්‍රතිපාදන 2014 වර්ෂයේදී මහාභාණ්ඩාගාරයෙන් නොලැබිණි. එම හේතුව මත මෙම ව්‍යාපෘතීන්ට අදාළ සියලු ගෙවීම් 2015 වර්ෂයේදී ගෙවා නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකොට ඇත. එහෙත් කළුතර පානදුර ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති සැලසුම් කල පරිදි අදාළ වර්ෂයේ ඉටුකිරීමට නොහැකිවූ අතර මෙම ව්‍යාපෘති සඳහා අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සිදුවී තිබූ අතර විශාල සාමාජීය ගැටළු ප්‍රමාණයක් පැනනැඟුණි. එසේ ගැටළු පැනනැඟීම නිසා මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධික්ෂණ අංශය සමඟ ද සාකච්ඡා පවත්වා අදාළ පාර්ශව සමඟ සාකච්ඡාකොට මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික වාර්තා ලබාගෙන මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි. නාගරික ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ කටයුතු සැලසුම් කළ පරිදි සිදුකිරීමට විශාල ගැටලු පැනනැඟී ඇති අතර ඊට අදාළව මින් පෙර විගණන විමසුම්වල සවිස්තරාත්මකව පිලිතුරු සපයා ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය 2015 වසරේදී අවසන් කිරීමට නොහැකිවූ අතර අමාත්‍යාංශයට දැනුම්දී ඒ අනුව 2016 ජුනි වන විට සියලු කටයුතු අවසන් කොට ව්‍යාපෘතියේ අවසන් වාර්තාද ලබාදෙන ලෙසට දන්වා ඇත. ඒ අනුව අදාළ ව්‍යාපෘතිය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාව විගණනය වෙත ලබාදීමට එකඟතාවය පලකර සිටිමි.

(ii) දඹුල්ල ව්‍යාපෘතිය සඳහා 2012 වසරේදී සිදුකරන ලද දළ ඇස්තමේන්තු මුදල රු.මිලියන 90කි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කළ අතර මෙහි පළමු අදියර සඳහා ටෙන්ඩර් පිරිනැමීමේදී පැවති ගැටළුකාරී තත්ත්වයක් මත පළමු අදියරට අදාළ කිසිදු ගෙවීමක් සිදුකොට නොමැති අතර උසස් නිළධාරීන්ගෙන් ලද උපදෙස් හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත මේ සඳහා වෙන්කර තිබූ මුදල් වෙනත් ව්‍යාපෘතියක් සඳහා භාවිතා කරන ලදි. මෙහිදී ඇල මාර්ග කපා ඒවාට ගේබියන් බැම් බැඳීම නවතා තිබූ අතර ජනාධිපති විමර්ෂණ ඒකකයෙන් විමර්ෂණ අවසන් වන තුරු අදියර 02 හා 03 නිමකරන ලෙස ලබාදෙන ලද උපදෙස් පරිදි එම අදියරවලට අදාළ කටයුතු ආරම්භකර අවසන් කරන ලදි. කෙසේ වුවද 2015 වනවිට 2013 වසරේ අදියර 1 යටතේ අර්ධ වශයෙන් නිමකර තිබීම හේතුවෙන් ඇල දෙපස කැඩීගොස් පුද්ගලික දේපලවලට ද හානිවිය හැකි වූ නිසා අදියර 1ට අදාළව ගෙවීම් සිදුකොට තිබූ මුදල් භාවිතා කරයි. 2015 වසරේදී එම ව්‍යාපෘතිය අවසන් කිරීමට එකඟතාවයකට පැමිණි අතර ඒ අනුව අදාළ ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව ලබාදී ඇති ප්‍රතිපාදන පහත පරිදි වේ.

වර්ෂය	ලබාදී ඇති ප්‍රතිපාදන (රු.)
2013	20,200,000.00
2014	20,000,000.00
2015	42,000,000.00

(iii) මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවීමට අදාළ පසුබිම අ) i යටතේ දක්වා ඇති අතර මේ පිළිබඳව අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා 2016 ජුනි වන විට අවසන්කරන බව එකඟතාවයකට පැමිණ ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් මුදල් නිකුත් කිරීම දෙසැම්බර් මාසයේ මුල සතිය තෙක් ප්‍රමාද වීම ප්‍රාදේශිය ආපදා පෙර සුදානම් සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් යාවත්කාලීන කිරීම හා මුද්‍රණය කිරීම සඳහා වැඩසටහන් 4ක් පැවැත්වීමේ කටයුතු 2015 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන විට සිදු කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(ඈ) <u>පූර්ව දැනුවත් කිරීමේ අංශය</u>

සිද්ධි විධිවිධාන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2016 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර තිබුණද එම වැඩ සටහන පැවැත්වීමට ඒ සඳහා පුහුණුලත් පුහුණුකරුවන් සොයා ගැනීමට නොහැකි වීම, පසුගිය වර්ෂයේ මුහුණ දුන් විවිධ ආපදා තත්වයන් සමග කටයුතු කිරීමට සිදුවීම, මූල්‍ය ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම යන හේතු සාධක නිසා සැලසුම් කළ පරිදි එම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) හදිසි මෙහෙයුම් අංශය විසින් ඉටු කළ යුතු කාර්යන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවීමට හේතුව වූයේ හදිසි මෙහෙයුම් මැදිරිය විසින් ඉටු කරනු ලබන රාජකාරීමය ස්වභාවය පදනම් කරගෙනය. එනම්, පැය 24 x 7 හදිසි මෙහෙයුම් සම්බන්ධීකරණ කටයුතු මෙහෙයුම් මැදිරිය විසින් සිදු කරනු ලබන අතර කුමන අවස්ථාවක, කුමන වේලාවක, කුමන දිනයකදී ආපදාවක් සිදු වේද යන්න පෙරාතුව ලබා දීමට නොහැකි හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම ලබාදිය නොහැකිවී ඇත.

එහෙත් යම් හදිසි ආපදාවක් පැන නැගුණු විට පහත සඳහන් ක්‍රියාකාරකම් හදිසි මෙහෙයුම් මැදිරිය මගින් සිදු කරනු ලබයි.

1. පූර්ව අනතුරු ඇඟවීම සහ ආපදාවට ලක්විය හැකි එම ආපදාව බලපානු ලබන ප්‍රදේශයෙහි සිටින ජනතාව ඉවත් කිරීම.
2. මෙහෙයුම් සම්බන්ධීකරණය. (ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය මෙහෙයුම් සඳහා යොමු කිරීම)
3. අවශ්‍ය අනෙකුත් පාර්ශව ආයතන සම්බන්ධීකරණය. උදා- ටෙලිකොම් ආයතනය/ විදුලි බල මණ්ඩලය/ ජලපවාහන මණ්ඩලය/ මහවැලි අධිකාරිය.
4. ආපදාවට ලක්වූවන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීම සම්බන්ධයෙන් කටයුතු සම්බන්ධීකරණය.
5. ආපදාවට ලක්වූවන් යථා තත්වයට පැමිණෙන තුරු ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය.
6. සියලු ආපදා තොරතුරු වාර්තාකරණය.

(අ) පෙර සූදානම් සැලසුම් සකස් කිරීම පිළිබඳ කටයුතු

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2009 වර්ෂයේදී පාදුක්ක ටෙලිකොම් භූමි ප්‍රදේශයේ චන්ද්‍රිකා තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථානගත කළ අතර එමඟින් ආපදා කළමනාකරණය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය යොදාගැනීම මූලික අරමුණ විය. ICET ව්‍යාපෘතිය මඟින් මෙම චන්ද්‍රිකා සන්නිවේදන ක්‍රමවේදය පූර්ව අධ්‍යයනයකින් තොරව ආයතනික අවශ්‍යතාවයන්ට නියමිත පරිදි සපුරාලීමට නොහැකිවන තාක්ෂණයකින් යුතුව ස්ථාපිත කර තිබූ අතර දිනෙන් දින දියුණුවන තාක්ෂණයත් සමඟ මෙම තාක්ෂණික උපකරණ සහ ක්‍රමවේදයන් යල් පැනගොස් පැවතීම හේතුවෙන් මේ වන විට අක්‍රිය තත්වයේ පවති. මෙම චන්ද්‍රිකා තාක්ෂණික උපකරණ පිහිටි පරිශ්‍රය ටෙලිකොම් ආයතනයේ භූමි ප්‍රදේශයක් වන බැවින් ටෙලිකොම් ආයතනයේ වෙනත් කටයුත්තක් වෙනුවෙන් මෙම භූමි ප්‍රදේශය යොදා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගුණි. එමනිසා මෙම චන්ද්‍රිකා තාක්ෂණ උපකරණ පද්ධතිය ගලවා ගැනීමට සිදුවූ බැවින්, එම චන්ද්‍රිකා තාක්ෂණ උපකරණ පද්ධතිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ගෙන ඒමට කටයුතු කරන ලදි.

(ආ) එකඟ නොවෙමි.
හදිසි මෙහෙයුම් මැදිරියේ අවශ්‍යතාවය මත මෙම භාණ්ඩ තොග මිලදී ගෙන ගබඩා කර ඇත. භාණ්ඩ ඉල්ලුම් කළ අංශ වෙත භාණ්ඩ රැගෙනයන ලෙස දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) එකඟ විය නොහැක .
අවශ්‍යතාවය අනුව භාණ්ඩ තොග ලේඛන කිහිපයක් පවත්වාගෙන ගිය ද ඒවා තුලනය කර සටහන් කරන අතර ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මඟින් ද භාණ්ඩ තොග ලේඛන පවත්වා ගනී. අවශ්‍ය පරිදි එම ලියවිලි ඒකාබද්ධ කර යාවත්කාලීන කරමින් ලබාගැනීමේ පහසුව තිබේ. නිවැරදි තොග ලේඛනයක් ගිණුම්කරණ මෘදුකාංගය මඟින් පවත්වාගෙන යනු ලැබේ. විගණනයට එය භාවිත කිරීමේ හැකියාව පවතින බව ද කාරුණිකව දන්වා සිටිමි.

(ඈ) මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ තීරණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්ත්වයෙන් පැවති රැස්වීම්වලදී ගන්නා ලද තීරණ පරිදි සිදුකොට ඇති අතර අදාළ ව්‍යාපෘති ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාදෙන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල ප්‍රගතිය සෑම මසකම අමාත්‍යාංශය හා අන්තර්කාලීන කළමනාකරණ කමිටුවට වාර්තා කොට ඇත.

	දිස්ත්‍රික්කය	**අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව**	**මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව**	**ව්‍යාපෘති වෙනස් වීමට හේතුව**
1.	හම්බන්තොට	40	09	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු සහ වාර්තා නොලැබීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති අතර ඒ අනුව මාසික වැඩසටහන් හා මාසික ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී අමාත්‍යාංශය වෙත ඒ බව දැනුම් දී ඇත.
2.	කිළිනොච්චිය	06	01	ව්‍යාපෘති 06 ළිං ඉදිකිරීමේ ව්‍යාපෘති වන බැවින් එම ව්‍යාපෘති 06ම එක් ව්‍යාපෘතියක්

				යටතට ගෙන ක්‍රියාත්මක කිරීම.
3.	කුරුණෑගල	02	13	වසර අවසාන කාර්තුවේදී කුරුණෑගල, පොළොන්නරුව දිස්ත්‍රික්කවල පැවති ආපදා තත්ත්වයන්ගෙන් සිදුවූ හානිය සැලකිල්ලට ගෙන එම දිස්ත්‍රික්කවල හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘති ඇතුළත් කිරීමට අමාත්‍යාතුමාගේ ප්‍රධානත්ත්වයෙන් පැවති රැස්වීම්වලදී ගන්නා ලද තීරණ පරිදි ක්‍රියාත්මක කොට ඇත.
4.	මාතලේ	02	04	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැනනැගුණු විවිධ සාමාජීය හා පරිපාලන ගැටළු මත මෙන්ම ඇතැම් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාවය මත වෙනත් ප්‍රතිපාදන එම ව්‍යාපෘති සඳහා යොදවා ඇති බැවින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි වෙනස් කිරීමට කටයුතු කොට ඇත. වැයසටහන් හා මාසික ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
5.	අම්පාර	01	02	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැනනැගුණු විවිධ සාමාජීය හා පරිපාලන ගැටළු මත මෙන්ම ඇතැම් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාවය මත වෙනත් ප්‍රතිපාදන එම ව්‍යාපෘති සඳහා යොදවා ඇති බැවින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි වෙනස් කිරීමට කටයුතු කොට ඇත.
6.	ගාල්ල	04	03	එක් ව්‍යාපෘතියක් බලපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදුකර ඇති බව දන්වා සිටීම නිසා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලදි.
7.	කෑගල්ල	04	02	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැනනැගුණු විවිධ පරිපාලන ගැටළු මත මෙන්ම ඇතැම් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාවය මත වෙනත් ප්‍රතිපාදන එම ව්‍යාපෘති සඳහා යොදවා ඇති බැවින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි වෙනස් කිරීමට කටයුතු කොට ඇත.
8.	නුවරඑළිය	04	03	අනවසර ඉදිකිරීම් නිසා සාර්ථක ව්‍යාපෘතියක් නොවන බැවින් අවලංගු කරන ලදි.
9.	පොළොන්නරුව	01	16	වසර අවසාන කාර්තුවේදී කුරුණෑගල, පොළොන්නරුව දිස්ත්‍රික්කවල පැවති ආපදා තත්ත්වයන්ගෙන් සිදුවූ හානිය සැලකිල්ලට

				ගෙන එම දිස්ත්‍රික්කවල හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘති ඇතුළත් කිරීමට අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්වලදී ගන්නා ලද තීරණ පරිදි නව ව්‍යාපෘති අදාළ ප්‍රතිපාදන සීමාව තුළ ඇතුළත් කොට ඇති අතර මාසික වැඩසටහන හා ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
10.	රත්නපුර	07	04	1.පෞද්ගලික ඉඩම් ආරවුලක් නිසා ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් පසු අවලංගු කරන ලදි. 2.ඉඩම් හිමියන්ගෙන් එල්ලවන විරෝධතාවය නිසා අවලංගු කරන ලදි. 3.ආපදා තත්ත්වයක් නොපවතින බව ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී තහවුරු වීම නිසා.
11.	ගම්පහ	-	01	ගම්පහ දිස්ත්‍රික්කයේ ඇතිවූ ගංවතුර තත්ත්වය හා ඊට හේතු පාදකවූ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කළයුතු බවට අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්වලදී ගන්නා ලද තීරණ පරිදි ඉදිරිපත් කොට තිබූ ඇල මාර්ග පවිත්‍ර කිරීම් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇති අතර මේ බව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත වැඩසටහන් හා ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී දන්වා ඇත.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) කාර්යමණ්ඩල පරිපාලන

2015.12.31 දිනට පැවති පුරප්පාඩු අතරින් පහත සඳහන් කර ඇති පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ කරගෙන ඇත.

	තනතුරු සංඛ්‍යාව
○ මූල්‍ය නිලධාරි	01
○ ආපදා කළමනාකරණ සහකාර	02
○ රියදුරු *	04
○ කාර්යාල සහායක	03

* මධ්‍යස්ථානය සඳහා අළුතින් වාහන 04ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ලැබීමට නියමිත වූ බැවින් ඒ සඳහා නව තනතුරු 04 අළුතින් ඇති කරන ලදි. එහෙත් නියමිත වාහන සංඛ්‍යාව නොලැබීම හේතුවෙන් මින් තනතුරු 02ක් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ අතර අනුයුක්ත කිරීමට තිබිය යුතු වාහන 02ක් නොමැතිකම හේතුවෙන් පුරප්පාඩු 02ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොමැත.

- **2015.12.31 දිනට පැවැති සෙසු පුරප්පාඩු සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම**

  - සහකාර අධ්‍යක්ෂ තනතුරු 02

සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්) තනතුරට අදාළ මූලික සුදුසුකම්වල පවතින ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එහි අනුමැතිය ලැබීමෙන් අනතුරුව මෙම පුරප්පාඩුව සම්පූර්ණ කරනු ඇත.

  - සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය)

මෙම තනතුරට පැවරෙන මාධ්‍ය රාජකාරියට අමතරව සේවා අවශ්‍යතාවය මත වැඩි වගකීමක් පැවැරිය හැකි වන ආකාරයට යම් වෙනස් කිරීමට අවශ්‍යවන අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම පුරප්පාඩුව පිරවීමට අපේක්ෂා කෙරේ.

  - සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) තනතුරු 06

දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ තනතුරු 06ක් සඳහා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය මත ත්‍රිවිධ හමුදා නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බැවින් එම පුරප්පාඩු සම්පුර්ණ කිරීමට නොහැකි වී ඇත.

අධ්‍යක්ෂ(මෙහෙයුම්) තනතුර සඳහා හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු අනුයුක්ත කරගැනීම සඳහා ජාතික සභාව විසින් දී ඇති අවසරය පරිදි එම නිලධාරියෙකු තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇති බැවින් එම තනතුරුට බඳවා ගැනීම සිදු කළ නොහැක.

  - අධ්‍යක්ෂ(මානව සම්පත් හා මූල්‍ය)

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවස්ථා 08කදී පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවුවද සුදුසුකම් සහිත එකඳු නිලධාරියෙකු හෝ අයදුම් කර නොමැති වීමෙන් ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමටද නොහැකි විය. මෙම තත්ත්වය මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීමෙන් අනතුරුව එම කමිටුව මඟින් දෙන ලද නිර්දේශ මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමට අනුව එකී තනතුර අධ්‍යක්ෂ(මානව සම්පත් හා පරිපාලන) සහ අධ්‍යක්ෂ(මූල්‍ය) ලෙස තනතුරු 02 ක් ඇති කිරීමට අනුමැතිය ලබා දී ඇත. මේ සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව නැවත අයදුම්පත් කැඳවීමට කටයුතු කරනු ඇත.

  - නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 09

මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 09ක් පවතින අතර ඒවා අභ්‍යන්තර උසස්වීම් මඟින් පත් කිරීමට නියමිත වන තනතුරු වේ. මේ සඳහා සුදුසුකම් ලැබීම සඳහා සහකාර අධ්‍යක්ෂ හා ඊට සමාන්තර තනතුරක වසර 10 ක සතුටුදායක සේවා කාලයක් අවශ්‍ය වන අතර වත්මන් නිලධාරීන් ඒ සඳහා සුදුසුකම් ලබන්නේ 2021 වසරේ ජුනි 30 දිනෙන් පසුවය. ඒ අනුව පවතින උසස් කිරීම් පටිපාටිය අනුව එකී දිනය දක්වා එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.
මෙම තත්ත්වය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමෙන් අනතුරුව ඒ සඳහා විකල්පයක් වශයෙන් එක් අවස්ථාවකට පමණක් සීමාවන සේ වත්මන් නිලධාරීන්ගේ පුර්ව සේවා කාලය එනම් රජයේ හෝ රාජ්‍ය ආයතනයක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සහ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ ස්ථිර සේවයේ වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් හට මෙම තනතුරුවලට අයදුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත. මෙම විකල්ප විසඳුම අනුගමනය කිරීම සඳහා වූ ලිපිය 2015.12.07 දින කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුව විසින් එවා ඇති අතර එම තීරණය පරිදි ක්‍රියාකර ප්‍රගතිය වාර්තා කරන ලෙස ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මෙම මධ්‍යස්ථානය වෙත දැනුම් දී ඇත.

ඒ අනුව මෙම කරුණු මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙත යොමු කර අනුමැතිය ලබා දීමෙන් අනතුරුව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා වන අභ්‍යන්තර උසස්වීම් අයදුම්පත් කැඳවීම 2016.03.30 දින සිදුකර ඇති අතර එම අයදුම්පත් භාරගැනීම 2016.04.25 දින අවසන් කර ඇත. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා වන අභ්‍යන්තර උසස් කිරීම් සඳහා වන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(ආ) මේ යටතේ සඳහන් වන අධ්‍යක්ෂ තනතුරු 02 සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් විසින් ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් සුදුසුකම්, ඔවුන් විසින් සපුරාගෙන නොමැති බවට මෙතෙක් තහවුරු වී නොමැති අතර මේ සම්බන්ධයෙන් විගණනකාධිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති පරිදි සුදුසුකම් සනාත කරගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

රජයේ විගණන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති පරිදි මෙම නිලධාරීන් අදාළ තනතුරුවලට පත්කරන ලද අවස්ථාවේදී ඔවුන් සතුව පැවති සුදුසුකම් කළමනාකරණ සේවා දොපර්තමේන්තුව වෙතින් තහවුරුකර ගැනීම සඳහා මධ්‍යස්ථානය විසින් ලිපි යවා ඇති අතර ඉන් අනතුරුව එම දොපර්තමේන්තුව විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත්තේ තනතුරුවලට අදාල වන සේවා පළපුරුද්ද එම නිලධාරීන් මීට පෙර සේවය කරන ලද ආයතන වෙතින් ලිඛිතව විමසීම් කර තහවුරු කරගන්නා ලෙසයි. එකී ලිපියේ පිටපතක් මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද යොමු කොට ඇත.

ඒ අනුව එකී ක්‍රියාවලිය මේ වන විට සිදුවෙමින් පවතින බව වාර්තා කරමි.

(ඇ) මේ යටතේ **"සංවිධානයේ අධ්‍යක්ෂක තනතුරු"** යන්න **"සහකාර අධ්‍යක්ෂ"** තනතුරු ලෙස නිවැරදි විය යුතු බව රජයේ විගණන අංශය විසින් වාචිකව දන්වා ඇත.

මීට අදාළ කරුණු දැක්වීම ඉහත 4.3 (අ) යටතේ සඳහන් කර ඇත.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පනත ස්ථාපිත කිරීම

උක්ත පනතේ සංශෝධනයට අදාළ කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නීති අංශය මඟින් සිදු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

5.2 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම

(අ) ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම අන්තර් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් නොකිරීමට හේතුව වූයේ, මධ්‍යස්ථානය විසින් මූලික වශයෙන් මෙම මෙහෙයුම් සැලැස්මෙහි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සැලසුම නිර්මාණය කර තිබූ නිසාය. ඉන්පසු පරිවර්තනය කිරීම සඳහා වෙනත් ආයතනයක් වෙත භාර දී සිංහල හා දෙමළ මාධ්‍යයන් සඳහාද මෙම සැලසුම සකස් කරන ලදි.

එහෙත් මෙම සැලසුමෙහි ඇති තාක්ෂණික වචන සහ තාක්ෂණික වැකි නිවැරදි පරිදි සිංහල හා දෙමළ මාධ්‍යට පරිවර්තනය වී නොමැති හේතුවෙන් එම සැලසුම නැවත වෙන් වෙන් වශයෙන් අධීක්ෂණය කිරීමට සිදු වීම තුළ දීර්ඝ කාලයක් ගත විය. එබැවින් අන්තර් කළමනාකරණ කමිටුව වෙත අවසන් කරන ලද සැලසුම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) පාර්ශවකාර ආයතන හා දෙපාර්තමේන්තු 48 ක කාර්යය භාරය හා වගකීම සම්බන්ධයෙන් වූ මෙහෙයුම් සැලැස්මෙහි පාර්ශවකාර ආයතන 07 විසින් සංශෝධන අප වෙත එවා නොතිබීමට හේතුව වූයේ එම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලයේ සිට පැවති ආයතන මේ වන විට ඔවුන්ගේ මූලික නාමයන් වෙනස් වී තිබීමත් මෙම සැලසුම නිර්මාණය කරන අවධියේ සිටි නිලධාරීන් ඒ වන විට නොසිටීමත්, සිටින නිලධාරීන් සඳහා මේ පිළිබඳ අවබෝධය අවම වීමත් සහ උනන්දුව අවම වීම තුළ ඔවුන් විසින් අප වෙත සංශෝධිත වාර්තා ඉදිරිපත් නොකරන ලදි. මේ සඳහා අප කිහිප විටක් ඔවුන් මුණ ගැසී දැනුවත් කරමින් අදාල සැලසුමෙහි පාර්ශවකරුවන් ලෙස සැලසුමෙහි සංශෝධන ලබා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලද අතර මේ වන විට එම සංශෝධිත සැලසුම් ලබා දී ඇත.

5.3 වාහන පාලනය

(අ) එකඟවෙමි.
වාහන භෞතික පරීක්ෂාව සම්බන්ධ කටයුතු මේවන විට සිදු කරමින් පවතින අතර 2016 ජූලි මස 15 වන දිනට පෙර එම කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ විගණනයේ උපදෙස් මත අදාළ නිවැරදි කරගැනීම් සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) එකඟවෙමි.
උක්ත වාහන පවරා ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස අදාළ පෝරම සම්පූර්ණ කර ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළද ඒ සඳහා එවක අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය නොලැබිණි.

කෙසේ වුවද මෙම විගණන විමසුම පදනම් කරගෙන නැවත වරක් මේ සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වෙත යැවීමට සටහන් කරගෙන ඇත.

(ඈ) එවකට මාතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලද යුධ හමුදා නිලධාරියාගෙන් අදාළ මුදල මෙම මධ්‍යස්ථානය වෙත අයකර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමින් එකී නිලධාරියාට ද පිටපත් සහිතව අංක DMC/02/05/68 හා 2015.07.22 දිනැති ලිපිය මඟින් යුධ හමුදාපති වෙත දන්වා යවා ඇත. මේ සඳහා නැවත සිහිකැඳවීමේ ලිපියක් යැවීමට සටහන් කරගෙන ඇත.

5.4 පුහුණු සැලැස්ම

2012 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ උපදෙස් මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළධාරීන් සඳහා පුහුණු අවශ්‍යතා තක්සේරුවක් සහ පුහුණු සැලැස්මක් වසර තුනකට සකස් කරන ලදී. නමුත් ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට නොහැකි විය.

2016 වර්ෂයේ නැවත පුහුණු සැලැස්මක් 2017 සිට 2019 දක්වා වූ වසර තුනක කාලයකට සකස්කර 2016 මැයි මස ආපදා කළමනකරණ මධ්‍යස්ථානයේ අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කළ අතර එයට අනුමැතිය ලැබී ඇති බවද කාරුණිකව දන්වා සිටිමි.

5.5 දැනුවත් කිරීමේ මොඩියුලර් සැකසීම

මොඩියුලර් සකස් කිරීම සඳහා 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලා සිටිමුත් මූල්‍ය ප්‍රතිපාදන නොලැබුණි. ඉන්පසු එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන යටතේ 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන ලැබුණ පසු 2016 වර්ෂයේ දැනුවත් කිරීමේ මොඩියුලර් සකස් කර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනා වෙත ඔවුන්ගේ අදහස්, යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු සහ කළයුතු

වෙනස්කම් පිළිබඳ අදහස් විමසා ඇත. එම අදහස් හා යෝජනා ලැබුණපසු 2016 වර්ෂය අවසන් වීමට ප්‍රථම එම කටයුතු අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

5.6 අභ්‍යන්තර විගණනය

එකඟවෙමි.

මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සාර්ථක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර එය මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය මගින් අනුමත කරගෙන තිබුණද එම සැලැස්ම පදනම්ව සකස්කරන මාසික අභ්‍යන්තර විගණන සැලැසුම්වල සඳහන් කාර්යයන් නිමකිරීමට හා එම කාර්යයන් කාර්යක්ෂමව කරගෙන යාමේදී පවතින මානව සම්පතෙහි හිඟතාවය නිසා අභ්‍යන්තර විගණනය ගැටළු රාශියකට මුහුණපා සිටි. දිස්ත්‍රික්ක 25 හි පවතින කාර්යාල 25 සහ කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයේ පවතින අංශවල විගණන කටයුතු සිදුකිරීමට නිලධාරීන් දෙදෙනෙකු පමණක් සිටින අතර ඒ සඳහා අවම වශයෙන් තවත් දෙදෙනෙකුගේ සේවයවත් අවශ්‍යව ඇත. ඉදිරියේදී මධ්‍යස්ථානය විසින් සිදුකිරීමට යන නව බඳවා ගැනීම් තුළින් අභ්‍යන්තර විගණන අංශයේද මානව සම්පත වැඩිකිරීම හරහා විගණන කටයුතු කාර්යක්ෂව කරගෙන යාමට බලාපොරොත්තු වේ.

අදාල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා ගැනීමට අදාළ අංශ දැනුවත් කර ඇත.

5.7 ප්‍රසම්පාදන සැලැස්ම

(අ) එකඟවිය නොහැක.

මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශයට යොමුකළ පසු ලේකම්තුමාගේ අනුමැතියෙන් පසුව මහා භාණ්ඩාගාරයට යොමු කරනු ලැබේ.

(ආ) එකඟවේ.

2015 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන සැලැස්මට අනුව අයිතම 10 ක් මිල දී ගැනීම සඳහා මිලදී ගැනීම් කටයුතු 2015.07.30 දින අවසන් කළ යුතුව තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ඇති වූ ප්‍රායෝගික ගැටළු නිසා සහ 2015 වර්ෂයේදී පාලන ව්‍යුහයේ විටින් විට සිදු වූ වෙනස්කම් නිසා සැළසුම්ගත දිනට අවසන් කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී එම ගැටළු අවමකර ගනිමින් සැලසුම් කළ දිනට මිලදී ගැනීම් සියල්ල අවසන් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අවධියේ කටයුතු සඳහා වූ වියදම් වශයෙන් ප්‍රතිපාදිත මුදල වූ රුපියල් 75,000,000.00 න් රුපියල් 164,521.00 ක මුදලක් එසේ වැය කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර එය පහත පරිදි ඉදිරිපත් කර ඇත.

දිනය	වවුචරය	විස්තරය	වටිනාකම	එකතුව
			රු.	රු.
2015.06.10	231	ඒ.ආර්.ඩී.චයි. සුභාසිරි		
		ටෙන්ඩර් පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා අත්තිකාරම් **(ඒෂියන් ටෙන්කෝ සොලියුෂන්ස්)**	**20,000**	
2015.06.19	**341**	ඒ.ආර්.ඩී.චයි. සුභාසිරි		
		ටෙන්ඩර් පත්‍රිකා මුද්‍රණ ගාස්තු ඉතිරිය	**38,500**	**58,500**
2015.07.21		**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**		

	346	**පුවත්පත් දැන්වීම් - ඩෙලි නිවුස්**	**36,075**	
	347	**පුවත්පත් දැන්වීම් - තිනකිරන්**	**22,477.50**	
	345	**පුවත්පත් දැන්වීම් - දිනමිණ**	**31,468.50**	**90,021**
2015.07.22	**344**	**<u>නීල් ප්‍රනාන්දු සහ සමාගම</u>** **Boat Trailer ප්‍රවාහන ගාස්තු - කොළඹ සිට මාතර දක්වා**		**16,000**
		එකතුව		**164,521**

(ඇ) එකඟවේ.

ප්‍රසම්පාදන සැලසුමෙහි සඳහන් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අඟුල් , බෙරා ගැනීමේ හා සොයා ගැනීමේ බෑගයන් හා පුද්ගලයින් 08 ක් සඳහා වූ ටෙන්ට් මිලදි ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කර ඇති බව කාරුණිකව පිළිගන්නා අතර මිලදී ගන්නා අවස්ථාවේදී අවශ්‍යතාවය අනුව හා ඒ වන විට ඒ අයිතම සඳහා වූ වෙළඳපල ඒකක මිල සලකා බලා නැවත ඇස්තමේන්තු සකස් කිරීමේදි මුදල් ඉතිරිව තිබීම හේතුවෙන් හා අවශ්‍යතාවය අනුව ලේකම්ගේ අනුමැතිය ලබාගෙන සැලසුම් ගත ප්‍රමාණයට වැඩියෙන් මිලදි ගැනීම් සිදු කිරිම සඳහා ඉදිරි කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව එලෙස කටයුතු කර ඇත. ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කළ යුතුව තිබූ බව කාරුණිකව පිළිගන්නා අතර ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇතිවුවහොත් විගණනයන් පෙන්වා දී ඇති කරුණු අනුව ක්‍රියාකරන බවද කාරුණිකව දන්වා සිටිමි.

6. පද්ධති හා පාලනයන්

(අ) ගබඩා පාලනය

(i),(ii),(iii),(iv) හා (v) සඳහා එකඟ වෙමි.

ඉහත කරුණු යටතේ සඳහන් වන අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

වාර්තාවේ (ආ),(ඇ),(ඈ),(ඉ), යටතේ සඳහන් කර ඇති කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමුකර කටයුතු කර ඇති බවත් ඉදිරියේ තවදුරටත් එම අංශ පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කරන බවත් කාරුණිකව සඳහන් කරමි.

මේජර් ජෙනරල් එල්.බී.ආර්. මාර්ක් (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්.
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.